ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

2023 ජනවාරි 04 වන බදාදා
3 කාණ්ඩය 05 කලාපය
මිල රු. 80 යි

ධරණී

සතුටින් ජීවිතය දරන්නී

ඉහ නව වසරක් වේවා..!

හිත රවට්ටලා කට පාලනය කළොත් මිලියනපතියෙක් වෙන්න පුළුවන්

අහල පහල නෝනලාට පන්සලේ හාමුදුරුවෝ වගේ ළමයි ඉපදෙන්නේ කොහොමද?

96' වර්ල්ඩ් කප් එක දිනපු දවසට වඩා මගේ පළවැනි පඩියෙන් තෑග්ගක් දීපු දවසෙ තාත්තා සතුටු වුණා

සනත් ජයසූරියගේ වැඩිමල් දියණිය
සවින්දි ජයසූරිය

අමතක කරලමු පැරණි කතා

හදලා විකුණමු ශුද්ධකතා

විශේෂ අතිරේකයක්
නොමිලේ

ඡායාරූප
මධුසංක සිරිවර්ධන
හැඩගැන්වීම
ශිරෝමා ෆොන්සේකා
පසුතලය
විඳුවල් විලේජ්, ජාඇල

මිශෙල් දිල්හාරා

අර්ත් ඩේ නෙට්වර්ක් ලෝක පාරිසරික සංවිධානයේ
ශ්‍රී ලාංකික තානාපති ජනප්‍රිය රංගන ශිල්පිනී

දැන්වීමකි

දේශීය බතික් නිෂ්පාදනයේ ලංකාවේ ප්‍රමුඛ නාමය

නිවී මෙගා බතික් නිෂ්පාදන

- **ආර්ථික අපහසුතා නිසා මම 9 වසරින් අධ්‍යාපනය අවසන් කර අධිෂ්ඨානයෙන්, වීර්යයෙන් ජීවිතය ජයගත් කෙනෙක්.**
- **දේශීය බතික් නිෂ්පාදනය පිළිබඳ ආණ්ඩුවට වැඩපිළිවෙළක් නැහැ.**
- **ඩොලර් හිඟයට පිළියමක් වශයෙන් බතික් නිෂ්පාදන අපනයනය කරන්න අප ආයතනය සූදානම්.**
- **දේශීය බතික් නිෂ්පාදන අලෙවි කිරීමට අලෙවිසැලක් වෙන් කළ යුතුයි.**

ඇණවුම් භාර ගනු ලබනවා. නිෂ්පාදන අලෙවි කිරීම නො. 151/බී, කේෂර් වීදිය, කොළඹ 11 යන ලිපිනයේ අලෙවිසල තුළ සිදුකරනවා.

අකුරු ඉගෙනීමට ඉස්කෝලේ ගියත් ඇතැම්විට බඩගින්නට පුංචි අත් වෙව්ලුවේය. එකම ඇඳුම දින කිහිපයක් අදින්නට සිදුවිය. මෙම අගහිඟකම් සේම දරුවාගේ හැකියාව, දක්ෂතාව නායකත්වය හඳුනාගත් ගුරුවරුන් පැවසුවේ 'පුතා කවදාහරි දවසක රටේ කීර්තිමත් ව්‍යාපාරිකයකු වන' බවය.

එදා කුඩා රාමසාමි රමේෂ් ගුරුවරුන්ගේ කීම හොඳින් සිතේ දරාගෙන සිටියත් අගහිඟකම් හා ආර්ථික අපහසුතා නිසා 9 වසරින් පාසල් අධ්‍යාපනයට සමුදුන්නේය. අනතුරුව කොළඹ ප්‍රදේශයේ රු. 600 වැටුපට රැකියාවට පිය නැගුවේය. වසර කිහිපයක් රෙදි කඩයේ සේවය කර උපයාගත් ධනයෙන් ඉතා කුඩාවට තමාගේ නිෂ්පාදනයක් වන දේශීය අමුද්‍රව්‍ය යොදා ඇඳුම් නිෂ්පාදනය කිරීම සඳහා නිවී මෙගා බතික් නිෂ්පාදනය ආරම්භ කළේය.

ඉතා කුඩාවට ආරම්භ කරන ලද නිවී මෙගා බතික් නිෂ්පාදන අද ශ්‍රී ලංකාවේ වෙළෙඳසල් ගණනාවක අලෙවි වන අතර අඩු ආදායම්ලාභී පවුල් රැසකට රැකියා අවස්ථා ලබා දී ඇත.

හිතේ හයියෙන් ජීවිතය දිනන්නට කැමැති කොයි කාටත් අත හිත දෙන හා දේශීය දෙය අගය කරන මෙරට ජනතාව වෙනුවෙන් පසුගිය දිනක අප වත්තල ප්‍රදේශයේ පදිංචි **"නිවී මෙගා බතික්"** නිෂ්පාදන ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ රාමසාමි රමේෂ් හමුවීමට ගියේ ඔහුගේ නිෂ්පාදන ගැන තවදුරටත් සොයා බැලීමටය.

ඉතා සුහදශීලීව අප පිළිගත් අධ්‍යක්ෂවරයා සිය අතීතය ආවර්ජනය කළේ සතුටු කඳුළු එක්කය.

මම පන්තියේ අන්තිමයා වෙලා 9 වසරින් අධ්‍යාපනය නිමා කළ, ඒත් සිය අධිෂ්ඨානයෙන්, කැපවීමෙන් අද ලංකාවේ බතික් නිෂ්පාදනය කිරීම තුළින් ජීවිතය ජයගත්තා. කුඩා කල දැඩි ආර්ථික අපහසුතා නිසා අධ්‍යාපනය 9 වසරින් අවසන් කර කොළඹ ප්‍රදේශයේ රෙදි කඩයක රු. 600 වැටුපට සේවය කළ කාලය දුෂ්කරයි. ඒත් හොඳින් වසර කිහිපයක් සේවය කරළා. මුදල් ඉතුරු කරගෙන මීට දශක දෙකකට ඉහතදී මෙගා බතික් නිෂ්පාදන ඉතා කුඩාවට පටන් ගත්තා. අද වන විට අඩු ආදායම්ලාභී පවුල් රැසකට රැකියා අවස්ථා ලබා දෙමින් ලංකාව පුරා අලෙවි කිරීම සිදු කරනවා. මගේ නිෂ්පාදන අතර සාරි, ගවුම්, කමිස ඇතුළු ඕනෑම ඇඳුමක් නිෂ්පාදනය කිරීමට

රාමසාමි රමේෂ්
කළමනාකාර අධ්‍යක්ෂ

අපගේ නිෂ්පාදනවලට ඉහළ ගුණාත්මකබවයෙන් යුතු රෙදි හා අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදන කටයුතු කරනා බැවින් ඊට ඇති ඉල්ලුමද ඉහළයි එය එසේ වුවත්.

දේශීය බතික් නිෂ්පාදන දියුණු කිරීමට කිසිදු රජයකට වැඩපිළිවෙළක් නැහැ. රජය විසින් විදේශීය රටවලින් ආනයනය කරනු ලබන බතික් නිෂ්පාදන සීමා කළ යුතුයි. මා ලෝකයේ රටවල් ගණනාවකට ගොස් බතික් නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ සොයා බැලුවා. විශේෂයෙන් ප්‍රංශය, කුවේට්, ස්විස්, කැනඩා යන රටවල බතික් වලට විශාල ඉල්ලුමක් පවතිනවා.

අපගේ නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළට යැවීමට රජයෙන් වැඩපිළිවෙළක් සැකසිය යුතුයි. අද ලංකාවේ ඩොලර් හිඟයටද පිළිමයක් වශයෙන් දේශීය බතික් නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළට යැවීමට කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා. එසේම ලංකාවේ මහා පරිමාණ ඇඳුම් අලෙවිසල්වල දේශීය බතික් නිෂ්පාදන අලෙවි කිරීමට, අලෙවි කුටියක් විවෘත කළ යුතුයි. ඉතා කුඩාවට ආරම්භ කළ නිවී මෙගා බතික් නිෂ්පාදන ලංකාවේ වෙළෙඳසල් ගණනාවකින් මිලදී ගත හැකි. අපගේ නිෂ්පාදන සම්බන්ධයෙන් වැඩිවිස්තර ලබා ගැනීමට පහත දුරකතන අංක අමතන්න.
077 308 53 20 / 077 904 10 46 මෙම සියලුම නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් ව්‍යාපාරයට යෝධ ශක්තියක් ලබා දෙන්නේ තම ආදරණීය බිරිඳ, සේවක මඩුල්ල හා ගණුදෙනුකරුවන් බවද ඔහු කිව්වේය. ඔවුන්ගේ ශක්තිය ලබා නොදුන්නේ නම් මාහට නිවී මෙගා බතික් නිෂ්පාදනයේ මෙතරම් දුරක් එම පහසු නැති බවද ඔහු කිවේය.

සටහන :
ජේ. ඒ. සී. ශාන්ත කුමාර

හිත රවට්ටලා කට පාලනය කළොත් මිලියනපතියෙක් වෙන්න පුළුවන්

ඉන්දිකා ප්‍රනාන්දු
මනෝඋපදේශිකා
සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරී

මේ ක මම හොඳින්ම දන්න කාන්තාවක් ගැන කතාවක්. ඇය ගුරුවරියක්. යමක්කමක් තිබුණත් ඇය හරිම ලෝබයි. කට ඇරියොත් කිව්වේ මට නෑ... මට බෑ... වගේ කතා. ඉගෙනගත්තු දරුවන්ට පවා සැලකුවේ බොහොම නපුරු විදියට. ඒ දරුවන්ව දිරිගන්වනවා වෙනුවට ඇය කළේ වචනෙකින් හරි දරුවන්ව වැට්ටුව එක. විවාහ වුණාට පස්සේ සැමියත් එක්කත් ලොකු ලොකු ප්‍රශ්න ඇති කරගෙන දික්කසාද වුණා. පස්සේ මේ කාන්තාව රිය අනතුරකට මුහුණ දුන්නා. දැන් ඇය එක්තැන් වෙලා බොහොම අසරණ විදියට ජීවිතේ ගෙවනවා.

තව පිරිමි ළමයෙක් හිටියා. කඩේක වැඩ කරලා බොහොම දුක සේ තමයි ජීවත්වුණේ. කඩේ වැඩ කරද්දි දවසක් ඔහුට අමුත්තෙක් මුණගැහිලා. **"හැමදෙම මේ කඩේ වැඩ කරන්නද කල්පනාව? ඔහොම ඉඳලා බැහැ. මොනාහරි පටන්ගන්න."** අමුත්තගේ මේ වචනවලින් පිරිමි ළමයගේ ඔලුවට තල්ලුවක් ලැබිලා. ඉතින් ඔහු කඩේ වැඩ කරන ගමන් ඉගෙනගත්තා. හිතේ හයියෙන් ඕලෙවල්, ඒලෙවල් කරලා කැම්පස් ගිහින් උපාධියත් ගත්තා. ඔහු දැන් ළමයි දහස් ගාණකට උගන්වන ලංකාවේ ප්‍රසිද්ධ ගුරුවරයෙක්. අනන්‍යතාවයට හානිවෙන නිසා ඔහුගේ නම කියන්න බැහැ.

අපි හිතන පතන විදියෙන් අපේ මුළු ජීවිතේම වෙනස් කරන්න පුළුවන් කියන එක පැහැදිලි කරන්නයි මම ඔය කතා දෙක කිව්වේ. අපේ රටේ ඉන්න ගොඩක් උදවිය ඍණාත්මකයි. මේක මගේ කරුමේ, මොනවා කරන්නද? මෙතැනින් එහාට මට ජීවිතයක් නෑ කියලා තමන් ඉන්න තත්ත්වය පිළිඅරගෙන ජීවත්වෙන්න හේතු හදාගන්නවා. ඊටපස්සේ සතුටින් ඉන්න මිනිස්සුන්ටත් ඊර්ෂ්‍යා කරනවා. මේ විදියට හිතන ඍණාත්මක මිනිස්සු වැඩිවෙන්න වෙන්න රටක් වුණත් ආගාධයට යන එක නතර කරන්න බැහැ. ඉතින් මේ අලුත් අවුරුද්දේ ඉඳලවත් ධනාත්මකව හිතලා ජීවිතේ ගොඩදාගන්නේ කොහොමද කියලා ටිකක් කතා කරමු.

ධනාත්මකව නැත්තම් ඍණාත්මකව හිතන එක අපේ ජීවිතේට බලපාන්නේ කොහොමද? මේ කාරණාව ආකර්ෂණ නීතියෙන් පැහැදිලි කරන්න මම කැමතියි. මොකද මනෝ විද්‍යාවෙදි අපි පිළිගන්න මේ කාරණා අද නියුරෝන හැසිරීම් අධ්‍යයනවලින් පවා ඔප්පු කරලා තියෙනවා.

මිනිස්සු විදියට අපි මේ විශ්වයේ ඉපදිලා ඉන්නවා. ඉතින් අපිත් විශ්වයේම කොටසක්. මේ විශ්වයේ හැමදෙයක්ම එකිනෙකට බැඳිලයි තියෙන්නේ. ඉතින් විශ්ව ශක්තියෙන්ම තමයි අපිත් බලගැන්විලා තියෙන්නේ.

හැබැයි ගොඩක් අය මේ ශක්තිය අදුනගන්නේ නැහැ. ඉපදිලා දුක් විඳලා ඔහේ මැරිලා යනවා. එහෙම දුක් විඳින්න හේතු වෙන්නෙත් අපේ සිතුවිලිමයි.

'ජීවිතේදි ඔබට ආකර්ෂණය වෙන්නේ ඔබව මිස ඔබට අවශ්‍ය දේ නොවේ' කියලා ඇමරිකාවේ ජෙෂ්ඨ ආචාර්යවරයෙක් වෙච්චි වේන් ඩයර් කියලා තියෙනවා.

ඒක වෙන්නේ මෙහෙමයි. මොළය තමයි අපේ ප්‍රධානම පරිපථය. අපේ මොළය තරංග නිකුත් කරනවා. අපිට දැනෙන සිතුවිලිවලට අනුව තමයි මේ තරංග නිකුත්වෙන්නේ. තරහා, වෛරය, ක්‍රෝධය, අධෛර්ය, ඊර්ෂ්‍යාව, කුහකකම වගේ සිතුවිලි තියෙන කෙනෙක්ගෙන් නිකුත්වෙන්නේ ඍණාත්මක තරංග. ආදරය, සතුට, කරුණාව, ධෛර්යවන්තකම වගේ සිතුවිලි තියෙන කෙනෙක්ගෙන් නිකුත්වෙන්නේ ධනාත්මක තරංග.

නිලමැස්සා අසූචිවලට යනවා වගේ, සමනලයා මල්වලට යනවා වගේ නිතරම ඍණාත්මක දේවල් හිතන කෙනෙක්ට ආකර්ෂණ වෙන්නේ ඍණාත්මක දේවල්. ඒ වගේම ධනාත්මක කෙනෙක්ට ධනාත්මක දේවල්. **"අනේ මට බැහැ, අනේ මට නැහැ, ඇයි මටම මෙහෙම වෙන්නේ"** වගේ දේවල් හිතන කෙනෙක්ට අයහපත් දේවල් වෙන එක නතර කරන්න බැහැ.

මේ කාරණාව පැහැදිලි කරන්න විද්‍යාත්මක ක්‍රම ඕනේ නැහැ. නිකන් හිතන්න නිතරම තරහින් ඉන්න නපුරු කෙනෙක් ගැන. නැත්තම් නැහැ, බැහැ කියාගත්තු කෙනෙක් ගැන. ඒ අයගේ ජීවිත ගැන හිතලා බලන්න. තියෙන්නේම දුක. එයාලව ආශ්‍රය කරන්න කවුරුත් කැමති නැහැ. ඒ අය වටේ ඉන්නෙත් ඒ වගේම අය.

අනික ඍණාත්මක දේ හිතන්න හිතන්න අපේ මොළය ඇඩ්‍රිනලින්, කෝර්ටිසෝල් වගේ ස්ට්‍රෙස් හෝර්මෝන වැඩිපුර නිකුත් කරනවා. එතකොට මානසික අවපීඩනය, කාංසාව, විශාදය වගේ ගැටලු ඇතිවෙන්න පුළුවන්. හැබැයි ධනාත්මක කෙනෙක්ගෙන් නිතරම ස්‍රාවය වෙන්නේ ඩොපමීන්, සෙරටොනින් වගේ හෝර්මෝන. ඒවා ජීවිතේ ජයගන්න අභිප්‍රේරණය දෙනවා. ඒ නිසා කට විතරක් නෙමේ සිතුවිලිත් පරිස්සමෙන් පාවිච්චි කරන්න.

"ඇයි අපි මේකට යුද්දේ කියන වචනේ ගාව ගන්නේ? 'සාම ලැදි කණ්ඩායම' කියලා නම වෙනස් කරනවා නම් මම ඔයාලා එක්ක එකතු වෙන්නම්"

වචන හරි බලවත්. ඒ නිසා කතා කරද්දි, හිතද්දි වචන ගැන පරිස්සම් වෙන්න. දවසක් එක පිරිසක් තෙරේසා මව්තුමියට ඔවුන්ගේ කණ්ඩායම එක්ක එකතුවෙන්න ආරාධනා කළා. ඒ කණ්ඩායමේ නම 'යුද විරෝධී කණ්ඩායම'. **"ඇයි අපි මේකට යුද්දේ කියන වචනේ ගාව ගන්නේ? 'සාම ලැදි කණ්ඩායම' කියලා නම වෙනස් කරනවා නම් මම ඔයාලා එක්ක එකතු වෙන්නම්."** ඇය කිව්වේ එහෙම. ඒ ඍණාත්මක වචනය ඇය ධනාත්මක පැත්තට පෙරලූ හැටි බලන්න.

හැබැයි අපි කොච්චර ධනාත්මක විදියට හිතුවත්, අනික් අයට කරුණාව දැක්වුවත් අපි අවට ඉන්නේ ඍණාත්මක මිනිස්සු නම් අපිත් ඍණාත්මක කෙනෙක් බවට පත්වෙන්න පුළුවන්. නැශනල් ජියෝග්‍රැපික් චැනල් එකෙන් මේ මෑතකදි පරීක්ෂණයක් කරලා තිබුණා. මේකට බාස්කට් බෝල් ක්‍රීඩා කරන්න නොදන්න ගෑනු ළමයෙක්වයි, බාස්කට් බෝල් ක්‍රීඩකයෙක්වයි හොයාගෙන තිබුණා. මේ සමීක්ෂණයෙන් කරන්නේ මොකද්ද කියලා ඒ දෙන්නා දැනගෙන හිටියේ නැහැ. පළවැනි වටයෙදි මේ දෙන්නට බෝලය දන්න වාර දහයක් ලබාදුන්නා. එවෙලේ ගෑනු ළමයට එක බෝලයක්වත් දගන්න බැරිවුණා. හැබැයි ක්‍රීඩකයා බෝල දහයම එල්ලයටම දැම්මා. දෙවැනි වටයෙදි මේ අයගේ ඇස් බැඳලා අවට පිරිසක් තියලා බෝලය දන්න දුන්නා. ගෑනු ළමයට බෝලය දගන්න බැරි වුණත් අවට පිරිස ඇය හරියටම බෝලය දැම්මා වගේ ඇය වෙනුවෙන් අත්පොලසන් දුන්නා. ඇස් බැඳලත් අර ක්‍රීඩකයා බෝලය එලලයටම දැම්මත් අවට අය කිව්වේ **"ඔයාට බෑ... ඔයා වැරදියි"** වගේ දේවල්. නැවතත් ඇස් නොබැඳ බෝලය දන්න තව වටයක් දුන්නා. අර කලින් ලැබුණු උදේයාගය නිසා ගෑනු ළමයා ඒ වටේදි බෝල පහෙන් හතරක්ම එල්ලයටම දැම්මා. හැබැයි අර ක්‍රීඩයකට දන්න ලැබුණේ එක බෝලයක් විතරයි. ඍණාත්මක වචන ඔහුගේ මනස ඒ තරමට වෙනස් කරලා තිබුණා.

කෙනෙක් ඍණාත්මක වෙන්න ඔහුගේ පවුල් පරිසරය, පෝෂණ ඌණතා, මානසික ගැටලු, ඔහුට ඇයට ඇති වෙනත් ගැටලු වගේ දේවල් බලපානවා. ඉතින් කෙනෙක් ඍණාත්මක බව තේරෙනවා නම් ඔවුන්ගේ වචනවලින් මොළ කුරුවල් කරගන්නවා වෙනුවට ඒ ගැන ඔවුන්ව දැනුවත් කරන්න බලන්න. ඒ කරලාත් ඔවුන්ව වෙනස් කරන්න බැරිනම් හොඳම දේ අතේ දුරින් ආශ්‍රය කරන එක. ධනාත්මක සිතුවිලි තියෙන අයව වැඩිපුර ආශ්‍රය කරන එකෙන් අපිත් ධනාත්මක වෙනවා.

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉගෙනගනිද්දි වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහත්තයා කිව්ව කතාවක් මතක් වුණා. දවසක් එක පිරිමි ළමයෙක් කෝච්චියට පනින්න රේල් පාර දිගේ ඇවිදගෙන ගියාලු. එදා කෝච්චි පරක්කු වෙලා. අව්වේ ඇවිදගෙන ගිය නිසා මේ කෙනාට හොඳින් විටමින් D ලැබිලා තියෙනවා. ඇවිද්ද නිසා ව්‍යායාමයකුත් ලැබිලා. ඒ ක්ෂණිකව ඔහුගේ සිතුවිලි වෙනස් වෙලා, ඔහු වෛද්‍යවරයා මුණගැහෙන්න ගිහින්. ඒ දේවලුත් ධනාත්මකව හිතන්න බලපානවා.

විටමින් D, B හොඳින් ලබාගන්න. ව්‍යායාම කරන්න. ඒ වගේම සතුට, විනෝදාංශ වෙනුවෙනුත් කාලය වෙන් කරන්න.

ඉඳලා හිටලා ඇහුවොත් මිසක පුරුද්දක් විදියට දුක හිතෙන සිංදු, චිත්‍රපට බලන්න යන්න එපා. ඒවා නිසාත් අපේ මොළය දුකට හුරුවෙලා ඍණාත්මක දේ ආකර්ෂණය කරගන්නවා.

දැන් අපි ඉන්නේ ලොකු ආර්ථික ප්‍රශ්නෙක. සමහරු මේ ගැන නිතරම කතා කරනවා. බස් එකේ ගියත් නොදන්න අයත් එක්කත් මේ ප්‍රශ්න කතා කරනවා. හැබැයි තව කොටසක් ඉන්නවා මෙවෙලේ ගොඩයන්නේ කොහොමද බලන. ඒ අය වගා කරනවා. ස්වයං රැකියා පටන්ගන්නවා. තමන්ට නැහැ, බැහැ කියලා මොළේට දැනෙන්න දෙන්න එපා. පුළුවන් නම් මොළේ රවට්ටන්න. ජිම් කැරී කියලා ඇමරිකානු චිකට නළුවෙක් ඉන්නවා. කුඩා කාලේ ඔහු බොහොම දුප්පත්. මිලියනපතිනියෙක් වෙන්න ඔහුට හීනයක් තිබුණා. ඉතින් ඔහු හිස් චෙක් එකක් අරන් ඒකේ ඩොලර් මිලියන දහයක් ලියලා පර්ස් එකේ දැගෙන. එදා ඉඳලා ඔහු හිතුවෙම ඔහු ගාව ඩොලර් මිලියන දහයක් තියෙනවා කියලලු. ඒ හිතුවා වගේම තව අවුරුදු දහයකින් ඔහු මිලියනපතියෙක් වුණා.

ඉතින් මේ අවුරුද්දෙවත් හිතන විදිය වෙනස් කරලා බලන්න. එහෙම කළොත් කරන්න බැරි දෙයක් ඇත්තටම නැහැ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

රත්තරන් දුවේ

අත්තනායක
එම්. හේරත්

මම එදා වමනෙ දැම්මේ අපේ අම්මා මතක් වෙලා

රත්තරන් දුවේ

මේ සිදුවීම වුණේ මීට වසර දෙක තුනකට කලින්. එදා මට ප්‍රථම ශාස්ත්‍ර පංතියට කරන්න තිබුණේ ථූපවංශය කියන පොත. ඒ පොතේ තියෙනවා මෙහෙම. විහාරමහාදේවිය කාවන්තිස්ස රජු එක්ක විවාහ වුණාට පස්සේ ඇයට දරුගැබක් හටගන්නවා. එහෙම වුණාම අපි කියනවනෙ දෙළඳුක් ගාය හැදෙනවා කියලා. ඉතින් දේවිටත් ඒ වගේ දෙළඳුක් කිහිපයක්ම ඇතිවුණා. එකක් තමයි එළාර රජුගෙ නායක යෝධයගේ ගෙළ කපපු පිහියේ තැවරුණු ලේ ටික බොන්න. අනෙක මී වැදැල්ලක් ළඟට ගිහින් ඒ මී පැණි මහා සංඝ රත්නයට දන්දීලා ඉතිරිය තමන් ආහාරයට ගන්න.

ඉතින් මම මේ කතාව කියපු මගේ පංතියෙ ළමයි අතර එක දුවක් හිටියා. එයා නිහඬ දැරියක්. කා එක්කවත් වැඩි ආශ්‍රයක් නැහැ. ඒ දුව වෙනදාට වඩා උනන්දුවකින් මගේ දිහා බලාගෙන, අහගෙන ඉන්න බව මට දැනුණා. මං ඒ ගැන නොහිතා පාඩම කරගෙන ගියා. මං කිව්වා විහාරමහදේවියට හැදුනය කියන ඒ 'දෙළඳුක්' ගාය දෙකම කතාකාරයෝ බලෙන් වංශ කතාවලට දපු එකක් කියලා. ගැමුණු රජු කවදාකවත් ලේ පිපාසිතයෙක් වුණේ නැහැ. හැබැයි ගැමුණු කුමාරයාගේ වීරත්වය හුවා දක්වන්න වංස කතාකාරයෝ එතුමාගේ අම්මට දෙළඳුකක් බලෙන් ගෙනත් දැම්මා.

අනුරාධපුරයෙදි දෙමළ මිනිහෙක් මරලා එනකොට කඩුවෙ ලේ මගදි වේළෙනවා. අනුරාධපුරයෙ ඉඳලා එනකොට ඒ වේළිච්ච ලේ විහාරදේවිය බොයිද? අනික ගැමුණු මැරුවේ, එළාර විතරයි. එහෙම නැතුව ගැමුණු කුමාරයා කියන්නේ මිනිස්සු මර මරා ඇවිද්ද හිට්ලර් කෙනෙක් නෙවෙයිනෙ. ඒ නිසා දේවියට නොතිබුණු 'දෙළඳුකක්' කතාකාරයෝ නිර්මාණය කළා කියලා මං කිව්වා.

ඔන්න ඔහොම මං කියාගෙන යද්දි මගේ පංතියේ හිටපු අර නිශ්ශබ්ද දුව පංතියෙන් පිටට ගිහින් වමනය දාන්න පටන්ගත්තා. අපි හිතුවේ ඒක එයාගේ බඩේ අජීර්ණයක් කියලා. අපි ඒක අමතක කරලා පාඩම දිගටම කරගෙන ගියා. ඊළඟ සතියේ අර දුව අම්මත් එක්ක ඇවිත් හිටියා. අම්මයි දුවයි දෙන්නම මගේ ළඟට ආවා. **"සර් මේ මගේ දුව. එයා බඩේ ඉඳද්දි මට කැලේ සතෙක් මරලා කන්න ආශාවක් ඇති වුණා. මං ඒක මහත්තයට කිව්වා. සර් මගේ මහත්තයා විදුහල්පති කෙනෙක්. එයා කැලේට ගිහිල්ලා තිත් මුවෙක් මරාගෙන ආවා. මං ඒක රහට උයලා කෑවා. ඊටපස්සේ සර් මේ දුව වයසින් වැඩෙනකොට ටික ටික දරුණු වෙන්න පටන්ගත්තා."** මං කිව්වා **"අපේ පංතියේ හොඳම ළමයා මේ ළමයා"** කියලා. **"ඔව් සර්. එයා දරුණු වුණේ මං එක්ක විතරයි. කන්න නැති හැමවෙලාවකම මෙයා මට බිම පෙරළගෙන ගහනවා. තාත්තට ගහන්න යන්නේ නැහැ."** මං ඇහුවා **"ඇත්තද මේ අම්මා කියන්නේ?" "ඔව් සර් මට අම්මව පේන්න බැහැ. අනෙක මේ අම්මගෙ තිරිසන් දෙළඳුක හින්දා මට මස් නැතුව බත් කන්න බැහැ. අපේ ශීතකරණේ හරක් මස් නැති දවසක් නැහැ. මට හරක් මස් නොතිබ්බොත් වමනෙ යනවා. එදා සර් විහාරදේවිය ගැන කියාපු කතාව අහලා අම්මා ගැන තරහ වැඩිවුණා. මං වමනෙ දැම්මෙ අම්මා මතක් වෙලා. අම්මට තිබුණනෙ ඔය ආශාව තාත්තට නොකියා මට අඹ මාළුවක් කන්න ඕන කියලා ඔය පෙරේතකම හංගගන්න. එදා සර්ගේ කතාව අහලා මං ගෙදර ගිහින් අම්මට ගැහුවා."** අම්මා තම සාරිපොටින් කඳුළු පිහදාගත්තා.

"ඔව් සර් මේක මගේ දෙළඳුකක් සර්. දුවගේ දෙළඳුකක් නෙවෙයි. ඒකයි දුව මට පහරදෙන්නෙ. මං මෙයාව මෙහෙණි ආරාමයකටත් ගෙනිච්චා. ඒත් ඒ තැන මස් නැති නිසා ආපහු ආවා." "සර් කිව්වනෙ විහාරදේවියට අර දෙළඳුක ආවේ නැහැ, ඒක වංස කතාකරුවන්ගේ බොරුවක් කියලා. ගැමුණු ඒ වගේ හොඳ රජෙක් වුණේ විහාරදේවිය එළාරගේ යෝධයගේ ලේ බිව්වේ නැති හින්දා. ඒක මට විශ්වාසයි. මට මහණ වෙන්න ඕන. මේ මස් පෙරේතකම හින්දා ඒක කරන්න බැහැ. ඇත්තටම සර් මට මේක ඉවසගන්න බැහැ. මට ජීවිතය ඉවර කරගන්න ඕන. මට මේ ජීවිතය තිත්තයි. අම්මට ගහලා මම පව් පුරවගන්නවා. ඒකත් පවක්."

එදා මගෙන් ඈත්වෙලා ගිය ඒ දුවයි අම්මයි ආයේ කවදාවත් මං දැක්කේ නැහැ. කොහොමහරි ඒ දුව විභාගේ කළේ නැහැ කියලා මං දන්නවා. ඒත් ඊටපස්සේ ඇයට කුමක් වුණාද කියන්න මං දන්නේ නැහැ. ඒ හින්දා මට කියන්න ඕන වුණේ සමහර දුවලා පුතාලගේ තියන දරුණු ගණයේ වැරදිවලට සමහර වෙලාවට අම්මලත් වග කියන්න ඕනෙ කියන එක. දරුගැබක් දරාගෙන ඉන්න කාලෙ මවගේ සිතුවිලි පස්සේ කාලෙක ඒ දරුවට සෘජුවම බලපානවා. මේ කතාව මගේ දුවලටත් හොඳ පාඩමක්. අම්මලටත් හොඳ පාඩමක්. දෙළඳුක පිට දලා එක එක ජරාව ඉල්ලනගෙන කන්නෙ අම්මලා. හැබැයි ඒක විඳවන්න වෙන්නේ දරුවන්ට. මත්පැන් බොන දෙමව්පියන්ගෙ දරුවො මත්පැන් බීව්වම දරුවන්ට විතරක් බනින්න එපා. ඒ හින්දා දරුවො හදන්න කලින් විතරක් නෙවෙයි දරුවො වදන්න කලිනුත් දෙමව්පියෝ සෑහෙන්න හිතන්න ඕන. ඉතින් මම හිතනවා ඒ නිසා මේ ලිපිය අම්මලා තාත්තලා දූලා ඔක්කොටම එක වගේ වැදගත් වෙයි කියලා.

අත්තනායක එම්. හේරත්

අලුත්ම කොණ්ඩා විලාසිතාවකින් හැඩගැන්වූ බටහිර මනාලියක්

හැඩගැන්වීම
අසිත නන්දසිරි
(සැලෝන් සැනොරෝ)

ඡායාරූප
උමයන්ග අදිකාරිගේ
සම්බන්ධීකරණය
ක්‍රිෂාන්ත පුෂ්පකුමාර

අද 'ධරණී මනාලිය' ලෙස ඉදිරිපත් කරන්නේ නවීනතම කොණ්ඩා මෝස්තරයකින් හැඩවුණ බටහිර මනාලියක්. මනාලිය හැඩ කරන්නේ කළුතර සැලෝන් සැනොරෝහි අසිත නන්දසිරි විසින්.

"මේ කොණ්ඩා මෝස්තරයට වර්තමානයේ හොඳ ඉල්ලුමක් තියෙනවා. තරුණ පරම්පරාව වැඩි වශයෙන් ඇලුම් කරන්නේ මෙවැනි බටහිර විලාසිතාවලට තමයි. මනාලියට ගවුම අන්දලා තියෙන්නේ උරහිස පේන ආකාරයට. ඒ වගේම උරහිස ළඟින් ගවුම් අතට ලස්සන විලාසිතාවක් එක්කරලා තියෙනවා.

මල් කළඹ සඳහාත් විවිධ මල් භාවිතා කර ඇති අතර ඇන්තූරියම් භාවිතා කිරීම විශේෂත්වයක්.

ගවුමේ ඉහළ කොටසට චාම් වර්ක් එකක් භාවිතා කරලා තියෙනවා. මෙම මනාලියගේ කොණ්ඩා මෝස්තරයෙන් තමා ඇයව වැඩි වශයෙන් ඉස්මතු කරලා තියෙන්නේ."

ඔබට නොදැනීම මුත්‍රා පිට වෙනවාද නිසැක විසඳුම හෝමියෝපති ප්‍රතිකාර.



අප සමාජයේ බොහෝ කාන්තාවන් සඟවා සිටින,ජීඩාවට පත්කරන රෝගී තත්ත්වයක් ලෙස ඉබේ මුත්‍රා පිටවීම දක්නට පුළුවන.පාලනයකින් තොරව මෙසේ වන්නේ අප ශරීරයට අනවශ්‍ය අපද්‍රව්‍ය බැහැර කිරීමට පද්ධති කිහිපයක් තිබෙනවා.එහි වැදගත්ම එක් අවයවයක් තමා මුත්‍රාශය.මෙහි මුත්‍රා පිටකිරීම සාමාන්‍ය ආකාරයට සිදුවන අතර විවිධ හේතු මත අසාමාන්‍ය ලෙස මුත්‍රා බැහැරවීම සිදුවන අවස්ථා දක්නට ලැබීමය.

හයියෙන් හිනාවුණාම, කැස්සක් ඇතිවුනාම, කිවිසුම් ගියාම, මුත්‍රා ඉබේ පිටවීම, ඇයි මෙවැනි තත්ත්වයන් ඇතිවෙන්නේ?

- මෙය අද සමාජයේ බොහෝ අයට දක්නට ලැබෙන ගැටලුවක්.පිරිමි පාර්ශ්වයට වඩා කාන්තා පාර්ශ්වයට මේ තත්ත්වය උදාවීමේ ප්‍රවණතාවය වැඩිය.මෙවැනි තත්ත්වයට හේතු වන්නේ මුත්‍රා රඳවාගෙන තබා ගැනීමට හෝ මුත්‍රා පිට කිරීමට හෝ උදව් වන ස්නායු හා පේශි දුර්වල වීම හෝ හානියට පත්වීම නිසා ඔවුන්ගේ මුත්‍රා පිටකිරීම නිසි ලෙස ඉටුකළ නොහැකි තත්ත්වයට පත්වීමය.
- මේ තත්ත්වය ඇතිවීමට තවත් ප්‍රධානම හේතුවක් වන්නේ ආර්තවහරණ සමයේදී ඊස්ට්‍රජන් හෝර්මෝන ස්‍රාවය අඩුවීම නිසා මුත්‍රා ප්‍රවාහනය කරන මුත්‍රා නාළයෙහි පටක වලට හානි සිදුවීම.
- ගර්භනී හා දරු ප්‍රසව සමයේදී ශ්‍රෝණි (උකුල් ප්‍රදේශයේ) පහළ පෙදෙස් පේශීන්ට හානි සිදුවීම නිසාද මුත්‍රා දරාගත නොහැකිව ඉබේ පිටවීම ඇතිවිය හැක.
- ස්ත්‍රී ප්‍රජනන පද්ධතිය හා ශ්‍රෝණි පෙදෙස් (යටි බඩ පෙදෙස්) ශල්‍යකර්මවල අතුරු අහිතකර ප්‍රතිඵලයක් ලෙසද මුත්‍රා පිටවීම පාලනය කරගත නොහැකි වන අවස්ථා ගැටලු ඇතිවන්න පුළුවන.
- සමහර ඖෂධ භාවිතය (විශේෂයෙන් මුත්‍රා කාරක ඖෂධ ගැනීම) සහ හෝර්මෝන ප්‍රතිස්ථාපන ඖෂධ භාවිතය ආදී හේතු නිසාද තාවකාලික හෝ ස්ථිර වශයෙන් හෝ මුත්‍රා බැහැර කිරීමේදී පාලනයක් නොවී සිටීමට හේතු විය හැක.
- මල බද්ධය (බඩ පෙරළීම)
- කෝපි තුළ අඩංගු කැෆේන් මුත්‍රා මාර්ගය කර්තව්‍ය නිසි ලෙස නොවීමට පුද්ගලයාගේ ශරීර ප්‍රතිශක්තිය දුර්වලතාවය අනුව බලපානු ඇත.
- තරබාරුව (ස්ථූලතාවය),සවලතාව අහිමි වීම මෙන්ම වයසට යාමත් සමග ඇතිවන වෙනස්කම් ද මුත්‍රා රඳා නොසිට නොදැනුවත්ව බැහැර වීමට හේතු සාධක විය හැක.
- පාකින්සන් ,ආඝාදනය වැනි ස්නායු ගත රෝගවලට ගොදුරු වූ අයටද මුත්‍රා පාලනය කර ගත නොහැකිව ඉබේ පිටවන අවස්ථා නිතර දැකිය හැක.

වෛද්‍යතුමනි, මුත්‍රා ඉබේම පිටවීම (මුත්‍රා අසංයමයට) වර්ග කළ හැකිද?

ඔව්,වර්ග තුනකට කාන්ඩ කළ හැකියි.එය හදුනා සිටීම ප්‍රතිකාරයට වැදගත් වනවා.

- **ආතති අසංයමය**

කාන්තාවන් තුළ ඇතිවන සුලභම අසංයම තත්ත්වය ආතති අසංයමය ලෙස හඳුන්වනවා. සිනාසුනත්, කිවිසුමක් ගියත්, කැස්සක් ඇතිවුවත් මුත්‍රා පිටවීමක් මෙහිදී දැකිය හැක.

- **පෙළඹුවේ අසංයමය**

මුත්‍රා පහ කිරීම සඳහා තදබල අවශ්‍යතාවයක් ඇති වීමත්,මුත්‍රා කිරීමේ වැසිකිලියට යාමට පෙර මුත්‍රා පහවීමත් මෙහිදී සිදුවෙනවා. කිසියම් පානයක් ගැනීම,සැනෙකින් මුත්‍රා පිටකිරීමේ අවශ්‍යතාවය ඇතිවීම. නළයකින් වතුර ගලා යන ශබ්දයක් ඇසීම ආදියෙන් පවා මුත්‍රා ඉබේ පිටවීම ඇතිවිය හැක.

රාත්‍රී කාලයේදී නින්දෙන් අවදි වී මුත්‍රා කිරීමේ තද අවශ්‍යතාවය ඇතිවීමටද මෙහි ලක්ෂණයකි.පැය 24ක කාලයක් තුළ අටවරකට වඩා වැඩියෙන් මුත්‍රා පහ කිරීමේ අවශ්‍යතාවය ද මෙහි ලක්ෂණයක් විය හැකිය.

- **උතුරායාමේ අසංයමය**

කාන්තාවන්ට වඩා පිරිමින් තුල සුලබ මෙම මුත්‍රා පිටවීම (අසංයමය තත්ත්වයට) හේතුව මුත්‍රා පහ කිරීමේදී මුත්‍රාශය මුළුමනින්ම හිස් නොවීමයි.

- **මිශ්‍ර අසංයමය**

වර්ග 23ක මිශ්‍ර ලෙස සැලකිය යුතු ආතතිය සහ පෙළඹුම අසංයමය තත්වයක් වැඩිපුරම මෙසේ පැවතිය හැක.

- **ක්‍රියාකාරී මුත්‍රා අසංයමය**

රෝද පුටුවක දිවි ගෙවන, පාකින්සන්, ඇල්ෂයිමර් ආදී ස්නායු රෝගවලින් පෙළෙන කාන්තාවන් තුළින් සුලබව දැකිය හැක.මෙවැනි රෝගීන්ට තමන් මුත්‍රා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නොදැනීම මුත්‍රා පහවීම සිදුවිය හැකිය.

වෛද්‍යතුමනි, හෝමියෝපති ප්‍රතිකාර මගින් මෙවැනි තත්ත්වයන් සුවකර ගත හැකිද?

මෙවැනි තත්වයන්ට ගොදුරු වූ කුමන වයසක කුමන තත්වයක වුවත් අපිට වැදගත් වන්නේ රෝග ලක්ෂණයයි.එය අප ප්‍රතිකාර ක්‍රමයේ ඉතා වැදගත් ස්ථානයක් වනවා. රෝග ලක්ෂණ ගෙන එයට අනුකූලවූ නිවැරදි හෝමියෝපති ඖෂධය දීම තුළ රෝගී තත්ත්වයට හේතු වූ හේතුව නැතිව යාමක් සිදුකරනවා. ප්‍රතිශක්තිකරණය උද්දීපනය සිදුකරනවා. ව්‍යුහාත්මකව වෙනස් වූ කොටස් නිසා ඇතිවන අසමතුලිත ක්‍රියාදාමය නැවත යථාතත්ත්වයට ඇතුලාන්තයෙන් සැකසී ප්‍රකෘති තත්වයට පත්වීම සිදුවෙනවා. එනම් මුත්‍රා දරා සිටීමේ හැකියාව ඇතිවීම, අවස්ථානුකූලව පිට කිරීම හැකියාව ඇතිවෙනවා. එනම්නිවැරදි ක්‍රියාවලිය ඇතිවීම රෝගියා සුවපත් භාවය ලැබීම සිදුවිමය.මේ තුලින් ශරීරයේ අනෙකුත් රෝගවලටත් පුදුමාකාර සුවයක් ලබනවා. රෝගය පිළිබඳව අවබෝධය, විශ්වාසය, ඉවසීම, මේ ප්‍රතිකාර ක්‍රමය තුල නියම ප්‍රතිඵල ලැබීමට හේතු වෙනවා. මන්ද එකම ශරීරය තුළ ප්‍රතිශක්තිය උද්දීපනය මුළු ශරීරයම සුවපත්භාවය ගෙනදෙන්න මේ ප්‍රතිකාර ක්‍රමය ක්‍රමානුකූලව බලවත් ලෙස ක්‍රියා කරනවා. පාවිච්චිය සරල, කිසිදු අතුරු අබාධයක් නොමැති හෝමියෝපති ඖෂධ තුළින් ඔබත් සුවපත් වනු නොඅනුමානයි.

සුවහසක් රෝගීන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කරන එච්.කේ. හෝමියෝපති ආරෝග්‍යශාලාවේ නිර්මාතෘ වෛද්‍ය අනුෂා හේමකුමාර

සටහන පේ. ඒ. සී. ශාන්ත කුමාර

විමසීම් :
එච්.කේ. හෝමියෝපති
හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්
නො.12, පී.බී. අල්විස් පෙරේරා මාවත,
කටුබැද්ද, මොරටුව.
0112 637740/ 0112 637741
071 8250716 / 071 8250717

හින්දි නිළියන් තරමට ගැහැනු හැඩ කරන චින්තාමනී හදු ෂටේ



චින්තාමනී හදු ෂට තියෙන්නේ ඉන්දියාවේ. ඒවට අනෝතත්ත විලේ පැන් කලවම් කරන හින්දා ගාණ වැඩියි

"හදු ෂටය ගැන අහලා තියෙනවද?"

මගේ පැරණිතම මිතුරෙකු වන ප්‍රවීණ ජ්‍යෝතීර්වේදී හේම ශ්‍රී අමරසිංහ පසුගිය දිනක දුරකතනයෙන් අමතමින් ඇසීය.

"හදු ෂටය කියන්නේ හින්දු මහායාන ආගමික විශ්වාසවලට අනුව හිතු පැතු සම්පත් දෙන කලයක්නේ. ඒත් ඒක කල්පිතයක් මිසක් ඇත්ත දෙයක් නෙවෙයි නේද? මම හිතන්නේ අපේ සංස්කෘතියේ එන පුන්කලස ඔය හදු ෂටයේ සංකේතයක්." මම කීවෙමි.

"මේකයි ඇත්තම කතාව! මම පහුගිය දවසක කුරුණෑගල මඟුල් ගෙදරක පෝරුවේ චාරිත්‍රවලට ගියා. ඒ කටයුතු ඉවර වුණාට පස්සේ ඒ මංගල්‍යයට ආපු නෝනලා දෙතුන්දෙනෙක් මගේ ළඟට ඇවිත් 'ඔබතුමා හදු ෂටය ගැන දන්නවද?' කියලා ඇහුවා. ඉතිං මාත් ඒ ගැන ඔය වගේ සාමාන්‍ය කරුණු ටිකක් කිව්වා. ඒතකොට තමයි මාත් උපන්තේකට අහලා නැති ඒ අමුතු හදු ෂට කතාව අහන්න ලැබුණේ." හේම ශ්‍රී කීවේය.

ඔහු ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් තොරතුරු අනාවරණය කළ අන්දමට කුරුණෑගල ප්‍රදේශයේ නගර සහ උපනගර ආශ්‍රිතව මේ අමුතුම හදු ෂට මේනියාව පැතිරගොස් තිබේ. එම කාන්තාවන් පවසා ඇති අන්දමට ඔවුන් හදු ෂටය ලෙස හඳුන්වන්නේ ජලය ලීටර් බාගයක් පමණ පිරවිය හැකි මතුපිටින් රිදී පැහැ ගන්වන ලද මැටි කලයකි. එහෙත් මතුපිට රිදී පැහැති ඊයම් කොළයකින් මුද්‍රා තබා ඇත. කිසියම් තැනක විල්ලීමට හැකිවන සේ නූල් යොදූ ඇති එම හදු ෂටය කුඩා කාඩ්බෝඩ් පෙට්ටියක තැන්පත් කර ඇත.

එම හදු ෂටයක් නිවසේ කාටත් පෙනෙන තැනක විල්ලා තැබීමෙන් ඇස්වහ කටවහ, ග්‍රහ අපල, අනවින, හදි හූනියම්, අමනුෂ්‍ය දෝෂ ආදී සියල්ල දූරීභූත වන බවට විශ්වාසයක් පැතිර තිබේ. විමෙන්ම මෑත භාගයේ එම හදු ෂටය එම ප්‍රදේශවල වඩාත් ජනප්‍රිය වීමට හේතුවද එම කාන්තාවන් මගේ මිතුරා හා කියා ඇත.

"මොකක් හරි විභාගයකට සූදනම් වන දරුවෙකුගේ කාමරේ හරි, ඒ දරුවට නිතරම පේන තැනක ඒ හදු ෂටයක් එල්ලලා තිබ්බොත් අනිවාර්යයෙන්ම ඒ දරුවා ඒ විභාගේ ඉහළින්ම සමත් වෙනවලු. පහුගිය කාලේ ඔය හදු ෂට හින්දු පහේ ශිෂ්‍යත්වේ, ඕ ලෙවල්, ඒ ලෙවල් විභාග ඉහළින්ම පාස්වුණු දරුවෝ බර ගාණක් ඒ පැතිවල ඉන්නවා කියලත් ඒ නෝනලා කිව්වනේ." හේම ශ්‍රී කීය.

"ඒතකොට මට බැරිවෙයිද දන්නෑ ඔය අරුම පුදුම හදු ෂටේ ගැන මොකක් හරි සුලමුලක් පාදගන්න?" ඔහුගේ කතාවෙන් මහත් උද්දෑමයට පත් මම ඇසීමි.

"ඒකම තමයි මම මේ කතා කළේ." එකෙනෙහිම හේම ශ්‍රී කීය. "ඒ වෙලාවේ ඒ නෝනලත් එක්ක වැඩිපුර කතා කරන එකේ තේරුමක් නැති හින්දා මම කිව්වා ඔය හදු ෂටය ගැන හුඟක් දුරට තොරතුරු හොයපු කෙනෙක් ඉන්නවා. ටෙලිෆෝන් එකෙන් ඔය ගැන තොරතුරු දැනගන්න කැමති කෙනෙක් ඉන්නවානම් මට ෆෝන් කරන්න. ඒතකොට මං එහෙම කැමති කෙනෙකුට එයාගෙනුත් අහලා ෆෝන් නම්බර් එක දෙන්නම් කිව්වා. ඔන්න මේ දැන් මට ඒ එක නෝනා කෙනෙක් කතා කළා. මොකද කියන්නේ දෙන්නද ඔයාගේ ෆෝන් නම්බර් එක?" හේම ශ්‍රී සිනාසෙමින් ඇසීය.

"ඒක හරියට සුවිප් එකක් ඇදුන කෙනෙක්ගෙන් දිනුම් සල්ලි ගන්නවද අහනවා වගේ කතාවක්නේ. එහෙම හදු ෂට ගැන දන්න කෙනෙක්ගෙන් තොරතුරක් දැනගත්තොත් අඩුම ගානේ මටත් එකක් ගෙන්න ගන්න හරි බැරියෑ" මමද සිනාසෙමින් කීවෙමි.

හදු ෂටය සම්බන්ධයෙන් මගේ මිතුරාට තොරතුරු ලබාදුන් කාන්තාවන් අතරින් එක් කාන්තාවක මා හට දුරකතන ඇමතුමක් දුන්නේ ඉන් විනාඩි කිහිපයක් ඉක්ම යාමටත් කලිනි. නමුදු හේම ශ්‍රී මා පිළිබඳව කියා ඇත්තේ මා හදු ෂට සම්බන්ධ තොරතුරු හැදෑරූ කෙනෙකු වශයෙන් පමණි.

"ඔය අර හදු ෂට සම්බන්ධ මහත්තයද?" මා වෙත ඇමතුම දුන් එම කාන්තාව මා වෙතින් පළමුව තොරතුරු විමසා සිටියේ එලෙසිනි.

"ඔව්! ඔව්! මිස්ට හදු ෂට තමයි මේ කතා කරන්නේ." මමද එසැණින් කීවෙමි.

ඉන්පසු එම කාන්තාව හෙළිකළ තොරතුරුවලට අනුව දරුවන් විභාගවලින් සමත් කරවන එම හදු ෂටයක් නිවසටම ගෙනැවිත් දීම සඳහා අයකරන ගාස්තුව රුපියල් හත්දහස් නවසියයකි. එහෙත් එය හුදෙක් හදු ෂටයක් මිස හඳුන්වනු ලබන්නේ විනා ඊයම් කොළයකින් මුද්‍රා තබනලද ඒ මුට්ටිය තුළ ඇත්තේ ගොම හෝ අලුද යන්න විමසීමටවත් ඔවුන් කිසිවෙක් උනන්දු වී නැත. එහෙත් ඒ කාන්තාව පුන පුනාම මා හා කීයේ එම හදු ෂටය නිවසේ තබාගෙන සිටි පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට සේම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගවලට මුහුණ දුන් සිසුන් වැඩි ප්‍රමාණයක් ඉන් විශිෂ්ට ලෙස සමත්ව ඇති බවකි. එහෙත් ඇය කී එම 'වැඩි ප්‍රමාණය' හුදෙක් ආරංචි මාත්‍රයක් මිස විධිමත් ලෙස ගණනය කරන ලද්දක්ද නොවිණි.

"හැබැයි ඔය කියන හදු ෂටය නිසා ඒ දරුවෝ විභාග පාස් වුණාද එහෙම නැත්තම් විභාග හොඳට පාස්වුණු දරුවන්ගේ ගෙවල්වල හදු ෂට තිබුණද කියන එකත් වෙනම හොයා බලන්න වෙනවා" මම කීවෙමි.

"ඔව් ඉතිං" එයට පිළිතුරු ලෙස ඇය කීවේ එපමණකි.

"ඔය කියන හදු ෂටයක් රුපියල් හත්දහස් පන්සීයක් වුණාට චින්තාමනී හදු ෂටයක් නම් ඔය ගාණට ගන්න බෑ. අඩු තරමින් රුපියල් විසිදහක්වත් වේවි" මම කීවෙමි.

නමුදු චින්තාමනී හදු ෂට යනුද හුදෙක් මනඃකල්පිතයක් පමණි.

"එතකොට මොකක්ද ඔය දෙකේ වෙනස?" එකෙනෙහිම එම කාන්තාව ඇසුවාය.

"චින්තාමනී හදු ෂට කියන්නේ ඉන්දියාවේ ඒවනේ. ඒවට අනෝතත්ත විලේ පැන් එහෙම කලවම් කරන හින්දයි ගාණ වැඩි. ඒත් ඉතින් හැමදම පාන්දර නැගිටලා මුහුණකට හෝදගෙන පිරිසුදු වෙලා හිත එකඟ කරගෙන ඔය චින්තාමනී හදු ෂටය දිහා එක එල්ලේ බලාගෙන හිටියම සති දෙක තුනක් තුළ ගෑනු අය හුඟක් ලස්සන වෙනවලුනේ. ඔය හින්දි චිත්‍රපටවල ඉන්න නිළියන්ගෙන් වැඩි දෙනෙක් ලස්සන වෙලා තියෙන්නෙ ඒ විදියට කියනවා නේද?" මම ඒ හදු ෂට මුලාවේ තවත් ඉදිරි පියවරක් තබමින් පට්ටපල් කෙබරයක් ඇද බෑවෙමි.

"අනේ මට එහෙම ඒවා තියෙන තැනක ෆෝන් නම්බර් එකක් දෙන්න බැරිද?" එම කාන්තාව අසන ලද්දේ ඉමහත් නොඉවසිල්ලෙනි. ඒ අනුව මට එමගින් තවදුරටත් වැටහී ගියේ අප සමාජයේ පවතින මෙවන් අවිචාරමත් සිතිවිලි ඔස්සේ මිථ්‍යා ජාවාරම්කරුවන්ට තවත් කොපමණ දුරක් ඉදිරියට යා හැකිද යන්න පමණි.

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

පමණ නොදැන අමන වැඩ කරපු අලියෙකුට අලි කරදරයක්

“අලියා නොයන මග - ඉනිමග’ යැයි කතාවට කීවාට වෙලාවකට ඔවුන්ද නොයන තැනක් නැත. විශේෂයෙන් කුසගින්න, පිපාසය දැනුණුවිට යා යුතු නොයා යුතු තැන් තෝරා බේරාගැනීමට අලින්ට අමතක වෙයි.

එක් අලුත් අවුරුදු සමයක කඳුකරයට ජල හිඟයක් ආවේය. එවැනි කාලයක පිපාසාවට දිය සොයමින් ගිය සද්දන්තයෙකු ගැනයි මේ කතාව.

වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ මෙරට විශාලතම අභයභූමියේ සැරිසරන ඔහුට පිපාසය ඉවසාගත නොහැකි විය. තැනිතලාවක මෙන් නොව, කඳු අතර එහෙ මෙහෙ යාම අලියෙකුට පහසු නැත. එහෙත් ඒ අපහසුතාවට වඩා වතුර සෙවීමේ මෙහෙයුම වැදගත්ය. එබැවින් වෙහෙස නොබලා සද්දන්තයා දිගටම ගමන් ගත්තේය. දැවැන්ත සිරුර ඔසවාගෙන කඳු හෙල් අතරින් ගමන වෙනම අභියෝගයකි. ඒ සියල්ල දරාගෙන රෑ බෝ වනතෙක් ගමන් කළද වතුර පොදක් පේන තෙක් මානයක නැත. එහෙත් සද්දන්තයා පරාජය බාර ගැනීමට සූදානම් නැත. ක්‍රමයෙන් රාත්‍රී අඳුර වැටෙන්නට විය. අලියා පල්ලම් බැසීමට තීරණය කළේය. ඒ වේඬරුව ගම්මානය දෙසටයි. බීමට වගේම සිරුර මදක් තෙමාගැනීමට වතුර ලැබෙන බවට ඉඟියක් පෙනේ. සද්දන්තයාට බොහෝ සතුටක් දැනෙන්නට ඇත. ගතවූයේ නිමේෂයකි. පය පැටලී අලියා කුඩා ලිඳට ඇද වැටුණේය. අලියාගේ ඇඟේ වට ප්‍රමාණය සහ ලිඳේ ප්‍රමාණය එක හා සමානය. ගොඩ ඒමට උත්සාහ දරද්දී තව තව එහිම හිරවෙනවා මිස සද්දන්තයාට ගොඩ ඒමේ මගක් නැත. එනිසා රැය එළි වනතුරුම ඔහු එහිම සිරව සිටියේය.

එළිය වැටෙද්දී ලිඳේ සිරව සිටින දැවැන්තයා ගම්වාසීන්ගේ දෙනෙත්වලට හසුවිය. අනේ අපොයි කියනවා හැර ඔවුන්ටද කළ හැකි කිසිවක් නැත. වනජීවියටද පණිවිඩය ගියේය. අලුත් අවුරුදු සමය නිසා වනජීවියේ රාජකාරිවල නියුතු කාර්ය මණ්ඩලයද අවමය. තවත් පිරිසක් නිවාඩු අනුමත කරවාගෙන ගමරට යෑමේ අපේක්ෂාවෙනි. මේ අලි අනතුර ගැන පණිවිඩය ආවේ එවිටය. අවුරුදු කෑමට වඩා රාජකාර්ය උතුම්ය.

අනිල් විතානගේ ප්‍රමුඛ නඩයට වීරසිංහ, අතුල යාපාරත්න, විජේතුංග සහ රියැදුරු සෙනෙවි කඩිමුඩියේ එක්වූහ. අලියා මේ ලිඳට ආවේ කොහොමදැයි සිතා ගැනීමටවත් නොහැකි තරමට ගමන දුෂ්කරය. එතැනට විල්බැරෝවක් හෝ රැගෙන යාමට නොහැකිය. උදව්වට ඇත්තේ අලි කඹයක් පමණි. බොහෝදෙනා සිතුවේ අලියාගේ අස්ථි බිඳී ඇති බවයි. ලිඳක සිරවී සිටින අලියෙක් නිලධාරීන් හතරදෙනෙකු කෙසේනම් ගොඩට අදින්නද? මේ වෙලාවේ හැමදෙනාටම පිහිටක් වූයේ නඩයේ රියැදුරු සෙනෙවි අයියායි. හෙතෙම එම ගමේ පදිංචිකරුවෙකි. ඔහු ගමේ පන්සලේ හාමුදුරුවන්ටද සිද්ධිය දැනුම් දී තරුණයින්ගේද සහාය ගත්තේය. මිනිස් ශ්‍රමය පමණක් නොව කැවිලි පෙවිලි සහ තේ පැන් ආදියද අලි අකරතැබ්බය සිදුවූ ස්ථානයටම ලැබිණ. එසේ නොවූයේ නම් අනතුරට පත්වූ අලියා මදිවාට වනජීවී නිලධාරීන්ද හාමතේ හෙම්බත් වීමට ඉඩ තිබිණ. එහෙත් ගම්මුන්ගේ සහාය හේතුවෙන් සියල්ල හොඳ අතට හැරෙමින් තිබිණි. උදේ පාන්දර ඇරඹූ මෙහෙයුම සවස තුන හතර වෙනතුරු පැවතියේය. අලියාගේ සිරුරට දැමූ කඹය ඇදීමට ගම්වාසීන්ගේ සහාය නොඅඩුව හිමිවිය. පරෙස්සමට ඒ කටයුත්ත කෙරෙද්දී අලියාද හෙමිහිට ලිං උගුලෙන් ගැලවෙන ලකුණු දක්නට ලැබිණ. පැය ගණනාවක වෙහෙසේ ප්‍රතිඵලයක් ලෙස අලියා ගොඩට ආවේ සිය නිවාඩුව කැප කළ නිලධාරීන්ගේ මෙන්ම ඔවුන්ට ශක්තියක් වූ වේඬරුව ගම්වාසීන්ටද මහා සතුටක් ගෙන දෙමිනි.

තොරතුරු
වනජීවී ආරක්ෂක අනිල් විතානගේ

රඡනිකා ලියනගේ

F.A.Ads

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා

පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර

1% ක අඩුම පොලියට ලබා ගන්න

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

විශේෂ සහන රැසක් සමගින්

නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාලවේ

කොළඹ	0771 408 547	මීගමුව	0766 227 056
කොටහේන	0702 539 382	ගම්පහ	0779 230 549
වැල්ලවත්ත	0710 870 686	කළුතර	0776 167 149
ගෘන්ඩ්පාස්	0742 379 739	හලාවත	0779 256 191
මොරටුව	0766 227 059	මාතර	0705 979 237
පානදුර	0767 952 286	ගම්පොල	0710 870 735
වෙන්නප්පුව	0710 869 378	නාවලපිටිය	0710 870 706
ගාල්ල	0705 979 274	හැටන්	0778 790 372
කුරුණෑගල	0766 227 061	කෑගල්ල	0703 583 363
දිගන	0778 156 738	ත්‍රිකුණාමලය	0771 201 854
බේරුවල	0740 920 356	පුත්තලම	0771 201 861
මතුගම	0771 201 860	මහියංගනය	0771 201 862
මොණරාගල	0771 201 852	වත්තේගම	0742 551 103
බදුල්ල	0771 201 863	හපුතලේ	0760 677 018
කල්පිටිය	0761 605 803	මාතලේ	0702 539 389
කටුගස්තොට	0779 476 206	තලවකැලේ	0710 871 009
නාඋල	0763 226 230	රාගල	0710 870 703
කන්තලේ	0742 572 585	පූඩඇඔය	0740 929 541
පොතුවිල්	0771 201 855	මස්කෙලිය	0760 909 822
වැලිමඩ	0778 764 751	පුස්සැල්ලාව	0742 531 360
බගවන්තලාව	0742 588 267	අච්චුවේලි	0743 865 368
ආගරපතන	0765 930 715		

සමාජ මාධ්‍ය හරහා විකුණන බ්ලේඩ්තලවලින් ඩර්මාප්ලෑනින්ග් කරන්නේ බලාගෙන

යූ ටියුබ් නෝනලා කියන හැම එකම උලන්න ගියොත් නම්

බියුටි කච්ල් වෙයි

ටිලී විට්ෆෙල්ඩ් ඔස්ට්‍රේලියාවේ රියැලිටි තරුවක්. ඇය ලස්සන වෙන්න හිතාගෙන ටික්ටොක් වීඩියෝ එකක් අනුගමනය කරලා ගෙදරදිම කටු චිකිත්සාව කළා. ඒකෙන් ඇගේ මුහුණ දරුණුවට තුවාල වුණා විතරක් නෙමෙයි තාවකාලිකව ඇගේ පෙනීමත් අහිමිවෙලා තිබුණා

යිලා රොආවුස්ගේ වයස අවුරුදු 18යි. ලයිලගේ කොණ්ඩේ එයාගේ යාළුවන්ගෙ කොණ්ඩවලට වඩා ඝනකමින් අඩුයි. ඉතින් යාළුවන්ගෙ වගේ ඝනකම් කොණ්ඩයක් ලයිලටත් ඕන වුණා.

'කොණ්ඩේ ඝනකම් කරගන්නේ කොහොමද?'

ලයිලා යූ ටියුබ් එකට ගිහිල්ලා ඔහොම ටයිප් කරලා සර්ච් කළා. ඉස්සර වගේ නෙමේ දැන් හිතට එන ඕනම ප්‍රශ්නෙකට උත්තර හොයන්න කරන්න තියෙන්නේ ෆෝන් එක ටච් කරන එක විතරයි.

ඉතින් යූ ටියුබ් එකේ එක එක ජාතියේ සත්කාර, හෝම්මේඩ් එව්වා, DIY එව්වා, "මම ලස්සන වුණේ මේවා ගාලා" කියන නිළියන්ගේ එව්වා. ඊටපස්සේ ඔය කියන විදියේ එකක් හදාගෙන ලයිලා සති ගාණක් එකදිගටම ගෑවා. දන්නවද අන්තිමට වුණ දේ? ලයිලගේ හිස්කබලේ කුෂ්ඨ රෝගයක් ඇතිවුණා.

එතකොට ටිලී විට්ෆෙල්ඩ් ඔස්ට්‍රේලියාවේ රියැලිටි තරුවක්. ඇය ලස්සන වෙන්න හිතාගෙන ටික්ටොක් වීඩියෝ එකක් අනුගමනය කරලා ගෙදරදිම කටු චිකිත්සාව කළා. ඒකෙන් ඇගේ මුහුණ දරුණුවට තුවාල වුණා විතරක් නෙමෙයි තාවකාලිකව ඇගේ පෙනීමත් අහිමිවෙලා තිබුණා. තව එතකොට කොරියාවේ යූ හෝට 21යි. එයා තොල් ලොකු කරගන්න ආලේප කරපු යූ ටියුබ් DIY සත්කාරයක් නිසා අක්මාවේ ගැටලුවක් ඇතිවෙලා මාස ගාණක් රෝහල්ගත වෙන්න වුණා.

සමාජ මාධ්‍ය කියන්නේ ඕනම දෙයක් ඉගෙනගන්න හොඳ වේදිකාවක් තමයි. හැබැයි යූ ටියුබ්, ෆේස්බුක්, ටික්ටොක් වගේ ඕනම එකක් ඕන කෙනෙක්ට ලොකු අමාරුවක් නැතිව හදාගන්න පුළුවන්. ඇත්ත වුණත් බොරු වුණත් තමන්ගේ හිතලු ඇත්ත වගේ කියන්නත් කාගෙන්වත් තහනමක් නැහැ. ඉතින් මේවිගේ තියෙන හැම එකම ඇත්ත නෙමෙයි. හැබැයි සමාජ මාධ්‍යවල තියෙන හැමදේම ඇත්ත කියලා හිතන අයත් ඉන්නවා.

අනෙක්වා පැත්තකට දමුකෝ. ගොඩක් අය දුරදිග නොබලා මේවිගේ තියෙන හැම එකම මූණේ, අතේ පයේ උලන්න යන එකයි ලොකුම ප්‍රශ්නේ. සමාජ මාධ්‍යවල තියෙන නොදන්නා දේවල් කරන්න ගිහින් ප්‍රතිකාරවලට එන පිරිස එන්න එන්න වැඩිවෙනවා කියලයි වෛද්‍යවරු පවා කියන්නේ.

විෂය ගැන ප්‍රවීණයන්, චර්ම වෛද්‍යවරු කරන වීඩියෝ එහෙමත් සමාජ මාධ්‍යවල තියෙනවා. කැමති කෙනෙක්ට ඒ දේවල් අනුගමනය කරන්න පුළුවන්. හැබැයි අහසින් පාත්වුණු අයයි, රඟපාන උදව්වියයි ශරීරෙට කරන්න කියන එව්වා ඒ පමාවට කරන එක නම් නිකන් දැන දැනම හොර වෙද්දුන්ගෙන් ලෙඩකට බෙහෙත් ගන්නවා වගේ වැඩක්. මේ ගොඩක් අය මමත් මෙව්වා ගෑවා කියලා කැමරාවට කිව්වට කැමරා පිටිපස්සේ මොනවා වෙනවද කියල කවුද දන්නේ?

ඉතින් සමාජ මාධ්‍යවල වැඩිපුරම තියෙන එහෙම වැරදි රූපලාවණ්‍ය උපදෙස් ටිකක් ගැන අද බලමු.

එහෙම එකක් තමයි ඩර්මාප්ලෑනින්ග්. මේ රූපලාවණ්‍ය සත්කාරය ගැන මීට කලින් අපි 'ධරණී' හරහා කතා කරලා තියෙනවා. ඩර්මාප්ලෑනින්ග් එකකදි කරන්නේ ස්කල්පෙල් (Scalpel) වර්ගයේ සර්ජිකල් බ්ලේඩ් තලයකින් මුහුණේ අනවශ්‍ය රෝම සහ මැරුණු සම ඉවත් කරන එක. මේක වෘත්තීයවේදීන් කළ යුතු බොහොම සියුම් වැඩක්. හැබැයි දැන් ගොඩක් උදව්විය යූ ටියුබ් බලාගෙන මේ වැඩේ ගෙදරදිම කරනවා. ඒව්වට හරියනවා කියන බ්ලේඩ්තල පවා සමාජ මාධ්‍යවල ගජරාමෙට අලෙවි වෙනවා. මේ රේසර්වලින් අනවශ්‍ය රෝම ඉවත් කළ පලියට ඒක ඩර්මාප්ලෑනින්ග් එකක් වෙන්නේ නැහැ. අනික මේ තල නිසා සම තුවාලවෙලා බැක්ටීරියා ආසාදන ඇතිවෙන්න පුළුවන්. ඒ වගේම සම වියැලෙන්න, රළු වෙන්න තියෙන ඉඩත් වැඩියි.

ඊළඟ දේ වැක්ස්. හෝම්මේඩ් වැක්ස් සිරප් හදාගෙන ගෙදරදිම අනවශ්‍ය රෝම වැක්ස් කරන හැටි කියලා දෙන වීඩියෝස් අනන්තයි. මේ දේවල් නරඹලා ගෙදර වැක්ස් කරන්න යන එක නම් බොහොම භයානකයි. ඒක සම පිච්චෙන්න, තුවාල වෙන්න පුළුවන් අවදානම් වැඩක් කියලයි වෛද්‍යවරු කියන්නේ.

මුහුණට දෙහි, ලෙමන් ගාන්න කියලා ගොඩක් සමාජ මාධ්‍ය එක්ස්පර්ට්ලා උපදෙස් දෙනවා. දෙහි, ලෙමන් ඇතුළු පැඟිරි වර්ගයේ හැම පලතුරක්ම ආම්ලික ගතියෙන් වැඩියි. ඒ නිසා මේ වර්ග ඍජුවම ආලේප කළොත් සම පිළිස්සෙන්න, රතුවෙන්න පුළුවන්. ඒ නිසා වෙනත් අමුද්‍රව්‍ය එක්ක තනුක නොකර පැඟිරි වර්ග සමේ ගාන්න එපා කියලයි චර්ම විශේෂඥයින් කියන්නේ.

රහස් ප්‍රදේශවලට කරන සත්කාර ගැනත් සමාජ මාධ්‍යවල තියෙනවා. දෙහි, යෝගට්, කහ වගේ නොයෙකුත් දේ රහස් ප්‍රදේශයට ගෑවහම ඒ පැති සුදු වෙනවයි කියලයි ඒ අය කියන්නේ. ඔය තැන්වලට නොදන්න දේවල් උලන්න ගියොත් pH අගය අසමතුලිත වෙලා බැක්ටීරියල් වැජිනෝසිස්, කැන්ඩිඩා, මුත්‍රා ආසාදන වගේ තත්ත්වයන් ඇතිවෙන්න පුළුවන් කියන එකයි වෛද්‍ය මතය.

'කුරුලෑවලට දත් බෙහෙත් ගාන්න' සමාජ මාධ්‍යවල සමහරු ඔහොමත් කියනවා. දත් බෙහෙත්වල මෙන්තෝල්, හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් වගේ සංඝටක අඩංගුයි. ඉතින් දිගින් දිගටම සමේ එකම තැනකට දත් බෙහෙත් ගෑවොත් එතැන සම වියැලෙන්න වගේම පිළිස්සෙන්නත් ඉඩ තියෙනවා.

බේකින් සෝඩාවලින් කරන සත්කාරත් යූ ටියුබ් එකේ ඕසෙට. කිසිම වෙලාවක බේකින් සෝඩා ඍජුවම සමට ආලේප කරන්න යන්න එපා. ඒකෙන් සම වියැලෙන්න වගේම සමේ ආසාදන ඇතිවෙන්නත් පුළුවන්.

චොක්ලට්, අයිස්ක්‍රීම්, මයෝනයිස් වගේ දේ ෆේෂල් සත්කාරයක් විදියට ආලේප කරන්න කියන වීඩියෝ අපි දකිනවා. මේ වගේ දේ වලින් අපේ සමට කිසිම යහපතක් වෙන්නේ නැතිලු. හැබැයි මේවගේ තියන මේද කොටස් තැම්පත් වෙලා සමේ සිදුරු අවහිර වෙලා කුරුළෑ වගේම වෙනත් ආසාදන පවා ඇතිවෙන්න පුළුවන් කියලයි ඇමරිකාවේ ලොයෝලා විශ්වවිද්‍යාලයේ චර්ම රෝග විශේෂඥ රෙබේකා ටුන්ග් කියන්නේ.

මේවා විතරක් නෙමෙයි වැලි කඩදාසි, වයර්වූල් පාවිච්චි කරලා සම මදින්න කියන බොහොම භයානක උපදෙස් පවා සමාජ මාධ්‍යවල තියෙනවා. ඉතින් ඒ දේවල් හොඳඳ නරකද කියලා තේරුම්ගන්න අපිත් ටිකක් සබුද්ධික වෙන්න ඕනේ.

කනෙන් ඇහුවත්, ඇහෙන් දැක්කත් අපි අහන දකින හැමදේම ඇත්ත නෙමෙයි කියලා බුදු බණෙත් දේශනා කරලා තියෙනවනේ. ඉතින් ඇහෙන් දැක්ක පලියට කනෙන් ඇහුව පලියට සමාජ මාධ්‍යවල තියෙන හැම එකම ඇගේ උලන්න යන්න එපා.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ජපානෙ කළාට ඕවා ලංකාවේ කරන්න පුළුවන් වැඩද?

සතුටින් තිබ්බේ කියලා දරුවන්ට දැනෙන්න දෙන එක නෙවෙයි කරන්න ඕනේ. අපි සතුටු වුණේ ඔයාලාව සතුටු කරලා කියලයි දැනෙන්න දෙන්න ඕනේ.

ඒ නිසා දවසක දරුවෝ එක්ක හවස්වරුවේ නිදහසේ ටිකක් පයින් ඇවිදලා එන්න, ඔයාලාට පුළුවන් එක කෑම ජාතියක් හදාගෙන ළඟපාත තියන ඇලක් දෙලක් ළඟට හරි ගිහින් එතැන් ඉඳන් ඒ මොහොතේ සතුට දරුවෝ එක්ක විඳින්න. ජීවිතේ ප්‍රශ්න විසඳෙනකල් අපිට බලන් ඉන්න බෑ. එහෙම හිටියොත් සතුට පේන තෙක් මානෙකටවත් එන්නේ නෑ. ඒ නිසා කාටවත් නොකර ඒ ඒ අවස්ථාව අනුව පුළුවන් හොඳම දේ කරලා දරුවෝ සතුටු කරන්න. දවසක අමාරුකම් මැද්දෙත් මගේ අම්මා තාත්තා මාව සතුටෙන් තිබ්බේ එහෙමයි කියලා එයාලට මතක් වෙයි. ඒ දේවල් පසුතැවීමකට වඩා ඔයාගේ හිතට ලොකු සැනසීමක් ගෙනත් දෙයි.

ඔයාගේ සීමාව ඇතුළේ ඔයාට පුළුවන් දේ කරන්න. එහෙම හැඩගැහුණාම මොන ප්‍රශ්න තිබ්බත් ඒ ප්‍රශ්නවලට ශක්තිමත්ව මූණදෙන්න හිතේ සතුට ඔයා ගාව තියෙනවා. අද මට කුකුල්මස් එක්ක බත් කන්න තිබ්බට හෙට මට පරිප්පුයි බතුයි කන්න වුණොත් මං සතුටුවෙන්නේ මං ඉන්නේ බඩගින්නේ නෙවෙයි මට කන්න මොනාම හරි තියෙනවා කියලා හිතලා.

ඉතින් පුළුවන් නම් මේ 2023 අවුරුද්ද පටන් ගනිද්දී ලොකු දේවල් නැතුව, ඔයාගේ දරුවෝ සතුටු කරන්න පුළුවන් පුංචිම දේවල් දෙළහක් හොයාගන්න. එයාලට නොකියා ඔයාලා සැලසුම් කරන්න. ඔයාලා දන්නවාද එහෙම සැලසුම් කරන එක පවා විනෝදයි, සතුටුයි. මං ඒ හැඟීම හොඳටම දන්නවා. නිවාඩු ගන්න අපහසුමනම් කැලන්ඩරේ නිවාඩු දිනයන් බලලා ඒ දේවල් සැලසුම් කරන්න. දරුවා ඉපදුණ දවස විශේෂ කරන්න. පුළුවන් නම් ගෙදර උයන එක ජාතියන් එක්ක හරි බත් පාර්සලයක් හදලා දරුවා ලව්වා පාරේ ඉන්න නැතිබැරි කෙනෙකුට දෙන්න. ඒවත් හිත සතුටු කරන දේවල්.

අපේ දරුවන්ගේ සතුටයි අපේ සතුට වැඩි කරන්නේ. ඒ මූණුවල හිනාවයි අපේ මූණුවල හිනාවට එළියක් දෙන්නේ. ඒ නිසා අපිට පුළුවන් පුංචිම විදියකට හරි එයාලව සතුටෙන් තියමු.

■ හෂිණී මනමේන්ද්‍ර

දෙමව්පියො දරුවෝ ගැන කොච්චර හිතනවාද, කොච්චර කැපකිරීම් කරනවද කියලා හරියටම තේරුම්යන්නෙ අපිත් අම්මලා තාත්තලා වුණු දවසට කියලයි මට හිතෙන්නේ. ගොඩක් දෙමව්පියෝ තමන්ගේ සතුටට කලින් ඉස්සර කරගන්නේ දරුවන්ගේ සතුට. ඒක හරි ආදරණීය හැඟීමක්.

2021 අවුරුද්දේ අන්තිම වගේ වෙද්දි දහම් මට කිව්වා "රෝසි අපි ඊළඟ අවුරුද්දේ ඉඳන් හැම මාසෙම පොඩි අය වෙනුවෙන් මොකක් හරි ඉවෙන්ට් එකක් කරමු, එයාලත් ආසවෙයි. එතකොට හැම මාසෙම එයාලට වගේම අපිටත් අලුත් ටාර්ගට් එකක් තියෙනවානෙ" කියලා. 2022දී අපේ ජීවිත පටන්ගත්තේ එහෙම සුන්දර හේතු එක්ක. දහම් මුලින්ම කරන්නේ අපේ උපන්දින සහ අනිත් විශේෂ දවස්වලට වෙනද වගේම කලින් නිවාඩු දෑන එක. ඒක සතිඅන්තයේ දවසක් වුණොත් ඊට කලින් දවසෙ හරි සතිඅන්තයට පස්සේ දවසේ හරි එයා නිවාඩුව දෑනවා.

අපි දරුවන්ගේ උපන්දිනවලට එයාලා ආස තැන් කලින්ම අහලා ප්ලෑන් කරලා ඒ තැන්වලට එක්ක ගියා. ඉතිරි මාසවලත් ෆිල්ම් එකක් බලන්න, බෝලින්වලට, වෝටර් පාර්ක් එකට, සත්තුවත්තට, පොඩි ඩ්‍රයිව් එකකට, මල් බලන්න, සරත් සමයේ කොළ හැලෙනවා බලන්න එහෙම එක්කරගෙන ගියා. වියදම් සැරවුණ මාසවලදිත් අපි දරුවෝ වෙනුවෙන් කරනවා කියලා හිතපු දේවල් නොකර හිටියේ නෑ. ඒ නිසා ලොකු ගමන් බිමන් යනවා වෙනුවට අපි කළේ දවල්ට කන කෑමත් හදාගෙන ගෙවල් ළඟ පාර්ක් එකකට පොඩි පික්නික් එකක් ගියපු එක. මේ අවුරුද්දේ අන්තිම මාසෙ වෙද්දි ඒ හැමදෙයක් ගැනම පුදුම සතුටක් දැනුණා. දරුවන්ව සතුටු කළා විතරක් නෙවෙයි, අපිත් ගොඩක් සතුටු වුණා.

හැමදේම කල් තියාම ප්ලෑන් කළා. හිතුව ගමන් යන්න පුළුවන් හැකියාවක් අපිට නැති නිසා යන වියදම් ගැනත් හිතුවා. දහම් හැමවෙලේම කියනවා තව ටිකක් ලොකු වුණාම දරුවො, යාළුවෝ එක්ක එළියට යන්නයි ආසා. ඒ දේවල් ඒ කාලෙදි දරුවන්ට විඳින්න දෙන්න ඕන, ඒ හින්ද අපි එක්ක, එක්ක යන්න පුළුවන් කාලේ පුළුවන් විදියට එයාලා ආස තැන්වලට එක්ක යමු කියලා. මොන දේ සැලසුම් කරද්දිත්, දරුවන්ගේ සතුට ඉස්සර වෙනවා කියලා මං කිව්වේ ඒකයි. එහෙම දැනෙන හැඟීමත් හරිම සැනසීමක්.

දැන් ඔයාලා හිතයි ඔයා ඉන්නේ පිටරට, ලංකාවේ නෙවෙයි, මෙහේ තත්ත්වේ කොච්චර අමාරුද කියලා දන්නේ අපි, ඕවා කරන්න පුළුවන් වැඩද කියලා. මං ඔයාලාට තව දෙයක් කියන්නම්කෝ. දවසක් දහම් මට හරි ලස්සන වචන ටිකක් කිව්වා. "අපිට දේවල් කරන්න පුළුවන් සීමාව ඇතුළේ අපි සතුටින් නම් ජීවිතේ හරි පහසුයි රෝසි" කියලා. අපි කරන්න ඕනේ අපිට පුළුවන් දේ. ඉස්සර මෙහෙම හිටියේ දැන් එහෙම බෑ කියලා මනසින් වැටෙන් නැතුව 'මෙහෙම ඉන්නෙත් මගේ හිත ශක්තිමත් නිසා' කියලා හිතන්න. එතකොට අපේ දරුවොත් ඒවාට හුරුවෙනවා. අපි නොකා නොබී උඹලාව



ක්‍රිමිරාජ®

සුබ අලුත් අවුරුද්දක් වේවා!

සාමය සතුට පිරි 2023
නව වසරට ශ්‍රී ලංකාවාසී ජනතාවට
ගණුදෙනුකාර භවතුන්ට
ආසිරි ගේන්නේ
ක්‍රිමිරාජ ආයතනයේ
කළමණාකාර අධ්‍යක්ෂක

මහාචාර්ය සුමනරත්න අමරතුංග

එම්.ඩී. ලිවේරිස් අමරතුංග සහ පුත්‍රයෝ
බාලෞෂධාගාරය, කිරිවත්තුඩුව, හෝමාගම.

ටිලී ඩිවයින් යන නම අපිට නුහුරු වුවද ඔස්ට්‍රේලියාවට නම් එහෙම නැත. ඒ ඇගේ කතාව එතරම්ම ප්‍රකට නිසාය. ටිලීගේ උපන් රට එංගලන්තය වුවද ඇය විවාහයෙන් පසු ජීවත්වූයේ ඔස්ට්‍රේලියාවේය. උපන් රටේ මුඩුක්කු ගණිකාවක ලෙස සිය දිවිය ඇරඹූ ඇය අවසානයේ නතරවූයේ ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර විසූ දාමරික කාන්තාවක බවට පත්වෙමිනි. ගණිකා නිවාස ව්‍යාපාරයෙන් මෙන්ම තහනම් මත්ද්‍රව්‍ය වෙළෙඳමෙන් ධනපතිනියක වූ ඇය සිඩ්නි පාතාලයේ රැජිනක් ලෙසද දිගුකලක්ම නම් දැරුවාය. ජීවිත කාලය පුරා දෙසීය වතාවකට වැඩි වාර ගණනක් පොලිස් පොතේ නම් ලියූ ඇයට සිය ජීවන චාරිකාව නිමකරන්නට සිදුවූයේනම් ඇයවත් නොසිතූ අයුරිනි. මේ ටිලී ඩිවයින් නම් ඒ හිතුවක්කාර ගැහැනියගේ කතාවයි.

මුඩුක්කුවෙන් මිදෙන්න ගණිකාවක් වුණු මට අන්තිමේ මුඩුක්කුවත් නැතිවුණා

පුරුවේ කළ පවකටදෝ ටිලීට ඉපදෙන්නට සිදුව තිබුණේ දුප්පත්කමේ පතුලේම ගිලී තිබූ මුඩුක්කු පැල්පතකය. 1900 සැප්තැම්බර් 08 වැනිදා එංගලන්තයේ දකුණු ලන්ඩනයේ ඉපදී හරිහැටි පාසල් අධ්‍යාපනයක් නොලැබූ මේ දුප්පත් පුංචි කෙල්ල වයස අවුරුදු 12ක් වනවිට සිය පාසල් ගමනට තිත තබා නගරයේ තිබූ කර්මාන්තශාලාවක වැඩට ගියාය. ඒ දුප්පත්කමෙන් බැටකමින් සිටි තම පවුල ගොඩගැනීමේ අරමුණු ඇතුවයි. එසේ සිටියදී කර්මාන්තශාලාවේදී මුණගැහුණු අලුත් යාළුවෙකු ඉක්මණින් මුදල් ඉපැයිය හැකි අලුත් රැකියාවක් ගැන ඇයට ඉඟියක් දුන්නේය.

"ටිලී, කරනවා නම් හොඳ රස්සාවක් තියෙනවා. ආයෙත් ඉතින් මෙතැන වැඩ කරනවා වගේ නෙවෙයි ඒ රස්සාව. පැයෙන් ලොකු ගාණක් අතට ගන්න පුළුවන්. ලොකු අමාරුවකුත් නෑ."

ඒ එකී රැකියාව ගැන ටිලීට ඇසුණු රස කතාවය. ඔහු පවසා තිබුණේ වෙනත් රැකියාවක් ගැන නොව ලොව පැරණිතම රැකියාවක් ලෙස සැලකෙන ගණිකා වෘත්තිය පිළිබඳවයි. පාසල් ගමනටද තිත තබා පවුලට හයියක් වීමේ අරමුණින් මුඩුක්කුවෙන් එළියට ආ ටිලී එතැන් පටන් ගණිකාවක බවට පත්විය.

"මට උවමනා වුණේ එකපාර වැඩි මුදලක් හොයන්න. මොකද මුඩුක්කු ජීවිතේ මට තිත්ත වෙලයි තිබුණේ. ඒ හින්දයි මං එහෙම රස්සාවක් කරන්න හිතුවේ."

අලුත් රැකියාව නිසා ඇය යහමින් මුදල් හම්බකළාය. එලෙසින් වසර දෙක තුනක් ගතවෙද්දී ටිලීට බිග් ජිම් නම් ඔස්ට්‍රේලියානු ජාතික තරුණයෙකු මුණගැසිනි. එවිට ටිලීට වයස අවුරුදු 16කි. එම තරුණයා ඔස්ට්‍රේලියානු රාජකීය හමුදාවට අනුයුක්තව සේවය කළේය. ආරක්ෂක රාජකාරි සඳහා ඔහු ලන්ඩනයට එවා තිබුණේ එය පළමු ලෝක යුද්ධය පැවති සමය නිසාවෙනි. ඔහුගේ හමුවීම ටිලී ප්‍රේමයකට හරවා ගනිද්දී දෙදෙනාගේ එම ප්‍රේම කතාව විවාහයකින් කෙළවර විය. නමුත් දෙදෙනාම අධික ලෙස මතට ලොල් වී සිටි නිසා ඒ විවාහ දිවිය සතුටින් සහජීවනයෙන් ගෙවුණු එකක් නොවීය.

ඔය අතරතුර පළමු ලෝක යුද්ධය අවසන් වූ නිසා බිග් ජිම්ට නැවත ඔස්ට්‍රේලියාව බලා යාමට සිදුවිය. ඔහු ටිලී සමඟ එරටට යන්නට නැව් නැග්ගේ 1920 ජනවාරි 13 වැනිදාය. කැලේ මාරුකළද කොටියාගේ පුල්ලි මාරු නොවන්නා සේ රට මාරුවුවද ටිලීගේ රැකියාවේ නම් වෙනසක් වූයේ නැත. ඇය එරටේදීද දිගින් දිගටම ගණිකා වෘත්තියේ යෙදුනාය. පුදුමයට කරුණ නම් ඇගේ සැමියාද ඊට නොමදව සහායවීමයි.

ටිලීට ගණිකා වෘත්තියෙන් යහමින් මුදල් ලැබුණද ඇය නොවෙයි එයින් සෑහීමකට පත්වූයේ. ඒ නිසා ඇය ඔස්ට්‍රේලියානු නීතියේ වූ කපොළු කිහිපයක් හඳුනාගෙන නීත්‍යානුකූල අන්දමින් ලිංගික සේවා සපයන නිවාසයක් ආරම්භ කළාය. එම ගණිකා නිවාසය කොතරම් ජයට කෙරීගෙන ගියාද කිවහොත් කෙටි කලකින් ඉල්ලුමට සරිලන සැපයුම ලබාදෙන්නට එවැනි නිවාස කිහිපයක්ම තනන්නට සිදුවිය. මේ අතරවාරයේ ඇගේ සැමියාද අලුත් රැකියාවකට අතගැසීය. ඒ අබිං සහ කොකේන් වැනි තහනම් මත්ද්‍රව්‍යය විකිණීමේ ව්‍යාපාරයකටයි.

"මට ලොකුම බාධාව වුණේ පොලිසිය. ඒ අය හැමවෙලේම මගේ වැඩවලට ඇඟිලි ගැහුවා. ඒක මට ලොකු හිසරදයක් වෙලයි තිබුණේ."

ඇයට නිරන්තරයෙන්ම පොලිස් අත්අඩංගුවට පත්වීමට සිදුවිය. 1921 - 1925 අතර කාලයේදී ඇය අත්අඩංගුවට පත්වූ අවස්ථා ගණන 79කි. ඒ නිසාම ආරක්ෂාව වෙනුවෙන් ඇය ආරක්ෂකයින් පවා තබාගැනීමට කටයුතු කරන ලදී. ඒ ආරක්ෂකයින්ද අංක එකේ දරුණු අපරාධකරුවන් හෝ පාතාල සාමාජිකයන් විය.

ගණිකා මඩම්වල මැඩම්ලා දෙන්නගේ රණ්ඩු බේරන්න බැරිව ඔස්ට්‍රේලියානු පොලිසිය ලැජ්ජා හිතෙන විදියේ තීරණයක් අරගෙන

ටිලී වැඩි වශයෙන් ජීවත්වූයේ සිඩ්නි නුවර වූ වුලුමුලු නම් ප්‍රදේශයේය. ඒ වනවිටත් ඇය එහි නිලනොලත් නායිකාවක සේ කටයුතු කළ අතර 'වුලුමුලුහි රැජින' යන අන්වර්ථ නාමයක්ද ඇයට පටබැඳී තිබුණි. ඒ බලපුළුවන්කාරකම් නිසාම ටිලීට ප්‍රබල සතුරන් කීපදෙනෙකුද නිර්මාණය වී තිබිණි. ඒ අතරින් ප්‍රබල වූයේ කේට් ලේ ය. ඇයත් ගණිකා වෘත්තියෙන් සහ නීතිවිරෝධී මත්පැන් අලෙවියෙන් ඔස්ට්‍රේලියාවේ මුල් බැසගෙන සිටි ප්‍රසිද්ධ කාන්තාවකි.

එක් රටක රජකමට ඉඩ ඇත්තේ එක් රජෙක්ට පමණක් වන නිසා ටිලී සහ කේට් අතර සීතල යුද්ධයක් ඇතිවිය. සෑමවිටම දෙදෙනාගේ කල්ලි අතර ඇතිවූ ප්‍රබල ගැටුම් නිසා කිහිපදෙනෙකු ජීවිතවලින්ද වන්දි ගෙවීය. මේ ගැටුම් සිඩ්නි පොලිසියටත් මහත් හිසරදයක් වී තිබුණි. එනිසාම සිඩ්නි පොලිස් කොමසාරිස්වරයා පොලිසියත් හෑල්ලුවන අන්දමේ වෙනස් තීරණයක් ගත්තේය. ඒ දෙදෙනා අතර ගැටුම් නවතා දැමුවොත් ඔවුන්ගේ තහනම් ව්‍යාපාර සියල්ලක්ම නිදහසේ කරගෙන යාමට පොලිසිය ඉඩදෙන බව දැනුම් දෙමිනි. එයින් ප්‍රයෝජන ගත් මේ දෙදෙනා එතැන් පටන් යළිත් ගැටුම් ඇතිකර නොගෙන සිටීමට තීරණය කළහ.

"පොලිසිය එහෙම කියද්දි අපි මොකටද ගැටුම් ඇතිකරගන්නේ කියලා අපිට හිතුණා. මොකද ඒ ලැබුණු නිදහස හැමදේටම වඩා වටිනවා. ඉතින් මමයි කේට් අතරයි ආයෙත් ප්‍රශ්න ඇතිවුණේ නෑ. එයා මගේ එක්ක යාළුත් වුණා."

නමුත් කාලයත් සමඟ ටිලීගේ බහින කලාව උදාවිය. ඒ විවිධ හේතු නිසාවෙන් ඇගේ නීතිවිරෝධී ව්‍යාපාර සියල්ලක්ම කඩාවැටීම නිසාය. ඒත් සමඟින් ඇය මානසිකව දුර්වල වූ අතර බිග් ජිම්ව දික්කසාද කිරීමට පවා පෙළඹුණි. පසුව එරික් පාසන්ස් නම් පුද්ගලයෙකු හා විවාහ වූ අතර එයද සාර්ථක මඟුලක් වූයේ නැත. නමුත් ප්‍රශ්නකාරී වාතාවරණයන් මැද වුවද 1945 වසරේ සිදුවූ එකී විවාහය දහතුන් වසරක් පුරාවටම එරික්ගේ හදිසි මරණය දක්වාම පැවතුනි. ඔය අල්ලපනල්ලේම 1955 වසරේදී ටිලීට එරෙහිව චෝදනා ගොනුවූයේ ඇය රජයට ගෙවිය යුතු බදු මුදලක් නොගෙවා සිටීම නිසාය. එය ඩොලර් 20,000ක මුදලක් වූ අතර එය ගෙවීම සඳහා ටිලීට තමන් සතු වූ එක් ගණිකා නිවාසයක් හැරෙන්නට අනෙක් සියලුම දේපළ විකුණා දමන්නට සිදුවිය. නමුත් ඉතුරු ගණිකා නිවාසයද ඇයට අහිමිව ගියේ 1968 වසරේදී විරුද්ධ පාර්ශවයක් විසින් එයට බෝම්බ ප්‍රහාරයක් එල්ලකිරීම හේතුවෙනි.

1970 නොවැම්බර් 24 වැනිදා දරුණු පිළිකාවක් හේතුවෙන් ටිලී ජීවිත මඬලෙන් සමුගත් අතර ඒ වනවිටත් ඇය දෙසීය වතාවකට වැඩි අවස්ථා ගණනක සිඩ්නි පොලිස් අත්අඩංගුවට පත්ව තිබුණි. කෙසේ හෝ මුඩුක්කුවෙන් පැමිණ නීතිවිරෝධී වැඩවලින්ම ධනපතිනියක් වූ ටිලී සමුගන්නා විට ඇය මුඩුක්කුවෙනුත් පහළට ඇද වැටී තිබුණි. අඩුතරමින් ඇගේ මරණය තියන්නට ඇය උපන් මුඩුක්කු ගෙදරවත් ඇයට තිබුණේ නැත. වැරදි පාරෙන් හරිහම්බ කරන රුපියලක්වත් යා නොදෙන බවට ටිලී ඩිවයින් ද හොඳ උදාහරණයක් නොවේද?

■ රුවන් එස්.සෙනවිරත්න

උන්ට නොඳනම් අපිට මොකෝ?

මින්දනී අගනුවර නේවාසිකාගාරයට ආ මුල් දිනවල බොහෝ නිහඬය. නමුත් මිතුරියන්ගේ හිතවත්කම් මැද ඇය තුළ සැඟවී සිටි කටකාර මින්දනී එළියට ආවාය. එහි සිටි යුවතියන්ගෙන් කිහිපදෙනෙකු ඉගෙනුම ලබන අය අතර සෙස්සෝ රැකියා කරන්නන් වූහ. මින්දනී ද පෞද්ගලික ආයතනයක රැකියාවක් කරන්නීය. මේ ඇයගේ පළමු රැකියාවයි.

දිනක් මිතුරියන් හා තේ පානය කරමින් සිටි වෙලාවක මින්දනී හඬ අවදි කළාය.

"මේ ඔයාලට මම කියන්නමයි හිටියේ. 8 වැනි කාමරේ තුෂාරි "

මින්දනී යමක් කියා මඟින් නවත්වා සිනාසුනාය.

"ඉතින්?"

"මම දැක්කනේ තුෂාරි කොල්ලෙක් එක්ක ස්කයි හොටෙල් එකෙන් එළියට එනවා." මින්දනී කීවේ සෙස්සෝ ඉන් පුදුමයට පත්වනු ඇති සිතාගෙනය.

"ඉතින්?" එක මිතුරියක ඇසුවේ සාමාන්‍ය කටහඬකිනි. එහි විශ්මයක සේයාවක්වත් නැත.

"ඔයාලා කලින් දැනගෙන හිටියද?" එවර මින්දනී ඇසුවේ පුදුමයෙනි.

"ඕකේ මොනාද ඩියර් අමුතුවෙන් දැනගන්න තියෙන්නේ? ඔයා හිතන් ඉන්නේ පෝඩුවක් හොටෙල් එකකට යන්නේ අහවල් දේට විතරමයි කියලද? හොටෙල්වල කන්න බොන්නත් තියෙනවා." නිලුකා කීවේ මහාහඬින් සිනාසෙමිනි. මින්දනීගේ මුහුණ ලජ්ජාවෙන් රතුවූයේ තමන්ගේ නොදැනුවත්කම නිසාය.

"ඇරත් තුෂාරි කියන්නේ අවුරුදු 18ට වැඩි කෙල්ලෙක්නේ. කොල්ලෙක් එක්ක අහවල් වැඩේට ගියත් ඒක අපිට අදාළ නැහැනේ. මේවා කතා කරන්නවත් සුදුසු දේවල්ද මින්දනී? ඒක එයාගේ පෞද්ගලික දෙයක්." වාසනා තරහකින් මෙන් කියද්දී මින්දනීගේ මුව ගොළු වූයේ කියන්නට කිසිවක් නැතිවය.

මින්දනී සිදු වූ දේ ගැන දිගින් දිගටම සිතන්නට වූයේ නිදි බව බොරුවට හඟවමින්ය.

"මම එන්න කලින් ඉඳන් තුෂාරි මෙහෙ හිටියනේ. තුෂාරි ගැන කියද්දී මෙයාලට අවුල් යන්න ඇත්තේ ඒකයි. ශික්... මටත් පිස්සුනේ. ඇත්තනේ ඉතින් කවුරුහරි මගේ යාළුවෙක්ගෙ ඕපදූප කියන්න ආවා නම් මටත් තරහ යනවනේ." මින්දනී අවසන් වශයෙන් සිතාගත්තාය.

කාලය ගෙවුණේ වෙනසක් නැතිවය. මිතුදමෙහි වෙනසක් වූයේද නැත.

"අද මට මාර දෙයක් අහන්න ලැබුණනේ." දිනක් නින්දට යන්න සැරසෙද්දී මින්දනීට කියැවුනි.

"මොකද්ද මින්දනී?"

පවතින රජයේ ඇමතිවරයෙකු වූ තුමිඳුට කවුරුත් දක්වන්නේ තද අකමැත්තකි. ඔහු සංවර්ධනය මුවාවෙන් මුදල් වංචා කරන බව ප්‍රසිද්ධ රහසකි. පෙර දිනයේත් කාමරයේ මිතුරියන් තුමිඳු ඇමතිවරයාට හොඳ හැටි බැන වැදුණු හැටි මින්දනීට මතකය. ඇය බිය නැතිව හඬ අවදි කළේ ඒ නිසාය.

"අර ඇමතියා... තුමිඳු සේනාසිංහ... මිනිහා ඉන්දියාවේ යනවනේ නිතර. ඒ යන්නේ උදෑව්වට කියන තෙලිඟු නිළිය බලන්නලු. මේක බොරු ආරංචියක් වෙන්න නම් බැහැ. මට ඇහුනා අපේ බොස්ලා කතා වෙනවා. ඊයා නේද? ඒ දෙන්නා අතර සම්බන්ධයක් තියෙනවලු."

"ඉතින් මින්දනී තුමිඳුගේ දේශපාලනයට ඒක සම්බන්ධ වෙන්නේ කොහොමද කියන්නකෝ?" වාසනා අසද්දී මින්දනීට දැනුණේ මෙවරද වැරදුණු බවය.

"මින්දනී අපි තුමිඳුව විවේචනය කරනවා තමයි. ඒ එයාගේ දේශපාලනය ගැන. එයාගේ පෞද්ගලික ජීවිතේ අපිට ඇත්තටම අදාළ නැහැ. එයාට ගෑනු එකක් නෙවේ දහයක් හිටියත් ඒක ගැන අපි හොයන්නේ මොකටද?" කාවින්දි ද පසෙක සිට ඇසුවාය.

"මේ ළඟදිත් ඔයා මහ විකාර කතාවක් කිව්වා මින්දනී. අනිත් රූම්වල අයත් ඉන්න නිසා මම ඇහුනේ නැහැ වගේ හිටියේ. අපි එවෙලේ කතා කළේ අර සම්මාන පිට සම්මාන ගන්න ශ්‍රාස්ත්‍රීය සංගීතඥ රේණුකා වික්‍රමසිංහ ගැන. ඔයා මැද්දට පැනලා කියනවා රේණුකාගේ තුන්වැනි කසාදෙ ගැන. රේණුකා කසාද 3ක් නෙවේ 10ක් කරගත්තත් අපිට වෙන පාඩුව මොකද්ද? අපි අගයන්න ඕනේ එයාගේ දක්ෂකම මින්දනී. ඔගේ මේ අඩුපාඩුව හදාගත්තේ නැත්නම් සමාජය ඉස්සරහ විහිළුවක් වෙන්නේ ඔයාමයි." නිලුකා කියද්දී මින්දනීට දැනුණේ මහා ලැජ්ජාවකි. මින්දනීගේ දෙනෙතින් කඳුළු ගලා යද්දී නිලුකා අයගේ පිටට තට්ටු කළේ ඇයව සනසන්නටය.

"සමහරවිට මේ ඔයාට ගෙදරින් ලැබුණු පුරුදු වෙන්න ඇති. හැබැයි ඒ පුරුදු වැරදියි." වාසනා කියද්දී මින්දනීට සිහිවූයේ තමන්ගේ නිවසය.

මින්දනීගේ නිවස අවට සිටින්නේ ඥාතීන්ය. ඔවුන් බොහෝ දයාබරය. කරුණාවන්තය. එකිනෙකා වෙනුවෙන් පෙනී සිටින්නෝය. නමුත් ඔවුන්ට අනුව ඕපාදූප කතා කිරීම වරදක් නොව, සාමාන්‍ය දෙයකි. කෙල්ලෙක් කොල්ලෙක් සමඟ යාළුවීම, දික්කසාදය, නැවත විවාහ වීම, අනියම් සම්බන්ධතා ඔවුන්ට රසවත් මාතෘකාය. තමන්ගේ නිවසට මේ ආරංචි ගෙන එන ආච්චිට අම්මා කිසිදා එපා කීවේ නැත. මේ ආරංචි නැන්දගේ නිවසට ගෙන යන අම්මාට නැන්ද කවදාවත් එපා කීවේ නැත.

අනුන් ගැන කතා කර, අනුන්ගේ අඩුපාඩුවලට සිනාසීම හෝ බැන වැදීම වරදක් බව ආච්චිලාගේ පරම්පරාවවත්, අම්මලාගේ පරම්පරාවවත් තේරුම්ගත්තේ නැත. තමාගේ පරම්පරාවද ඊට වෙනසක් නැත. නැන්දගේ දුව, පුංචි අම්මාගේ පුතා ඇතුළු සියලෝම එහි වරදක් දකින්නේ නැත. තමාට මෙවැනි කල්‍යාණ මිතුරන් නොලැබුණේ නම් තමන්ටද කිසිදා මෙය වරදක් බව දැනෙන්නේ නැත. දැන් වෙනස් විය යුතු කාලය එළැඹ තිබේ. මුලින් තමා වෙනස් විය යුතුය. ඉන් පසුව තමාගේ ඥාතී සහෝදර සහෝදරියන්ට 'අනුන්ගේ පෞද්ගලිකත්වය අපට අයිති නැත' යන අදහස උපක්‍රමශීලිව ඒත්තු ගැන්විය යුතුය. ඉන්පසුව අම්මලාගේ පරම්පරාවට මෙය ඒත්තු ගැන්විය යුතුය.

මින්දනී තීරණය කළාය.

■ සමාධි ඔයස්

ගෙදරට එන අමුත්තන්ටත් ෆ්‍රයිඩ් රයිස් කාලා එපා වෙලාද?

අමුත්තන්ට රස වෙනසක්

අමුමිරස් මෝජුව



අවශ්‍ය ද්‍රව්‍ය

- අමුමිරිස් ග්‍රෑම් 200
- අඹරාගත් අඹ තේ හැඳි 2
- විනාකිරි ස්වල්පයක් (තේ හැඳි 3ක් පමණ)
- ඉඟුරු කුඩා කැබැල්ලක්
- අමුමිරිස් බැදගැනීමට අවශ්‍ය පමණ තෙල්
- සුදුලූනු බික් 5 • සීනි ස්වල්පයක්
- ලුණු ස්වල්පයක්

සාදන ක්‍රමය

- අමුමිරිස් ටික සෝදා යටින් කුඩාවට පලාගන්න.
- එසේ පලාගත් අමුමිරිස් ටික ගැඹුරු තෙලේ සුදුපාට වනසේ බැදගන්න. (මිරිස් බැදීමේදී ඉතා ප්‍රවේශමෙන් බැදගැනීමට වගබලාගන්න.)
- දැන් ඉඟුරු කැබල්ල සහ සුදුලූනු ටික හොඳින් අඹරාගෙන එයට අඹරාගත් අඹ ටික එක්කරගන්න.
- අනතුරුව එයට සීනි, ලුණු සහ විනාකිරි ටික එක්කර හොඳින් කලවම් කරගෙන බැදගත් අමුමිරිස් ටික එයට එක්කර ආහාරයට පිළිගන්වන්න.

පේලි මිශ්‍ර එළකිර පුඩිම

අවශ්‍ය ද්‍රව්‍ය

- එළකිරි ලීටර් 1
- පාට 3ක පේලි පැකට් 3
- පේලටින් ග්‍රෑම් 20
- සීනි ග්‍රෑම් 100

සාදන ක්‍රමය

- පේලටින් ටික භාජනයකට දමා එයට ඇල්වතුර ටිකත් එක්කර දියකරගන්න.
- පාට තුනකින් ගත් පේලි පැකට් තුන වෙන වෙනම සාදගෙන කලින් සෙට් කරගෙන තබාගන්න.
- එළකිරි ටික ලිප තබා එයට සීනි ටික එක්කර මදක් රත්කරගන්න. කිරි ටික බුබුළු දමනවිට පේලටින් ටිකත් එක්කර හොඳින් කලවම් කර ලිප නිවාගන්න.
- දැන් රත් කරගත් කිරි ටික හොඳින් නිවාගන්න.
- අතුරුපස පිළිගැන්වීම සඳහා වීදුරු දිගැට හැඩයේ භාජනයක් තෝරාගන්න. ඒ මතට පාට තුනෙන් සකසාගත් පේලි ටික වෙන වෙනම කොටු හැඩයට කපාගෙන පාට තුන විසිරී යන ආකාරයට භාජනයට දමාගන්න.
- පසුව නිවුණු කිරි ටික ඒ මතට දමා ශීතකරණයේ තබා සෙට් කර කෑමට ගන්න.

චීස් මිශ්‍ර චිකන් පැස්ටා

අවශ්‍ය ද්‍රව්‍ය

- පැස්ටා ග්‍රෑම් 400 (පැකට් 1)
- තම්බාගත් කුකුල් මස් ග්‍රෑම් 200
- ලීක්ස් ග්‍රෑම් 100 • බී ලූනු ගෙඩි 2
- ලුණු අවශ්‍ය පමණට
- ගම්මිරිස් කුඩු අවශ්‍ය පමණට
- මික්ස් හර්බ් මේස හැඳි 1
- ඉඟුරු කැබැල්ලක්
- සුදුලූනු බික් කිහිපයක්
- ඔලිව් තෙල් මේස හැඳි 3
- පොල්තෙල් මේස හැඳි 1 • කිරි කෝප්ප 1 • චීස් කැබලි 2

සාදන ක්‍රමය

- පැස්ටා භාජනයකට දමා තෙල් සහ ලුණු ස්වල්පයක් දමා බෙර් නොවන සේ තම්බාගන්න.
- තැම්බුණු පසු හොඳින් පෙරා ඇල්වතුරෙන් සෝදා තෙත බේරාගන්න.
- දැන් ලීක්ස් දිග අතට සිහින්ව කපාගන්න. බී ලූනු තරමක් ලොකුවට කපාගන්න. සුදුලූනු ටික චොප් කරගන්න.
- තම්බාගත් කුකුල් මස්වල කටු ඉවත් කර කැබලි සිටින සේ කපාගන්න.
- චීස් කැබලි දෙක කිරි කෝප්පයකට දමා හොඳින් කලවම් කරගන්න.
- ඔලිව් තෙල් ටික භාජනයකට දමා රත්වනවිට තම්බාගත් කුකුල් මස්, චොප් කරගත් සුදුලූනු සහ බී ලූනුද ඊට එකතු කරගන්න. එය හොඳින් බැදීගෙන එනවිට ඒ මතට තම්බාගත් පැස්ටා ටික දමා හොඳින් කලවම් කරගන්න.
- එයට ගම්මිරිස් කුඩු, කපාගත් ලීක්ස් සහ හර්බ්ස් ටිකත් එක්කර කලවම් කර අවශ්‍ය පමණ ලුණු එක්කරගන්න.
- දැන් චීස් දමා කලවම් කරගත් කිරි ටික එම මිශ්‍රණයට දමා හොඳින් කලවම් කර ලිපෙන් බාගන්න.
- මෙය පිළිගැන්වීමට පෙර මික්ස් හර්බ්ස් තේ හැඳි 2ක් උඩින් ඉසගන්න.



ඩබ්ලිව්. එම්. ආර්. ඉදුනිල් වීරසේකර
ආපනශාලා ප්‍රධාන සූපවේදී
ආගමන විගමන දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල

තාත්තා ගැන මෙච්චර දේවල් කියන එකේ අම්මා ගැන නොකිව්වොත් අම්මා තරහවෙයි නේද?

මගේ අම්මා තමයි ලෝකේ හොඳම අම්මා. ඒක මං හැමදාම කියන කතාවක්. මං පොඩි කාලේ ඉඳන්ම හිතුවේ ලොකුවෙලා මගේ අම්මා වගේ වෙනවා කියලා. මොකද එයා පොතක් වගේ. එයාගෙන් ඉගෙනගන්න ගොඩාක් දේවල් තියෙනවා. ඒ නිසා එදා වගේම අදත් මං හිතනවා කවදහරි මං මගේ අම්මා වගේ කෙනෙක් වෙනවා කියලා.

තාත්තා ක්‍රිකට් ගහන කාලේ මැච් ඉවරවුණාම අම්මා එයාගේ හිත හදනවා කියන්නේ ඇත්තද?

මගේ අම්මා හිතන විදිය හරි වෙනස්. නිකන් හිතන්න තාත්තා ලකුණු 90ක් ගහලා තියෙද්දි ශතකය පෙනී පෙනී අවුට් වුණා කියලා. ඒතකොට කොහොමත් තාත්තා දුක් වෙනවනේ. අන්න ඒ වගේ වෙලාවට මැච් එක ඉවරවුණාම අම්මා කියනවා ගහන්න බැරිවුණු ලකුණු 10 නෙවෙයි ගහපු ලකුණු 90 ගැන හිතන්න කියලා.

දෙමව්පියන් ප්‍රසිද්ධ වෙනකොට දරුවොත් ඒ ප්‍රසිද්ධිය ලබාගන්න උත්සාහ කරනවා. ඒත් සචින්දි එතැන නැත්තේ ඇයි?

ඇත්තටම මට තිබුණා මං සනත් ජයසූරියගේ දුව කියලා හැමතැනම කිය කියා ප්‍රසිද්ධ වෙන්න. ඒත් මං එහෙම කළේ නෑ. එහෙම කරන්නෙත් නෑ. මගේ තාත්තා මාව තැනකට ගෙනැත් තියෙනවා. දැන් මං එතැන ඉඳන් මගේ මහන්සියෙන් ඉහළට යන්න ඕනේ. මං තනියෙන් දෙයක් කරලා මිසක් තාත්තාගේ නමින් ලකුණු දගන්න කැමති නෑ.

මේ වෙනකොට සචින්දිට තාත්තා දීලා තියෙන ලොකුම තෑග්ග මොකක්ද?

මගේ 17 වැනි උපන්දිනේ දවසේ එයා මට අමතක නොවෙන තෑග්ගක් දුන්නා. මං ගොඩාක් ජුවලරිස්වලට ආසයි. දවසක් මං ජුවලරි ශොප් එක්කට ගිහින් මුද්දක් බැලුවා. ඒත් ඉතින් ගත්තේ නෑ තියලා ආවා. මොකද මගේ අතේ සල්ලි නෑනේ. පස්සේ දවසක තාත්තා ඒ ජුවලරි ශොප් එකට ගියාම එතැන වැඩ කරන කෙනෙක් එයාට කියලා දුව ඇවිත් මුද්දක් බලලා ගියා කියලා. ඉතින් තාත්තා ඒක අරන් මගේ උපන්දිනේ දවසේ මට තෑග්ගක් විදියට දුන්නා. ඒක මට හරියට දැනුණා.

තරුණියක් විදියට තාත්තා ඔයාට දීලා තියෙන නිදහස කොයි වගේද?

ඇත්තටම එයා මාව හිරකරගෙන තියාගෙන නෑ. මට නිදහසේ ඉන්න පුළුවන් විදියට තාත්තා නිදහස දීලා තියෙනවා. මොකද එයා දන්නවා මං ඒ නිදහස වැරදියට පාවිච්චි කරන්නේ නෑ කියලා. හැබැයි ඉතින් අදටත් මං කොහේ ගියත් මොන වැඩේ කළත් මුලින්ම එයාගෙන් අහනවා.

නිදහසක් ලැබුණු වෙලාවට තාත්තා හිටපු පරණ ක්‍රිකට් මැච් එහෙම සචින්දි බලන්නේ නැද්ද?

(සිනාසෙමින්) මොකද නැත්තේ? නිදහසක් ලැබුණු ගමන් වැඩිපුරම කරන්නේ ඒක තමයි. කොච්චර බැලුවත් එපා වෙන්නේ නෑ. පහුගිය ටිකේ තිබුණු තාත්තා හිටපු ලෙජන්ඩ් මැච් එහෙම මං හරිම ආසාවෙන් බැලුවා. ටිකක් වයසට ගියත් ලෙජන්ඩ් මැච්වල තාත්තා මට ඉස්සර වගේම පෙනුණා. එයාගේ ඇඟේ තාමත් ක්‍රිකට් තියෙනවා.

එතකොට තාත්තා නැති දැන් යන ක්‍රිකට් මැච් එහෙම බලනවද?

ඔව් ඔව් මැච් නම් මගඅරින්නේ නැතුවම බලනවා. මොකද මං ක්‍රිකට්වලට ගොඩක් ආසයි. එහෙම බලද්දි ඉතින් තාත්තත් හිටියා නම් කියලා හිතෙන වෙලාවලුත් තියෙනවා.

තාත්තා ඇරුණාම ඔයා ආසම ක්‍රිකට් ක්‍රීඩකයා කවුද?

ලංකාවේ අයගෙන් මං තිසර පෙරේරාට ආසයි. මොකද එයත් අපේ තාත්තා වගේ අත දිගැරලා බෝලෙට ගහන කෙනෙක්. ඒ නිසා තිසර අයියා ගහනවා බලන්න ආසයි. පිටරට අයගෙන් නම් ආස ඉන්දියාවේ හාර්දික් පාන්ඩ්‍යාට තමයි.

ඔයාට ක්‍රිකට් ගහන්න බෑ කිව්වනේ. එතකොට සනත් ජයසූරිගේ වැඩිමල් දියණිය විදියට ඔයාගේ අනාගත බලාපොරොත්තුව මොකක්ද?

මේ වෙනකොට මං ඔස්ට්‍රේලියාවේ විශ්වවිද්‍යාලයක සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ උසස් අධ්‍යාපනය හදාරනවා. දැන් ගෙවෙන්නේ දෙවැනි අවුරුද්ද. ඒ පැත්තෙන් ඉදිරියට යන්න ආසාවකුත් තියෙනවා. හැබැයි මට පුංචි කාලේ ඉඳන් ආසාවක් තිබුණා පුංචි ළමයින්ට උගන්වන්න. ඒ නිසා මෙහෙම ඉඳලා ජාත්‍යන්තර පාසල් ප්‍රාථමික ගුරුවරියක් වෙන්න බැරිකමකුත් නෑ.

■ රුවන් එස්. සෙනවිරත්න

තාත්තා ක්‍රිකට්වලට සමුදෙන දවසේ දුක හිතුණේ නැද්ද?

ඇත්තටම මට දුක හිතුණා. එදා ඇඬුනේ නෑ කිව්වොත් ඒක බොරුවක්. ඇඬුවා නෙවෙයි ඇඬුනා. ඒ එක්දින තරඟය බලන්න මං ග්‍රවුන්ඩ් එකට ගිහින් හිටියේ. තාත්තට ලොකු ආසාවක් තිබුණා එදා මැච් එකේ අමතක නොවෙන දෙයක් කරලා ක්‍රිකට්වලට සමුදෙන්න. ඒත් ඉක්මණට අවුට් වුණා. තාත්තා ආයෙත් ක්‍රීඩාගාරයට යනකොට බලාගෙන හිටපු අය එකදිගට අත්පුඩි ගැහුවා. ඒක මට හරිම සංවේදී මොහොතක් වුණා.

තාත්තා ක්‍රිකට්වලට සමුදීලා ගෙදර ඇවිත් ඇඬුවද?

මං හිතන්නේ එයා ටිකක් දුකින් හිටියේ අන්තිම තරඟේ ලොකු දෙයක් කරන්න බැරිවුණු එක ගැන. ඒත් ඉතින් එයාට දුක් වෙන්න දෙයක් තිබුණේ නෑ. මොකද ඒ වෙනකොට තාත්තගේ නම ඉස්සරහින් ටෙස්ට් තරඟ 110කදී ලකුණු 6973ක් වගේම කඩුලු 98ක් තිබුණා. එක්දින තරඟ 445කදී ලකුණු 13430ක් ගහලා කඩුලු 323ක් තිබුණා.

දැන් එතකොට සචින්දිට ක්‍රිකට් ගහන්න බැරිද?

එක දවසක් තාත්තා මාව ක්‍රිකට් ඇකඩමියකට එක්ක ගිහින් ක්‍රිකට් ගහන්න පුහුණු කෙරෙව්වා. අම්මෝ එදා හවස ඇඟට පුදුම අමාරුයි. ඒ නිසා එතැනින්ම ක්‍රිකට් ගහන එක නැවැත්තුවා. හැබැයි මල්ලි නම් මේ වෙනකොට ක්‍රිකට් ගහනවා. මං හිතනවා සනත් ජයසූරිය කියන ක්‍රීඩකයා නතර කරපු තැනින් මල්ලි ආයෙත් ක්‍රිකට් පිටියේ පෙරළියක් කරයි කියලා.

ක්‍රිකට් පිටියෙදි සනත් ජයසූරිය කියන්නේ කවුද කියලා හැමෝම දන්නවා. එයා ඔයා ළඟදි කොයි වගේද?

මං පුංචි කාලේ නම් තාත්තා ටිකක් විතර සැරයි. මං ගුටිත් කාලා තියෙනවා. හැබැයි දැන් නම් එහෙම නෑ. දැන් තාත්තයි මමයි

යාළුවෝ වගේ ඉන්නේ. එයා මට ගොඩාක් ආදරෙයි. ඒත් ඉතින් හිටපු ගමන් අදටත් බණින වෙලාවල් තියෙනවා.

සචින්දිට හිතෙන විදියට තාත්තා වැඩිපුරම සතුටින් හිටපු දවස කවදද?

මං හිතන්නේ එයා 1996 එක්දින ලෝක කුසලානය දිනුව දවසේ වැඩිපුරම සතුටු වෙන්න ඇති. හැබැයි එයා මෑතකදි නම් ගොඩක් සතුටුවුණේ මං මගේ පළවැනි පඩියෙන් එයාට තෑග්ගක් අරන් දුන්නු දවසේ. එදා එයා සෑහෙන සතුටකින් හිටියේ. මං ඒක එයාගේ මූණෙන් දැක්කා.

***සචින්දි වැඩිපුරම කැමති ඔයා සනත් ජයසූරියගේ දුව කියන්නද? එහෙම නැත්නම් ඔයාගේ තාත්තා සනත් ජයසූරිය කියන්නද?**

ඔය දෙකටම වඩා මං ආසයි මගේ තාත්තගේ කටින් 'මං සචින්දි ජයසූරියගේ තාත්තා' කියනවා අහන්න. හැබැයි ඒ දැන් නෙවෙයි. මං තැනකට ඇවිත් දෙයක් කරලා පෙන්නුවට පස්සේ. මොකද මට ලොකු ආසාවක් තියෙනවා ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය පැත්තෙන් ලොකු දෙයක් කරන්න.

96’ වර්ල්ඩ් කප් එක දිනපු දවසට වඩා

මගේ පළවැනි පඩියෙන් තෑගක් දීපු දවසෙ තාත්තා සතුටු වුණා

සනත් ජයසූරියගේ වැඩිමල් දියණිය
සවින්දි ජයසූරිය

ඒ 2000 ඔක්තෝබර් 29 වැනිදාය. එදා එක්සත් අරාබි එමීරහි ෂාජා පිටියට දහස් ගණනක් වූ ක්‍රිකට් ප්‍රේක්ෂකයින් පැමිණ තිබුණේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති එක්දින තරඟය නැරඹීමටයි. ශ්‍රී ලංකාව මුලින්ම පන්දුවට පහරදුන් එකී තරඟයේ සුපුරුදු පරිදි ඉනිම ඇරඹුවේ සනත් ජයසූරිය සමඟින් රොමේෂ් කළුවිතාරණය. නමුත් ජයසූරිය පිටියේ තනිකරමින් මුල්පෙළ කඩුලු එක පිට එක බිඳවැටුණේ කිසිවෙකුත් නොසිතූ පරිද්දෙනි. එහෙමයි කියා ක්‍රිකට් පිටියේ ලෝක පූජිත ‘මාස්ටර් බ්ලාස්ටර්’ සැලුනේ නැත. එතැන් පටන් ක්‍රියාත්මක වූ ජයසූරිය, අනාථ වෙන්නට ගිය ශ්‍රී ලංකා ඉනිම පන්දුවාර 50 අවසානයේ ලකුණු 299ක් දක්වා ඔසවා තැබීය. එහිදී ජයසූරිය පන්දු 161කින් ලකුණු 189ක් ලබාගත්තේ හතරේ පහර 21ක් සහ යෝධ හයේ පහර 4ක්ද සමඟිනි. අවසානයේ තරඟයේ ජය ශ්‍රී ලංකාවට හිමිවූ අතර තරඟයේ වීරයා සම්මානයෙන් ජයසූරිය පිදුම් ලැබීය. අදටත් ඔහුගේ එම ඉනිම සැලකෙන්නේ එක්දින තරඟ ඉතිහාසයේ ශ්‍රී ලංකා ක්‍රීඩකයෙකු ලබාගත් ඉහළම ලකුණු සංඛ්‍යාව ලෙසිනි. නමුත් අද අපේ කතාබහ මේ ක්‍රිකට් වීරයාගේ වැඩිමල් දියණිය සවින්දි ජයසූරිය සමඟිනි. පියාගේ අඩිපාරේ නොගියද ඇයට තම පියා ගැන කියන්නට කතා බොහෝය. ඉතින් මේ මුල්වරට ඇය සනත් ජයසූරිය ගැන ඔස්ට්‍රේලියාවේ සිට ‘ධරණී’ ට කී කතාවයි.

සුපිරි ක්‍රිකට් ක්‍රීඩක සනත් ජයසූරිය කියන්නේ ඔයාගේ තාත්තා. ඉතින් ක්‍රිකට්වලින් ලෝකයක් හොල්ලපු ක්‍රීඩකයෙකුගේ දුව වෙන්න ලැබුණු එක ගැන දැනෙන හැඟීම කොයි වගේද?

ඇත්තටම ඒ හැඟීම මෙහෙමයි කියලා කියාගන්න අදටත් මට තේරෙන්නේ නෑ. මොකද ලොකු පොඩි කවුරුත් මගේ තාත්තට ගොඩාක් ආදරෙයි. ඒ අය අදටත් මැච් එකක් යනකොට තාත්තා ගැන මතක් කරන බව මං දන්නවා. ඉතින් එහෙම පුද්ගලයෙකුගේ දුවක් වෙන්න ලැබුණු එක ගැන සතුටුයි වගේම නිහතමානී ආඩම්බරයකුත් තියෙනවා.

තාත්තා ක්‍රිකට් පිටියේ ලෝක ප්‍රසිද්ධ චරිතයක් කියලා දැනගනිද්දි සවින්දිගේ වයස කීයද?

මට දැන් වයස අවුරුදු විස්සයි. තාත්තා ක්‍රිකට් ගහනකොට මං හරි පුංචියි. ඒ නිසා මුලදි නම් තාත්තා ටීවී එකේ ක්‍රිකට් ගහනවා දැක්කත් මට ඒ හැටි තේරුමක් නෑ. හැබැයි තාත්තා පෙන්නන නිසා අවුරුදු හයේ විතර ඉඳන් මම මැච් යන දවසට ටීවී එක දිහා බලාගෙන ඉන්නවා. ටිකක් ලොකු වෙනකොට තමයි තේරුණේ තාත්තා ක්‍රිකට් පිටියේ ලෝක ප්‍රසිද්ධ චරිතයක් කියලා.

තාත්තා සනත් ජයසූරිය හින්ද ඔයත් ඒ කාලේ හරි ආඩම්බරෙන් හිටියා කියන්නේ ඇත්තද?

(සිනාසෙමින්) ඒක ආඩම්බරයක් කියන්න බෑ. ඒත් ලොකු සතුටක් තිබුණා. මට මතකයි මං ඉස්කෝලේ දන්න තාත්තා මගෙත් එක්ක ඉස්කෝලෙට යනවා. ඒ වෙලාවට ඉස්කෝලේ ළමයි තාත්තා දැකලා පිස්සුවෙන් වගේ එයාගේ අත්සන ගන්න පොරකනවා. ඒ වෙලාවට නම් පොඩි ආඩම්බරයක් දැනිලා තියනවා ළමයි මේ පොරකන්නේ මගේ තාත්තට තියෙන කැමැත්ත හින්දනේ කියලා.

දැන් එතකොට පුංචි කාලේ ගෙදරදි තාත්තා එක්ක ක්‍රිකට් ගහලා නැද්ද?

අම්මෝ මං පුංචි කාලේ තාත්තා මගෙත් එක්ක ඕනතරම් ක්‍රිකට් ගහලා තියෙනවා. ගෙවල් ඉස්සරහා පාරට ගිහින් තමයි ගහන්නේ. මොකද ගෙදර මිදුලේ ගැහුවොත් අම්මා පොඩ්ඩක් සද්ද දනවා. ඒ නිසා එයා මමත් එක්ක ගෙවල් ඉස්සරහා පාරට ගිහින් රෑ වෙනකල් ක්‍රිකට් ගහනවා.

තාත්තා ජාතික කණ්ඩායමේ ක්‍රීඩා කරද්දි සවින්දිත් අම්මලා එක්ක එයාගේ මැච් බලන්න එහෙම ගියාද?

මට ක්‍රිකට් ගැන දැනුම් තේරුම් එනකොට මං ක්‍රිකට්වලට උනන්දු වුණා. ඒ නිසා මැච් බලන්න ආසයි. ඉතින් මං තාත්තා සෙල්ලම් කරන මැච් බලන්න අම්මලත් එක්ක ගියා. ලංකාවේ විතරක් නෙවෙයි පිටරට මැච් බලන්නත් ගිහින් තියෙනවා.

ඉතින් ඔයා ඉස්සරහම තාත්තා හයේ හතරේ ඒවා ගහද්දි මොනවද හිතුණේ?

(සිනාසෙමින්) ඒ හැඟීම මට කියාගන්න තේරෙන්නේ නෑ. පුදුම සතුටක් තිබුණේ මට. ඉතින් කෑ ගහලා උඩපැනලා තමයි මං නවතින්නේ. තාත්තා බැට් කරන විදියට මං ආසයි. ඒකේ අමුතු ලස්සනක් තියෙනවා. එයා දිගට හරහට හයේ හතරේ ඒවා ගහද්දී ඒ ලස්සන ඩබල් වෙනවා. තාත්තගේ විශේෂත්වය තමයි එයා බෝලෙන් බෝලෙට කරන දේ හිතාගන්න බෑ.

මං පුංචි කාලේ නම් තාත්තා ටිකක් විතර සැරයි. දැන් නම් එහෙම නෑ. දැන් තාත්තයි මමයි යාළුවෝ වගේ ඉන්නේ

චක්දහස් නවසිය හැත්තෑවෙදි යුරෝපා රටවල් 24ක් එකතුවෙලා 'අර්ත් ඩේ නෙට්වර්ක්' කියලා පාරිසරික සංවිධානයක් හැදුවා. එදා ඉඳලා අද වෙනකල් පරිසරය වෙනුවෙන් වැඩකටයුතු රාශියක් ඉටුකරාපු මේ සංවිධානය අද රටවල් 192ක් නියෝජනය කරන ලොකයේ ලොකුම පාරිසරික සංවිධානයක්. අප්‍රේල් 22 වැනිදා ලෝක මිහිකත දිනය විදියට නම් කළෙත්, ඒ දිනය නිල වශයෙන් සමරන්නෙත් මේ සංවිධානයයි.

මේ සංවිධානයේ රාජ්‍ය තානාපතිවරු විදියට වැඩ කරන්නේ පරිසරය වෙනුවෙන් යමක්කමක් කරාපු ප්‍රකට උදවියයි. සංවිධානය වෙනුවෙන් ඇමරිකාව නියෝජනය කරන්නේ 'ටයිටැනික්' චිත්‍රපටයේ රඟපාපු නොම්මර එකේ නළුවා ලියනාඩෝ ඩිකැප්‍රියෝ. ඔහු රංගනයෙන් තමන්ට ලැබෙන ප්‍රසිද්ධිය සහ මුදල් වැඩිහරියක් පාරිසරික සහ සත්ව සුබසාධනය වෙනුවෙන් යොදවන හිත හොඳ මනුස්සයෙක්.

එතකොට කැනඩාව නියෝජනය කරන්නේ ඩේවිඩ් කැමරන්. 'ටයිටැනික්' සහ 'ඇවටර්' වගේ ලෝ ප්‍රකට චිත්‍රපටවල අධ්‍යක්ෂවරයා ඔහුයි. තව ඉන්දියාවේ තානාපතිවරු විදියට ප්‍රකට නිළි ජුහී චවුලා, අනිල් කපූර් වගේම මහින්ද්‍රා වාහන සමාගමේ හිමිකරු ආනන්ද් මහින්ද්‍රාවත් තෝරගෙන තියෙනවා.

මේ වගේ ගෝලීය සංගමයක තානාපති කෙනෙක් වෙන එක එහෙම ලේසි වැඩක් නෙමෙයි. සම්මත කරුණු කාරණා රාශියක්ම සලකා බලලයි ඔවුන්ව තෝරගන්නේ. හැබැයි 2020 ඉඳලා ඔය වගේ ලොකු ලොකු උදවිය එක්ක එකට එකතුවෙලා වැඩ කරන ලංකාවෙ තානාපති කෙනෙකුත් ඉන්නවා. ඇය තමයි මිශෙල් දිල්හාරා. රංගන ශිල්පිනියකට අමතරව සමාජ සුබසාධන වෙනුවෙන් පෙනී සිටින්නියක් විදියටත් ඇය ප්‍රකටයි. අපේ රටේ සුබසාධන වැඩවලට අමතරව දැන් ගෝලීය වශයෙන් ඇය වැඩ පටන් අරන්. ඒ කටයුතු ගැන කතා කරන ගමන් අද කවරය සරසන්න අපි ඇයට ආරාධනා කළා.

කාටත් එපා කියපු මළ මිනියක් නිසා මගේ ජීවිතේ වෙනස්වුණා

මිශෙල් දිල්හාරා

අර්ත් ඩේ නෙට්වර්ක් ලෝක පාරිසරික සංවිධානයේ ශ්‍රී ලාංකික තානාපති ජනප්‍රිය රංගන ශිල්පිනී

"අර්ත් ඩේ නෙට්වර්ක් එකට දකුණු ආසියාවෙන් තානාපතිවරුන් තෝරගත්තේ 2020 ඉඳලා. ඉතින් ලංකාවෙන් තේරුණු පළවැනි තානාපති මම. පහුගිය අවුරුදු කිහිපයේදි මම ලංකාවේ විශ්වවිද්‍යාල සහ පාසල් එක්ක එකතුවෙලා පාරිසරික සාක්ෂරතාවය සහ දේශගුණික වෙනස්වීම් ගැන ප්‍රොජෙක්ට් 200කට වඩා කළා. රුක් රෝපණ වැඩසටහන් රාශියකටත් සම්බන්ධ වුණා. ඉන්ටනැශනල් ෆ්ලැට්ෆෝම්වල ඒ ප්‍රොජෙක්ට්වලට අදළ ලිපි ලිව්වා. එව්වා කියවලා තමයි ඔවුන් මාව ලංකාවේ තානාපති විදියට තෝරගෙන තියෙන්නේ."

*මිශෙල් ඔය කිව්ව අනිත් තානාපතිවරු එක්ක පැවැත්තුව ගෝලීය සමුළුවලටත් සහභාගී වුණාලු නේද?

"ඔව් කොවිඩ් වසංගතය නිසා 2020 ඉඳලා අද දක්වාම සමුළු තිබ්බේ ඔන්ලයින් ක්‍රමේට. ඉතින් හැම තානාපතිවරයෙක්ම ඔන්ලයින් හරහා සමුළුවලට සම්බන්ධ වෙනවා. ඇත්තටම මම පරිසරය ගැන හිතන්න පටන්ගත්තෙම ලියනාඩෝ ඩිකැප්‍රියෝ නිසා. පරිසරවේදියෙක් විදියට ඔහු සෑහෙන ප්‍රසිද්ධයි. පරිසරය ගැන ඔහු කරපු කතා සහ ඩොකියුමන්ට්‍රීස් බලලා තමයි මමත් කැම්පස්වල ප්‍රොජෙක්ට්වලට සම්බන්ධ වුණේ. අන්තිමට මට ඔහු එක්කම වැඩ කරන්න අවස්ථාව ලැබුණා. ඒ ගැන ඇත්තටම මට සතුටුයි."

අර්ත් ඩේ නෙට්වර්ක් ගැන කතාවෙන් පස්සේ මම මිශෙල්ගේ කතාවේ මුලට ගියා. මිශෙල් කොහෙන්ද මේ ගමන පටන්ගත්තේ?

"මම මීගමුවේ. අම්මයි, තාත්තයි, මමයි, නංගිලා දෙන්නයි තමයි පවුලේ ඉන්නේ. පුංචි කාලේ ඉඳලා මට හීන දෙකක් තිබුණා. එකක් ගුරුවරියක් වෙන එක අනික රංගන ශිල්පිනියක්. මම ඉගෙනගත්තේ මීගමුව නිව්ස්ටෙඩ් බාලිකා පාසලෙන්. ඉස්කෝලෙ යන කාලෙදි මම හරිම පසුගාමී දරුවෙක්. කවදාවත් පංතියේ ඉස්සරහට ගිහිල්ලා කතා කරන්නේ නැහැ. කාත් එක්කවත් කතා කරන්නෙත් නැහැ. ඒ නිසා මට වැඩිය යාළුවෝ හිටියෙත් නැහැ."

ඔහොම ඉන්දැද්දි දවසක් මිශෙල්ගෙ හිතට වැදුනු විශේෂ සිදුවීමක් වුණාලු.

"එතකොට මට අවුරුදු 14යි. දවසක් මම තාත්තා එක්ක මගේ නෑදෑ කෙනෙක් බලන්න මීගමුව හොස්පිට්ල් එකට ගියා. හොස්පිට්ල් එක ඇතුළට යනකොට අපිට ලොකු සද්දයක් ඇහුණා. බලනකොට එතැන හිටපු දෙගොල්ලක් මිනියක් බෙදගන්න බැරුව රණ්ඩු වෙනවා. ඊට එහා පැත්තෙන් තව මිනියක් තිබුණා. ලෙඩාව බලලා අපි ආයෙ එනකොටත් අර තනිවෙලා තිබුණු මිනිය එතැන ඒ විදියටම තිබුණා. තව සතියකින් විතර ආයෙ අපි අර ඥාතියව බලන්න ගියා. එතකොට මම එතැන හිටපු නර්ස් කෙනෙක්ගෙන් අර මිනිය ගැන ඇහුවා. ඒ මිනිය භාරගන්න කවුරුත්ම ආවෙ නැතිලු. ඉතින් රජයේ විදමින් අවසාන කටයුතු කළාලු. මම වැඩිය කතාබහ නොකරන කෙනෙක් නිසා ජීවත්වුණාද කියලවත් නොදැන දවසක ඔහේ මැරිලා යන්න වෙයි කියන බයක් මට දැනුණා. ඒ වගේම කාත් කවුරුවත් නැති මෙහෙම අය වෙනුවෙන් මොනාමහරි කරනවා කියන එකත් එවෙලේ මම හිතාගත්තා."

ඔය සිදුවීමෙන් පස්සේ ඇය අනෝජා වීරසිංහ මහත්මියගේ පෞරුෂ වර්ධන වැඩසටහන්වලට සහභාගී වෙලා.

"අනෝජා මිස්ගෙන් පෞරුෂ සංවර්ධනය ගැන ඉගෙනගන්න ගමන් දමයන්ති ෆොන්සේකා මිස්ගෙනුයි රන්දික විමලසූරිය සර්ගෙනුයි රංගනය ගැන ඉගෙනගත්තා."

ඒ අතරේම ඇය සුබසාධන වැඩත් පටන්ගත්තලු.

ලියනාඩෝ ඩිකැප්‍රියෝ එක්ක වැඩ කරන්න ලැබුණු එක ගැන සතුටුයි

"අර සිද්ධියෙන් පස්සේ අනිත් අය වෙනුවෙන් මට කරන්න පුළුවන් මොනවද කියලා මම කල්පනා කළා. එතකොට මට අවුරුදු 15යි. ඉතින් මූල්‍යමය උදව් කරන්න සල්ලි නැහැනේ. ඒ නිසා මම ස්වේච්ඡාවෙන් ළමා නිවාසවල ඉංග්‍රීසි උගන්වන්න පටන්ගත්තා. අවුරුදු දෙකක් එහෙම ඉගැන්නුවා. ඒක මගේ ජීවිතේ අමතක නොවන කාලයක්."

අධ්‍යාපන කටයුතුවලින් පස්සේ මිශෙල් සුසිල ආයතනයේ තිර පරීක්ෂණයට සහභාගීවෙලා. 'පුංචි පත්තරකාරි' කියන ඇගේ මුල්ම චරිතය ඇයට ලැබිලා තියෙන්නේ එතැනදි.

"ඊටපස්සෙ 'සුදු ඇඳගෙන කළු ඇවිදින්' ටෙලිනාට්‍යයේ ප්‍රධාන චරිතයක් ලැබුණා. එහි රංගනය වෙනුවෙන් මට 'හොඳම නැගී එන නිළිය රයිගම් සම්මානය', 'හොඳම නැගී එන නිළිය සුමති සම්මානය' වගේම රාජ්‍ය සම්මානයකුත් ලැබුණා. 'ෆෝ ස්ට්‍රීට්' කියන නාට්‍ය වෙනුවෙන් 2021දී හොඳම සහාය නිළිය සම්මානය ලැබුණා. ඉතින් එදා ඉඳලා අද දක්වා සාර්ථකව රංගන කටයුතුත් කරගෙන යනවා."

රංගනයට අඩිය තියපු දවසේ ඉඳලා ලැබෙන ආදායමෙන් 60%ක මුදලක් සුබසාධන කටයුතුවලට වෙන් කරන්න තරම් කාරුණික හදවතක් ඇයට තියෙනවා.

"මම උගන්නපු ළමා නිවාසවල පුංචි ළමයි මාත් එක්ක හරි එකතුයි. වෙලාවකට එයාලා මගේ ෆෝන් එක අරගෙන ෆොටෝස් එහෙම බලනවා. දවසක් ෆෝන් එකේ සිනමන් ග්‍රෑන්ඩ් හොටලේ එකේ මම ගත්තු ෆොටෝස් වගයක් තිබුණා. අවුරුදු 7ක පුංචි බබෙක් ඒවා දැකලා එයාටත් එතැනට යන්න ආසයි කිව්වා. එයාලා හැමෝවම එතැනට එක්කරගෙන යනවා කියලා එවෙලේ මම හිතාගත්තා. පස්සේ අවුරුද්දක් විතර සල්ලි

ගෙවල්වල තනිකමෙන්, පාලුවෙන් ඉන්න වැඩිහිටියන්ට මේ තැනට ගිහිල්ලා සිංදුවක් අහලා, පොතක් කියවලා නැත්නම් ගේම් එකක් ගහලා යාළුවෝ එක්ක කතා කර කර සතුටින් ඉඳලා යන්න පුළුවන්. දැනට වැඩිහිටියෝ 300ක් විතර අපිත් එක්ක එකතුවෙලා ඉන්නවා.

චකතු කරලා ඒ අයව චිතැනට චික්කරගෙන ගියා. ඒක තමයි මගේ පළවැනි සුබසාධන ව්‍යාපෘතිය. එදා ඉඳලා අද වෙනකල් අඩු ආදායම්ලාභී පාසල්වලට උපකරණ දෙන ව්‍යාපෘතියක් කරගෙන යනවා. සහල් බෙදාදෙන ව්‍යාපෘතියකුත් කරනවා. පසුගිය ඔක්තෝබර් මාසෙදිත් මීගමුව ප්‍රදේශයේ පවුල්වලට සහල් ටොන් දෙකක් බෙදලා දුන්නා."

සුබසාධන වැඩ වෙනුවෙන් ඇයට ජාතික වගේම ජාත්‍යන්තර වශයෙනුත් සම්මාන ලැබිලා තියෙනවා.

"දරුවන් වෙනුවෙන් කරන සුබසාධන වැඩ වෙනුවෙන් 2018දී මට දකුණු ආසියානු තරුණ සමුළුවෙන් 'ඒෂියා ඉන්ස්පිරේෂන් සම්මානය ලැබුණා. ඔය සම්මානය ලැබුණට පස්සේ ආසියානු තරුණ සමුළුව එක්ක එකතුවෙලා රිසර්ච් එකක් කරලා පොතක් ලිව්වා. ඒ පොත එළිදැක්වුවේ ඉන්දියාවෙදි. 2019 දී ලෝක තරුණ සමුළුවෙන් මේ පොත වෙනුවෙන් සම්මානයක් ලැබුණා. ඒ වගේම එතනදි 'නැෂනල් යූත් සම්මානයත් මට ලැබුණා."

ඇයට ලැබුණු ජාත්‍යන්තර සම්මාන ගැන කතා කරද්දි මට හිතුණේ ජාත්‍යන්තර වශයෙන් ඇය මේ තරම් ඇගයීමට ලක්වුවත් ඇගේ වැඩපිළිවෙල වෙනුවෙන් අපේ රටේ උදවියගෙන් ලැබෙන ඇගයීම් මදි කියන එකයි.

"අර මම පොතක් ලිව්වා කිව්වනේ. 'සමාජ අදෘශ්‍යමානතාවය' නැත්නම් සමාජයේ අවධානයට ලක්නොවන පිරිස ගැන තමයි මම ලිව්වේ. ලෝක ප්‍රකට 'Amazon' ආයතනය හරහා තමයි ඒ පොත පබ්ලිෂ් කළේ. ඔවුන් හරහා පොත පබ්ලිෂ් කරගන්නත් මම සෑහෙන මහන්සි වුණා. දැන් මගේ පොත රටවල් 26ක විතර අන්තර්ජාල බුක්ෂොප්වල තියෙනවා. චිතැනින් මට ලැබෙන ආදායමෙනුත් මම ලොකු වැඩක් පටන්ගත්තා. 2020දී මම වැඩිහිටි ප්‍රජා මධ්‍යස්ථානයක් ආරම්භ කළා. මේක තියෙන්නේ දිවුලපිටියේ. ගෙවල්වල තනිකමෙන්, පාලුවෙන් ඉන්න වැඩිහිටියන්ට මේ තැනට ගිහිල්ලා සිංදුවක් අහලා, පොතක් කියවලා නැත්නම් ගේම් එකක් ගහලා යාළුවෝ එක්ක කතා කර කර සතුටින් ඉඳලා යන්න පුළුවන්. දැනට වැඩිහිටියෝ 300ක් විතර අපිත් එක්ක එකතුවෙලා ඉන්නවා. උදේ 8 ඉඳලා 5 වෙනකල් මධ්‍යස්ථානය ඕපන් කරලා තියෙනවා. ඔවුන් වෙනුවෙන් ඒ හැමදේම කරන්නේ නොමිලේ."

ඒ කටයුත්ත ගැන ඇය කතා කළේ බොහොම සතුටින්. තමන් ගැන හිතනවටත් වඩා අනිත් මිනිස්සු ගැන හිතන මෙහෙම තරුණ උදවිය ඉන්නවා කියලා හිතද්දි අපිටත් දැනුණේ සතුටක්. අවසාන වශයෙන් ඇය මේ මෑතකදී සහභාගී වුණ ICSE 4 සමුළුව ගැනත් අපි ඇගෙන් ඇහුවා.

"අර්ත් ඩේ නෙට්වර්ක් සංගමයේ නියෝජිතයෙක් විදියට පසුගිය සැප්තැම්බර් මාසේ ICSE 4 කියන සමුළුවට මම සහභාගී වුණා. UN, යුනෙස්කෝ, යුනිසෙෆ්, WWF වගේ ගෝලීය සංගම් ඇතුළු රටවල් 50ක නියෝජිතයෝ ඒකට සහභාගී වුණා. ඉතින් එතැනදි 'පරිසර සාක්ෂරතාවය සහ තිරසාර අධ්‍යයනය' කියන මාතෘකාව යටතේ මටත් කතා කරන්න ලැබුණා. ඉස්සර පංතියේ ඉස්සරහට ගිහිල්ලා කතාවක් කරන්න බයෙන් හිටපු මම එහෙම ලෝකයක් ඉස්සරහා කතා කළා කියලා දැනෙද්දි මට මං ගැනම ආඩම්බරයි."

ඔය අතරේ මිශෙල් පවුලේ අයගෙන් ඇයට ලැබෙන සහාය ගැනත් මතක් කළා.

"ලස්සන, කැත, දුප්පත්, පෝසත් කියලා මේ ලෝකේ මිනිස්සු කොටස්වලට වෙන්වෙලා. ඉතින් නිතරම කැපිලා පේන්නේ ලස්සන, සල්ලි තියෙන අය විතරයි. ඔය අතරේ අපිට නොපෙනෙන අපේ උදව් අවශ්‍ය පිරිසකුත් ඉන්නවා. ඒ අයව කාටවත් පේන්නේ නැහැ. විශේෂයෙන් වැඩිහිටි උදවිය. පවුලේ වුණත් වයසට ගියහම අම්මා, තාත්තාට අපිව කොච්චර ඕනද කියන එක අපි හිතන්නේ නැහැනේ. මොකද අපි හැමෝම ඉන්නේ ලොකු රේස් එකක.

ඉතින් ටිකක් රේස් එකෙන් නැවතෙන්න. වටපිට බලන්න. අපෙන් උදව් බලාගෙන මිනිස්සු ඕනතරම් ඉන්නවා. තමන්ගේ ජීවිතේ ගැන හිතන ගමන් ඒ අය වෙනුවෙනුත් පුංචිවට හරි දෙයක් කරන්න බලන්න. එතකොට මේ සමාජය ලස්සන වෙයි. ඉතින් මේ අලුත් අවුරුද්දේ ඉඳලවත් එහෙම සමාජයක් බිහිවේවා කියන එකයි මගේ ප්‍රාර්ථනාව."

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**

ඡායාරූප - මධුසංක සිරිවර්ධන
හැඩගැන්වීම - ශිරෝමා ෆොන්සේකා
පසුතලය - විඡුවල් විලේජ්, ජාඇල

කොරෝනා කාලේ ටීචර් ළඟ නෑ කියලා ඇඬුවට මට සම්මානයක් ලැබුණා

සදුෂි සවින්ද්‍යා අමුකොටුව

ටීචර් ළඟ නෑ කියා ඇඬූ අපි
ඉන්නේ දැන් හරි සන්තොසින්...
ඔන්ලයින් ගැන බැණපු අපි දැන්
ටීචර් බලනවා රිසි ලෙසින්...
පාඩමට දැන් අපත් හිත දී
හොඳින් කරනවා අපි තුටින්...
සිග්නලුත් නෑ කියා ඇඬූ අපි
හොයාගන්නවා ඇවිදිමින්...

අපිට මේ ගීතය ඇහෙන්න ගත්තේ පහුගිය කොරෝනා කාලේ. කොරෝනා නිසා පාසල් වැහිලා අධ්‍යාපන කටයුතු ඔන්ලයින් ක්‍රමයට සිදුවෙන විදිය ගැනයි ගීතය පුරාම කියැවෙන්නේ. ගීතය ගායනා කරන්නේ පුංචි දැරියක් හින්දම පාසල් දරු දැරියන් අතර මේ ගීතය බොහොම ජනප්‍රිය වුණා. මේ පුංචි ගායිකාව තමයි සදුෂි සවින්ද්‍යා අමුකොටුව. තාමත් වයස අවුරුදු 12යි. හැබැයි ලොකු පොඩි කොයි කාටත් කොරෝනා වසංගතය පිළිලයක් වෙද්දි ඒක වෙස් වළාගත් ආශීර්වාදයක් කරගන්න මේ පුංචි කෙල්ල සමත්වුණා. අන්න ඒ නිසාම 'ධරණී' අපිත් සදුෂි දූට කතා කරන්න හිතුවා.

සදුෂි දූ කොරෝනා කාලේ ටීචර් ළඟ නෑ කියලා ඇඬුවා කියන්නේ ඇත්තද?

ඔව් ඔව් කොරෝනා කාලේ අපට ඉස්කෝලේ තිබුණේ නෑනේ. මං එතකොට පහේ පන්තියේ. ඔන්ලයින් තමයි හැමදේම ඉගැන්නුවේ. ඒකට මගේ වැඩි ආසාවක් තිබුණේ නෑ. ඉතින් ඔන්ලයින් අධ්‍යාපන රටාවට කොටුවෙලා ගෙවපු ජීවිතේ ගැන 'ටීචර් ළඟ නෑ කියා හැඬූ අපි' කියලා ගීතයක් කළා. ඒක මට ලියලා දුන්නේ අයෝමා සඳමාලි ටීචර්. සංගීතවත් කළේ මල්ක මල්ලව සර්. ඒ ගීතයට ගොඩාක් හොඳ ප්‍රතිචාර ලැබුණා.

ඒ කියන්නේ දැන් දුවගේ ඉස්කෝලේ එහෙම සදුෂි හරි ජනප්‍රිය ඇති නේද?

ගොඩාක් අය දැන් මාව දන්නවා. විදුහල්පතිතුමා, ගුරුවරු, මගේ යාළුවෝ මාව හැමවෙලේම දිරිමත් කරනවා. මං මුලින් ඉගෙනගත්තේ දංකොටුව කටුකෙන්ද මිහිදු ප්‍රාථමික පාසලේ. ඒ පාසලේදි තමයි මට මුලින්ම මගේ හැකියාවන් ඉදිරිපත් කරන්න ඉඩ ලැබුණේ. ප්‍රධාන ශිෂ්‍ය නායිකාවක් වෙලත් හිටියා. දැන් මං ඉගෙනගන්නේ කටුකෙන්ද ශ්‍රී සංඝබෝධි ජාතික පාසලේ. ඉතින් පාසලෙන් මගේ ගමනට ලොකු සහායක් ලැබෙනවා.

***සදුෂි ඒ ගීතයෙන් පස්සෙත් ගීත කීපයක්ම කරලා තිබුණා නේද?**

ඔව් ඒ ගීතයට පස්සේ 'රෑනේ රෑනේ' කියලා ගීතයක් කළා. ඊටපස්සේ 'ගුරු උපහාර' ගීතයක් කළා. ඒ හැම ගීතයක්ම ලිව්වේ අයෝමා සඳමාලි ටීචර්. මුල් ගීත දෙක සංගීතවත් කළේ මල්ක මල්ලව සර්. ගුරු උපහාර ගීතය සංගීතවත් කළේ තාරක සර්. අලුත් අවුරුද්දේ 'විහඟුන් ඉගිළී අහස් ගැබේ' කියන මගේ අලුත්ම ගීතය එළිදක්වන්නත් සූදානමින් ඉන්නවා.

අපි දැක්කා දැන් ටික දවසකට උඩදි දුවට සම්මානයක් ලැබෙනවා?

මෙවර 'Future Leader 2022' සම්මාන උළෙලේ මට සම්මානයක් ලැබුණා. මං සම්මානයට නිර්දේශ වෙලා තිබුණේ 'ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත' කියන කතාව වෙනස් කරපු දරුවෙක් විදියට.



ඒ කියන්නේ සදුෂි දුව තව තව දේවල්වලට දක්ෂයිද?

මං ගොඩාක් දක්ෂ ගායනයට. ඒත් මට නටන්නත් පුළුවන්. මගේ අම්මා නැටුම් ටීචර් කෙනෙක්. ඉතින් එයා තමයි මට නැටුම් කියලා දෙන්නේ. ඒ වගේම වාදනයටත් මං ආසයි. ගොඩාක්ම වාදනය කරන්නේ වයලීන් එක. වයලීන් ගාන්ධර්ව විභාගය කරන්නත් ලෑස්තිවෙලා ඉන්නේ. ක්‍රීඩාවක් විදියට පාසලේදි චෙස් ක්‍රීඩා කරනවා. ඊට අමතරව ළමා නිවේදිකාවක් විදියටත් කටයුතු කරනවා. දැන් නම් රඟපාන්න වගේම චිළිමහන් සංගීත සංදර්ශනවලට එහෙමත් ආරාධනා ලැබෙනවා. මට හොඳට ලියන්නත් පුළුවන්. කොරෝනා කාලේ ඉස්කෝල ළමයින්ට රජයෙන් රටක් වටින පොතක් ලියන්න කියපු වෙලාවේ මං 'අප්පච්චි' කියලා කවි පොතක් ලිව්වා.

දැන් එතකොට මෙච්චර දේවල් කරද්දි දුවගේ අධ්‍යාපන කටයුතු එහෙම මගඇරෙන්නේ නැද්ද?

අනේ නෑ. ඒ හැමදේම මං සමබරව කරගෙන යනවා. ඒකට මට මගේ අම්මා, තාත්තා දෙන්නා ගොඩාක් උදව් කරනවා. ඒ දෙන්නම ගුරුවරු. එයාලා තමයි මාව ඉදිරියට අරන් යන්න ගොඩාක් මහන්සි වෙන්නේ.

දැන් එතකොට සදුෂි පුංචි දුවගේ අනාගත බලාපොරොත්තුව මොකක්ද?

මගේ අම්මත් නැටුම් ටීචර් කෙනෙක් හින්දා මමත් නැටුම් ටීචර් කෙනෙක් වෙන්න ආසයි.

එරින් නදීකා කතුරුසිංහ
(සදුෂි සවින්ද්‍යාගේ මව)

"මං අම්මෙක් විදියට වගේම ගුරුවරියක් විදියට හැමවෙලේම හිතන දෙයක් තමයි ඕනම දරුවෙක් අධ්‍යාපනයටම හිරකරලා තියන්න හොඳ නෑ කියන එක. එහෙම කළාම ඒ දරුවෝ යම්කිසි මානසික ආතතියකට පත්වෙනවා. ඒ නිසයි මං සඳුෂි දුවට බාහිර දේවල්වලට යන්න කැමැත්ත දුන්නේ. එහෙම ඉඩ දුන්නම එයා අධ්‍යාපන වැඩ ටිකත් වෙනදට වඩා හොඳට කරන්න පටන්ගත්තා. දැන් එයා හැම වාරෙම පන්තියේ මුල් ස්ථාන තුන අතර ඉන්නවා. මට දැන් හිතෙනවා මං ගත්ත තීරණය හරි කියලා."

■ **රුවන් එස්.සෙනවිරත්න**

අහල පහල නෝනලාට

පන්සලේ හාමුදුරුවෝ වගේ ළමයි ඉපදෙන්නේ කොහොමද?



ඇත්තටම ගර්භිණී මවක් ගැබිනි කාලයේදී දකින අහන දේවල්වලට අනුව කුසේ ඉන්න දරුවා හැඩගැහෙනවද? දරුවාගේ බාහිර පෙනුම අම්මා දකින දේවල්වලට අනුව හැඩගැහෙනවා කියන කතාව ඇත්තක්ද?

මේ ගැන සංවාදයක් ගොඩනගන්න අපි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අත්තනායක එම් හේරත් මහතාට කතා කළා.

"වෙනදා විදියටම මම ඔය කතාවත් මගේ වෘත්තීය ජීවිතයේ අත්දැකීමකින්ම පටන්ගන්නම්. හැබැයි මේ කතාව සමහර අවස්ථාවලදී මම කියලා තියෙනවා, සමහරුනම් අහලත් ඇති. ඒත් අද කතා කරන මාතෘකාවට හොඳටම අදාළ වෙන නිසා ඒකෙන්ම කතාව පටන්ගන්නම්.

මම විශ්වවිද්‍යාලයේ උගන්වපු කාලේ මට හොඳටම හිතවත් රූකඩ කලාව උගන්වපු මහාචාර්යවරයෙක් හිටියා. එතුමා රූකඩ කලාවට ඉතාමත් තදින් ඇලුම් කරපු නිසා ඔහුගේ නිවසේ පවා තැනින් තැන රූකඩ එල්ලලා හැඩ කරලා තිබුණා. ඔය අතරේ ඔහුගේ බිරිඳ ගැබ්ගත්තා. ඇගේ මුළු ගර්භිණී කාලය පුරාවටම ඇයට වැඩිපුරම දකින්න ලැබුණේ අර ගෙදර එල්ලලා තිබුණ රූකඩ. ඇය අතපත ගෑවේ ගේ පුරාම තිබුණ රූකඩ. ඒ වගේම ඇයට වැඩිපුරම අහන්න ලැබුණෙත් මහාචාර්යාගේ කටින් පිටවුණු රූකඩ කලාවට සම්බන්ධ දේවල්. ඔහොම කාලයක් ගිහිල්ලා එතුමාගේ බිරිඳ දරුවා බිහි කළා. ඒත් අපි කාටවත් හිතාගන්න බැරි විදියට ඇයට ඉපදුණේ තනිකරම රූකඩයක් වගේ දරුවෙක්.

ඒ දරුවගේ ඇතැම් අඟපසඟ, ඇරපු අතක් නෑ අර ගෙදර එල්ලලා තිබුණ එක රූකඩයක විදියටම තිබුණා. වයසින් වැඩෙනකොටවත් ඒ දරුවා කතාබහ කළේ හෝ ඇවිද්දේ නෑ. අන්තිමට අවුරුදු දහතරක් එක්තැන් වෙලා ඉඳලා දරුවා මියගියා. එතැනින් පස්සේ ඔහුගේ පවුල් ජීවිතය දෙදරලා ගිහිල්ලා හිතපු නැති විදියට මුළු ජීවිතේම කණපිට හැරුණා. ඔහු ගෙදර, විශ්වවිද්‍යාලයේ තිබුණු ඔහුගේ රූකඩ නිර්මාණ, ඊට සම්බන්ධ පොතපත පවා ප්‍රසිද්ධියේ පුච්චලා අළු කරලා දැම්මා. විශ්වවිද්‍යාලයේදී උගන්වපු රූකඩ කලාව අතෑරලා වෙනත් විෂයක් තෝරගත්තා.

ඔය සිද්ධියෙන් පස්සේ මටත් හිතුණා මේ ගැන ස්වයං අධ්‍යනයක් කරන්න ඕන කියලා. පස්සේ මම මගේ දුවයි, ලේලියි ගැබ් අරගෙන ඉන්නකොට මුළු ගේ පුරාම බෝඩ් ගැහුවා. මගේ දුවලා දෙන්නගෙම කුස තුළ ඉන්න මගේ මුනුපුරු මිනිපිරියෝ උගතුන් බුද්ධිමතුන් වේවා, තිසරණේ පිහිටෙන් ධාර්මික දරුවන් වේවා කියලා. නිදුක් වේවා, නිරෝගි වේවා, සුවපත් වේවා කියලා. ඒ වගේම මුළු ගේ පුරාම පන්සල් ගිහින් මල් පහන් පූජා කරලා බුදුන් වඳින, අම්මට තාත්තට වඳින පුංචි ළමයින්ගේ පින්තූර එල්ලුවා. ඒ අයගේ කාමරවල දවස පුරා ඇහෙන නෑහෙන ගානට බණ පිරිත් දාලා තිබ්බා. ඔබ විශ්වාස කරන්න අද වෙනකොට මගේ අවුරුදු තුනහමාරක පුංචි මිනිපිරියි, අවුරුදු පහක මුනුපුරයි ඒ පුංචි වයසට උදේ පාන්දර ඇඳෙන් බිමට බහින්නේ බුදුන් වඳින්න මල් කඩන්න බලාගෙන. අපිට කොයිතරම් වැඩ තිබුණත් හැමදෑම හවසට එයාලව මම පන්සලට එක්කගෙන යන්නම ඕනෙ. ඒ දෙන්නා පොඩිකමට වැඩිපුරම කැමති ළමා සාරියටයි, ජාතික ඇදුමටයි. ඒ නිසා අපි ඒ දෙන්නට ලස්සන හුරුබුහුටි ළමා සාරියකුයි, ජාතික ඇඳුමකුයි මහලා ගෙනැත් දීලා තියෙනවා පන්සල් ඇඳගෙන යන්න. ඇත්තටම මම මේ ගැන කිව්වේ මගේ දරු මුනුපුරාලා ගැන උදම් අනන්න නෙවෙයි. මගේ හිතවත් මහාචාර්යවරයාට වුණ සිදුවීම ඇතුළේ ඇත්තක් තියෙනවද කියලා බලන්න මම කරපු අත්හදබැලීම නිවැරදි බව ඔප්පු කරලා පෙන්නන්න.

මගේ මිතු මහාචාර්යවරයාට රූකඩයක් වගේ දරුවෙක් ඉපදුණාට පස්සේ මගේ දුවයි ලේලියි ගැබ්ගත් වෙලාවේ මං ඒ ක්‍රමය අත්හදා බැලුවා

අන්න ඒ නිසා කවුරුහරි කෙනෙක් මගෙන් අහනවා නම් දරුවෙක් ලැබෙන්න ඉන්න අම්මා කෙනෙක් දකින හොඳ නරක රූප, අහන හොඳ නරක වචන කුසේ ඉන්න දරුවාගේ පෙනුමට සහ මනා පෞරුෂයට බලපානවද කියලා මට දෙන්න තියෙන උත්තරේ නිසැකවම ඔව් කියන එක තමයි.

අද කාලේ අම්මලා දරුවෙක් කුසට ආපු හැටියෙම ඔය අන්තර්ජාලයෙන් හරි සතිපොළකට ගිහිල්ලා හරි සුදු හමක් තියෙන, නිල් පාට ඇස් දෙකක් තියෙන බබාලගෙ ෆොටෝ ටිකක් ගෙනැල්ලා කාමරේ පුරාම එල්ලගන්නවා. ඒ ඇරෙන්න කොයි අම්මද මල් දෝතක් අරගෙන පන්සල් යන, ලස්සන පුංචි ළමා සාරියක් ඇඳගෙන පන්සලක් අමදින, භාවනා කරන දුවෙකුගෙ

ගෞතම බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ ඉන්න කාලේ දවසක් ආනන්ද හාමුදුරුවෝ බැහැදකින්න ගියපු කොසොල් රජතුමා උන්වහන්සේගෙන් ඉල්ලීමක් කළාලු. ඒ තමයි රජතුමාගේ අන්තඃපුරේට වැඩම කරලා බණ ටිකක් දේශනා කරන්න කියලා. ඉල්ලීම පිළිගත්ත ආනන්ද හාමුදුරුවෝ අන්තඃපුරේට වැඩම කරලා බණ කියන්න පටන්ගත්තලු. ඔය අන්තඃපුරේ ඒ වෙනකොට වැඩිහරියක්ම ඉඳලා තියෙන්නේ ගැබ්බර බිසෝවරු කියලා තමයි බෞද්ධ පොත්පත්වල සඳහන් වෙන්නේ.

දරුවෙක් ලැබෙන්න ඉන්න අම්මා කෙනෙකුට බුදු බණ ටිකක් ඇහෙන එක මහා ඖෂධයක් වගේ දෙයක් කියලා කියනවනේ. ඒ නිසාම වෙන්න ඇති කොසොල් රජතුමාටත් තමන්ගේ ගැබ්බර බිරින්දෑවරුන්ට බණ ටිකක් අහන්න සැලස්සුවොත් හොඳයි කියලා හිතෙන්න ඇත්තේ. ඒ නිසා ආනන්ද හාමුදුරුවොත් වරින්වර ඔය අන්තඃපුරේට වැඩම කරලා ඔවුන් ගැන අනුකම්පාවෙන් ධර්මය දේශනා කරලා තියෙනවා. ඊටපස්සේ නිසි කාලය ආවම මේ බිසෝවරු සියලුදෙනා වරින්වර දරුවන් බිහිකරද්දී පුදුම වැඩේ කියන්නේ ඒ හැම දරුවෙක්ම ඇරපු අතක් නෑ ආනන්ද හාමුදුරුවෝ වගේමලු. අන්තිමට ඉවසලා ඉවසලා බැරිම තැන බුදු හාමුදුරුවෝ ළඟට ගියපු රජතුමා උන්වහන්සේ ඉස්සරහා ඉඳගෙන ආනන්ද හාමුදුරුවන්ට නොසෑහෙන්න දෙස් කියලා තියෙනවා. ඔහොම වින්නැහියක් වුණාම ඉතින් දෙස් නොකිව්වොත් තමයි පුදුමේ කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්.

නමුත් බොහෝම සාවධානව අහගෙන හිටපු බුදු රජාණන් වහන්සේ මෙහෙම වෙන්න හේතුවුණු කාරණාව ගැන කොසොල් රජතුමාට මෙන්න මෙහෙම පැහැදිලි කරලා දීලා තියනවා.

"මහරජ, කිසියම් මවක් දරුගැබක් කුස දරාගෙන සිටියදී ඇගේ දෙනෙත්වලට ප්‍රියමනාප රූප දකින්නේ නම්, කනට ප්‍රිය උපදන දෑ අසන්නේ නම් ඒ නිසා මනසේ මැවෙන චිත්ත රූපවලට අදාළව ඇයට ඊට සමාන වූ පින්වන්ත දරු උපතක් සිදුවෙයි. නමුත් මවක් ගර්භිණී කාලයේදී අහිමිරි වදන් අසමින්, අප්‍රසන්න රූප දකින්නේ නම් නිසැක වශයෙන්ම ඇයට ඒ ඇසූ සහ දුටු දේවල්වලට සමාන දරු උපතක් සිදුවෙනවා ඒකාන්තයි. ඔබගේ අන්තඃපුර බිසෝවරුන්ට සිදුවී ඇත්තේද මෙයමයි මහරජ. දරුවන් බිහිකරනතුරුම ඔවුන්ට දකින්නට ලැබුණේ පින්වත් ආනන්ද ස්වාමීන් වහන්සේගේ රුව. අහන්නට ලැබුණේ උන්වහන්සේගේ හඬින් දේශනා කරපු ධර්මය. ඔබේ බිසෝවරු උන්වහන්සේ දේශනා කරපු ධර්මය මෙනෙහි කරමින් කාලය ගත කරද්දී නිතර දුටු උන්වහන්සේගේ ප්‍රසන්න රුව සිහිවීම අරුමයක් නොවෙයි. ඒ නිසා ඔබේ රජ දරුවන්ට උන්වහන්සේගේ පින්වත් පෙනුම ලැබීමත් අරුමයක් නොවේ."

මුලින්ම ඔය කතාව ටිකක් මතක් කරලා හිටියේ අද අපි කතා කරන්න යන්නේ ගර්භිණී මවක් ඒ කාලයේදී ඇසිය යුතු හා දැකිය යුතු දේවල් මොනවාද කියන එක ගැන නිසා.

පුතෙකුගෙ, සිංහල අපේකම තියෙන දරුවෙකුගෙ ෆොටෝ එකක් බිත්තියෙ එල්ලගන්නෙ? සුදු බබාලගෙ ෆොටෝ ටිකක් එල්ලගෙන එලිනා, සෝෆියා, ජැක්ලිනා, රයන්, කෙවින් වගේ බටහිර පන්නෙ නම් ලිස්ට් එකකුත් ලියලා තියාගෙන උදේ හවස මන්තරේ වගේ ජප කර කර ඉන්නවා. දරුවො වුණාහම කොයි රටේ ඉපදුණත් මොන විදියේ නමක් තිබුණත් පුංචි එවුන් මල් වගේ තමයි. ඒත් ඉතින් මෙහෙම කරන එකේ විපාකයද මන්දෑ අද කාලේ ඉපදෙන හැම දරුවම යන්තමට හය හතර තේරීගෙන එනකොටම බලන්නෙ පිටරටකම පැනගන්න. උන් අම්මා අප්පා වැඩිහිටියන්ට ගරු කරන්න, සලකන්න දන්නේ නෑ. ගුරුවරයෙකුට වඳින්න උන්ගෙ කොන්ද හරියට නැවෙන්නෙ නෑ. හැබැයි ඒ කාලේ නම් විවාපත් යුවළක් මුලින්ම කළේ අනුරාධපුරේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟට හරි රුවන්වැලි මහා සෑය ළඟට හරි යන එක. ඒ මොකද දන්නවද? මේ මුළු ලෝකෙන්ම කාගේවත් කුසක පිළිසිඳගන්නෙ නැති ඉතාමත් පින්වන්ත ආත්ම සැරිසරන්නෙ අනුරාධපුරේ රුවන්වැලි මහා සෑය ළඟයි, ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟයි. ඒ නිසයි ඒ කාලේ බුද්ධිමත් මිනිස්සු විවාහ වුණ ගමන් වැඩිපුරම තමන්ගේ ඇස්වලින් ඒවගේ පින්වන්ත තැන් බලන්න ආවේ ගියේ. වැඩිපුරම ධර්මය ශ්‍රවණය කළේ.

ඇයි අර ගීතයෙනුත් 'සිරිමා බෝ ස්වාමිනි මට පිරිමි පුතෙක් දෙන්නයි' කියලා ඉල්ලනවා අහලා ඇති නේද? ඊළඟට අහලා තියෙනවද මෙන්න මෙහෙම ප්‍රසිද්ධ ගැමි කවියක් තියෙනවා.

'සත් සතියක් පේවී පේවී
තිසා වැවට යන්නයි
තිසා වැවෙන් දිය අරගෙන
බත් බැඳගෙන කන්නයි
එතැන පටන් පේවී පේවී
උඩමලුවට යන්නයි
උඩමලුවේ ස්වාමිනි මට
පුංචි දුවෙක් දෙන්නයි'

මේ කවියෙන් කියන්නේ විවාහ වුණ ගමන් වෙන කොහෙවත් යන්න කලින් මුලින්ම පේවිලා අනුරාධපුරේ වඳින්න යන යුවළක් ගැන. හැබැයි අද කාලේ නම් ඊට වඩා වෙනස්. දෙන්නා දෙමහල්ලෝ බඳින්න කලින්ම ගිවිසුම්ගත වෙනවා අපි දෙන්නා බැඳලා අවුරුදු 5ක් නැත්නම් 6ක් තනියම විනෝද වෙමු කියලා. එහෙමත් නැත්නම් අනුරාධපුරේ යන එක කෙසේ වෙතත් මඟුල් ඇඳුම පිටින්ම එයාපෝට් එකට දුවනවා හනිමූන් යන්න. දැන් මෙහෙම කියනකොට තරුණ දුවලා පුතාලා මට බනීවි එයාගේ කාලේ වගේ නෙවෙයි අද කාලේ වෙනස් කියලා. ඒත් කාලෙට ගැලපෙන්න ගිහින් කරගන්න විනාසෙ නිසා තමයි අද කාලේ අම්මා අප්පට කතා කරන්න දන්නෙ නැති එවුන් වැඩිහරියක් බිහිවෙලා තියෙන්නේ. ඔය අම්මලා තාත්තලා හොඳහැටි මතක තියාගන්න දරුවෝ හදන්න පටන්ගන්න ඕන කුසෙන් එළියට ආවට පස්සේ නෙවෙයි දරුවා කුසේ ඉන්නකොටයි. ඒ දරුවා කුසේ ඉන්නකොට අම්මා පින්වන්ත ඇස් දෙකට ප්‍රිය උපදවන රූප දකින්න ඕන. එතකොට තමයි දරුවගේ මනා පෞරුෂය ඒ විදියට කුස තුළදිම හැදෙන්නෙ. කනට ප්‍රිය උපදවන කතා අහන්න ඕනෙ. එතකොට තමයි කුසේ ඉන්න දරුවගේ මනා පෞරුෂයට ගුණගරුක බව සහ හැදියාව කියන එක එකතුවෙන්නෙ. දරුවෙක් ලැබෙන්න ඉන්න අම්මලා රහතන් වහන්සේ නමක් වගේ හැසිරෙන්න ඕන, හිත නිවන දේවල් දකින්න ඕනෙ කියලා කියන්නේ කට කහනවට නෙවෙයි.

ඒ වගේම ඔය දේවල්වලම අනිත් පැත්තට දරුණු දේ දකින, දරුණු දේ අහන කතා කරන දරුණු විදියට හිතන පතන අම්මලාට ඒ විදියේ දරුවෙක් උපදින එකත් ඒකාන්තයි. ඔය කලින් කතාවේ බුදු හාමුදුරුවෝ කොසොල් රජතුමාට පැහැදිලි කරලා දුන්නෙත් ඔය ටිකමයි.

අන්න ඒ නිසා මම අපේ තරුණ දූලට පුතාලට කියන්නේ මනා පෞරුෂයක් තියෙන උගත් බුද්ධිමත් දරුවෙක් බලාපොරොත්තුවෙන් ඉන්නවා නම් නිතර දෙවේලේ හිත නිවන දේවල් දකින්න.. අහන්න... ඒ වගේම ප්‍රචණ්ඩත්වයෙන් තොර දරුවෙක් අවශ්‍යනම් විශේෂයෙන්ම ඔය කාලසීමාවේදී ධාර්මිකව ජීවත්වෙන්න."

■ **ලිහිණි මධුෂිකා**

බඩගින්න ඉවසගන්න බැරුව මම දුව විකුණුවා

මෙහෙම ගියොත් මම මැරිලා යයි කියලා මට හිතෙනවා. දැන් ආයෙත් අපි දවසක් ඇර දවසක් කන්නේ. හෙට අනිද්දට එහෙමවත් කන්න බැරිවෙයි."

සම්මුගන් එසේ කියද්දී ෆරීනා කියන්නේ මවක් නොකියන අන්දමේ ඇඟ හිරිවැටී යන කතාවකි. ඒ බඩගින්දර නිවාගැනීමට කියා ඇගේ කුසෙන් උපන් එකම දැරිය මීට ටික දිනකට ඉහතදී විකුණා දැමූ බවයි.

"මම මගේ දුව ලොකු මුදලකට විකුණුවා. ඒ විකුණද්දි දුවට අවුරුදු පහයි. දරුවන් විකුණන එක ඉස්ලාමිය නීතිවලට පටහැනියි කියලා අපි දන්නවා. එහෙම විකුණන එකෙන් දරුවන්ගේ ජීවිත අනතුරේ වැටෙන බවත් අපි දන්නවා. එහෙමයි කියලා වෙන කරන්න දෙයක් නෑ."

ෆරීනා තම දියණිය විකුණා ඇත්තේ වයස අවුරුදු 14ක් වනවිට එරටේම පිරිමි ළමයෙකු සමඟ විවාහවීම සඳහා කුඩා පිරිමි දරුවෙකු සිටින පවුලකටය.

"කෙල්ල විකුණලා ගත්ත සල්ලිවලින් ගොඩක් වියදම් වුණේ කෑමවලට. තවත් කොටසක් මගේ බාල පුතාට බෙහෙත් ගන්න ගියා. එයාට මන්දපෝෂනේ හැදිලා ඉන්නේ. ඇඟ නිකන් දරකෝට්ටක් වගේ."

මේ දිනවල ඇෆ්ගනිස්ථානයේ බොහෝ ප්‍රදේශවලින් ඇසෙන්නේ මෙවැනි කණගාටුදායක කතාය. සුලිලා ද මීට මාස කිහිපයකට උඩදී සිය වකුගඩුවක් විකුණා දැමූ කාන්තාවකි. ඒ ණයක් පියවීමටය. එහෙත් වකුගඩුව විකුණීමෙන් ලැබුණු මුදල ඊට සෑහී නැත. දැන් ණය දුන් පුද්ගලයා කියන්නේ හිඟ ණය මුදල් වෙනුවෙන් ඔහුට ඇගේ දියණිය විකුණා දමන ලෙසයි.

මේ අතර දැඩි සාගතයක් පෙනෙන මානයේ කුසගින්නෙන් බැටකන ඇෆ්ගන් වැසියන් ගැන තාලිබාන් සංවිධානය පසුගියදා විශේෂ ප්‍රකාශයක් සිදුකර තිබුණි. ඔවුන් එහිදී පවසා තිබුණේ මේ තත්ත්වයට හේතුව ඇෆ්ගනිස්ථානයට ජාත්‍යන්තර සම්බාධක පනවා තිබීම බවයි. ඔවුන් එසේ කියද්දී එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසන්නේ කුසගින්න යනු මන්දගාමී සහ නිහඬ ඝාතකයෙක් බවත් එහි බලපෑම සෑමවිටම ක්ෂණිකව නොපෙනෙන බවත්ය. එනිසා ඇෆ්ගනිස්ථානය තුළ ක්‍රමයෙන් බිහිවෙමින් පවතින්නේ මානුෂීය ව්‍යසනයක් බව ඔවුන්ගේ අදහසයි.

"අපේ රටට වෙලා තියෙන දේ ගැන අපට පුදුම ලැජ්ජයි. සමහර වෙලාවට අපට හිතෙනවා මෙහෙම ජීවත්වෙනවට වඩා මැරෙන එක හොඳයි කියලා."

කවුරු කවුරුත් ප්‍රශ්නයට හේතුව සොයාබලද්දී ප්‍රශ්නයෙන් බැටකන ඇෆ්ගන් වැසියෝ එක හඬින් කියන කතාව ඒකය. තවත් ටික දිනකින් කුසගින්න ඉවසාගත නොහැකිව ඔවුන් ඔවුන්ගේම මස් අනුභව කළත් එහි පුදුම වෙන්නට දෙයක් නැත.

■ **රුවන් එස්.සෙනවිරත්න**

"අපිට කන්න සල්ලි නෑ. දරුවෝ නම් බඩගින්න ඉවසගන්න බැරුව අඬාගත්ත ගමන්මයි. උන් බඩගින්නේ අඬනකොට අපි ෆාමසියෙන් මත්පෙති ගෙනත් දීලා නින්දට යවනවා. එතකොට නින්ද යනවා. කවුරු මොනවා කිව්වත් වෙන කරන්න දෙයක් නෑ. අපි ගොඩාක් අසරණයි."

මේ ශෝකාලාපය ඇසෙන්නේ අසල්වැසි ඇෆ්ගනිස්ථානයෙනි. තාලිබාන් සංවිධානය එරට පාලනය සියතට ගැනීම හේතුවෙන් එරටට ලැබෙන විදේශ අරමුදල් නැවතීයාම නිසා මිලියන ගණනක ජනතාවක් දැන් සාගතයක් පෙනෙන මානයට පැමිණ තිබේ. එහි ගොදුරු බවට පත්වූ දෙමාපියන් කුසගින්නේ හඬන දරුවන්ගේ කුසගිනි සඟවන්නේ මත්පෙති ලබාදී නිද්‍රාශීලී කරමිනි

එද ඇෆ්ඝනිස්ථානයේ හොඳ හොඳ රැකියා කළ බහුතරයක් පිරිමි අද වනවිට දෛනික කුලී කම්කරුවන් ගාණට වැටී තිබේ. ඒ නිසා බඩවියත රැකගැනීමට ඔවුන් නොකරන දෙයක් නැති තරම්ය. ඇතැමුන් ඔවුන්ගේම ශරීර අවයව මුදලට විකිණීමට පෙළැඹී තිබේ.

"මට දැනගන්න ලැබුණා වකුගඩුවක් විකුණුවම ලොකු ගාණක් ලැබෙනවා කියලා. ඉතින් බඩගින්නේ ඉන්න බැරිකමට මං මගේ වකුගඩුවක් විකුණුවා. ඇත්තටම වෙන කරන්න දෙයක් තිබුණේ නෑ. කොහොමහරි ඒ වෙනුවෙන් මට ලොකු ගණනක් ලැබුණා."

ඒ සම්මුගන් ය. එතරම් මුදලක් ඔහු ඊට පෙර දැක නොතිබුණු නිසා සම්මුගන්ට වකුගඩුව අහිමිවීමේ වේදනාව පරයා යන සතුටක්ද තිබිණි. එහෙත් ඔහුට සිදුවී තිබුණේ එකී මුදලින් අඩක්ම සිය පවුලට ආහාර මිලදී ගැනීම සඳහා ගත් ණය මුදල් පියවීමටයි. ඒ නිසාම දැන් ඔහු යළිත් වේදනාවෙන් පවසන්නේ මෙවැන්නකි.

"මගේ වකුගඩුව විකුණුවාට පස්සේ මට දැනෙන්නේ මම මිනිහෙක්ගෙන් බාගයක් විතරයි කියලා. මගේ බලාපොරොත්තු සුන්වෙලා ගියා.

එක මාසෙක මම කේක් විකුණලා ලක්ෂ 36ක් හොයලා තියෙනවා

කේක්වලින් ලක්ෂෙට කොඩි දාන ලක්ෂ්මි

අයිසින්වලින් කරන ලද නිර්මාණ

ඒ කාලේ රුසියාවේ රජකම් කරපු පළවැනි ඇලෙක්සැන්ඩර් රජතුමාගෙ බිරිඳ තමයි එලිසවෙටා ඇලෙක්සෙව්නා. රජුගේ බිරිඳ වුණාට මොකද රජගෙදර උදවිය රජාටත් වඩා එයාට බයයිලු. පුදුම වෙන්න දේකුත් නෑ. මොකද කතාවටත් කියනවනේ, රජා වුණත් ගෙදර ගෑනිට යටයි කියලා. ඉතින් මේ එලිසවෙටා රැජින ඒ දවස්වල රජගෙදර උදවියට නීතියක් පනවලා තිබිලා තියෙනවා. ඒ තමයි රජගෙදර අහලකටවත් මී පැණි නම් ගේන්න එපා කියලා. මොකද අපිට මී පැණි සුවඳ වුණාට එයාට ඒවා පුදුමාකාර විදියට ගඳයිලු. ඒ නිසා ඇය වෙනුවෙන් හදන කිසිම කෑමකට හෝ අතුරුපසකට මී පැණි නොදා ඉන්න රාජකීය මුළුතැන්ගෙයි සූපවේදීන් කටයුතු කරලා තියෙනවා. ඒ වුණාට ඔය කිසිම දෙයක් නොදැන රාජකීය මුළුතැන්ගෙට අලුතෙන් වැඩට ආපු සූපවේදියෙක් මුල්ම දවසේ හිතේ හැටියට මී පැණි දලා එලිසවෙටා රැජිනට රසම රස අතුරුපසක් හැදුවලු. ඒ බව දැනගත්ත අනෙක් සූපවේදියො කියලා තියෙනවා අද නම් උඹ ඉවරයි, ගෙදර යන්න ලෑස්ති වෙයන් කියලා. කතාව දැනගත්තට පස්සෙ මේ අලුත් සූපවේදියාට හොඳ අදහසක් පහල වෙලා. ඔහු පුළුවන් තරම් ඉක්මනට මේ අතුරුපස එක වටේට ඝනකම් පාන්පිටි තට්ටුවක් තවරලා පුළුස්සගෙන ඒක වටේටම ඝනකම ඇති ක්‍රීම් තට්ටුවකුත් තැවරුවලු. දැන් ඉතින් මේ නමක් නැති අමුතුපහේ කෑමත් අරගෙන ගිහින් ඔහු පණ බයේ ගැහි ගැහි එලිසවෙටා රැජිනට දුන්නලු. ඊටපස්සෙ පුදනකොටම කාපි යකා කියලා කොයි මොහොතෙ කෑම එකෙන් මූණට වදියිද කියලා බයෙන් එතැනටම වෙලා ඉඳලා තියෙනවා. හැබැයි සිද්ධවෙලා තියෙන්නේ කවුරුත් නොහිතපු දෙයක්. මේ අතුරුපසය කෑවට පස්සේ ඒකෙ රසට වහ වැටුණ එලිසවෙටා රැජින අලුත් සූපවේදියාට ස්තුති කරලා මල් මාලෙකුත් දැම්මලු. ඒ විතරක් නෙවෙයි වැරදීමකින් හැදුන නමක් නැති මේ අතුරුපසයට විලාසිතා කේක් කියලා ලස්සන නමකුත් දලා රටේ ජනතාවට අඳුන්වලා දෙන්න කටයුතු කළාලු. අද අපි හැමෝටම උපන්දින සාද, විවාහ මංගල උත්සව, ප්‍රිය සම්භාෂණවලට නැතුවම බැරි අයිසින් කේක් නිර්මාණය වුණේ ඕන් ඔහොමයි කියලා කතාවක් තියෙනවා. ඒ කතාවේ ඇත්ත නැත්ත මොකක් වුණත් කේක් ගැන අපි දැන් කියන්න යන්නේ නම් ඇත්තම කතාවක්.

ලක්ෂ්මි කුමාරි ඉන්ටර්නැෂනල් ෂුගර් ස්ටූඩියෝ' අධිපතිනිය වන ලක්ෂ්මි කුමාරිගේ කතාවත් ටිකක් ඒ වගේ එකක්. වැලිමඩ ඉපදුණ ලක්ෂ්මි උසස් පෙළ ලියලා කොළඹට ආවේ ඇඟලුම් කර්මාන්ත ආයතනයක රැකියාවකට. අන්තිමේදි රස්සාව වගේම පරස්තාවත් කොළඹින්ම කරගත්තු ලක්ෂ්මි, විවාහයෙන් පස්සෙ හෝකන්දර ප්‍රදේශයේ පදිංචියට ගියා. අද වෙනකොට ඇය දරුවන් තුන්දෙනෙකුගේ අම්මා කෙනෙක්. ඒ වගේම ඇය මුළු රටම දන්න කේක් නිර්මාණ ආයතනයක් වන 'ලක්ෂ්මි කුමාරි ඉන්ටර්නැෂනල් ෂුගර් ස්ටූඩියෝ'හි හිමිකාරිනිය වෙච්ච විදිය ගැන තමයි අපි මේ කියන්න යන්නේ. මේ වෙනකොට කේක් නිර්මාණ ගැන ඇයට ඇති පලපුරුද්ද වසර දහයක්. ඒ කාලය තුළදී NVQ 4 සහතිකය වගේම කේක් නිර්මාණ සම්බන්ධව ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියකුත් ඇය හිමිකරගෙන තියෙනවා. ඒ විතරක් නෙවෙයි මීට අදළව ජාත්‍යන්තර දිනූ ඉහළම සහතිකය වන Wilton Method Instruction සහතිකයත් හිමිකරගෙන අවසන්. ඒ නිසා ඉතාමත් කෙටි කාලයකදී ඇය ලැබූ මේ වෘත්තීය සාර්ථකත්වයේ රහස ගැන යමක් කතා කරන්න ඕන කියලා අපි හිතුවා.

"2012 අවුරුද්දෙ මගේ දෙවැනි දුවගේ උපන්දිනය දවසෙ ඇයට ලස්සන කේක් එකක් කඩෙන් ගෙනැල්ලා දෙන්න මගේ අතේ සල්ලි තිබුණේ නෑ. මොකද කරන්නේ කියලා කල්පනා කරනකොට මට හිතුණා අඩුමතරමින් පුළුවන් විදියට ගෙදරවත් කේක් එකක් හදලා දෙන්න ඕනෙ කියලා. එහෙම හිතුවට මොකද මම ජීවිතේටවත් තනියම කේක් එකක් හදලා තිබුණෙ නෑ. හදන්න දැනගෙන හිටියෙත් නෑ. ඊටපස්සෙ කොහොමහරි ඉන්ටර්නෙට් එකෙන් බලාගෙන කේක් එකක් හදන්න පටන්ගත්තා. අවසානෙ රස කොහොම වෙතත් කේක්වල හැඩෙයි, පෙනුමයි තියෙන කේක් එකක් හැදුනා කිව්වොත් තමයි හරි."

ඒ ගැන මතක් කරද්දී පවා ඇගේ මුහුණට ආවේ හිනාවක්.

"ඊටපස්සෙ මට හිතුණා ඒ බටර් කේක් එක වටේට ලස්සන අයිසින් තට්ටුවක් ගාන්න තිබුණානම් නියමයි නේද කියලා. හිතුණට ඉතින් හරිම විදියට අයිසින් හදන්න අවශ්‍ය කරන සේරම දේවල් ඒ වෙලාවේ ගෙදර තිබුණෙ නෑ. ඒ වුණාට තියෙන දේවල් පුළුවන් විදියට හදලා අයිසින් ටිකකුත් ගෑවා. රසත් හොඳටම තිබුණා. ඒ වුණාට ගෙදර අය කැමති වෙයිද දන්නෙ නෑ කියලා හිත හිතා තමයි දුවගෙ උපන්දිනේ දවසේ කේක් එක මේසෙට අරන් ගියේ. අන්තිමට මම හිතුවටත් වැඩිය එයාලා මගේ කේක් එකට ආස වුණා. කොච්චර ආසා වුණාද කියනවා නම් කේක් එක කැපුවත් හරි ආසාවටවත් කෑල්ලක් ඉතුරු වුණේ නෑ."

එලිසවෙටා රැජිනගේ සූපවේදියාට වෙච්ච වැඩේ වගේම එකක්ම තමයි ලක්ෂ්මිටත් වෙලා තියෙන්නේ. කොහොම නමුත් එතැන් පටන් කේක් ඇගේ ජීවිතයේ වෙනස්ම පිටුවක් පෙරලූ බව තමයි ඇය කියන්නේ. ඊටපස්සේ විවේකයක් ලද හැම අවස්ථාවකම කේක් හදලා සැමියාට, දරුවන්ට විතරක් නෙවෙයි කාර්යාලයේ යහළු යෙහෙළියන්ටත් පිළිගන්වලා තියෙනවා. ඒ අයගෙන් ලැබුණු ප්‍රතිචාර තමයි ඊටපස්සෙ ලක්ෂ්මිගෙ ගමනට පාර පෙන්නලා තියෙන්නේ.

"ඊටපස්සෙ මම නිකමට වගේ ඉන්ටර්නෙට් එකේ දැන්වීමක් පලකළා කේක් ඇණවුම් භාරගන්නවා කියලා. ලැබුණු ඇණවුම්වලින් හදන්න තේරෙන කේක් තනියම හදලා අනිත් ඒවා හැම එකක්ම ඉන්ටර්නෙට් එකෙන් බලාගෙන තමයි හැදුවේ. එහෙම නොදන්න කේක් එකක් හදන වාරයක් ගානේ මම අලුත් දෙයක් ඉගෙනගත්තා. ඒ ඇරෙන්න ඒ වෙනකොටත් මම කිසිම පන්තියකට ගිහින් කේක් පාඨමාලා හදාරලා තිබුණෙ නෑ."

එතැන් පටන් ලක්ෂ්මි ඇයට ලැබෙන කේක් ඇණවුම් සියල්ලක්ම භාරගෙන තිබුණේ රැකියාවටත් යන අතරතුර. එහෙම කේක් විකුණලා අතට ලැබෙන අමතර ආදායම ඊට වැඩිය ලොකු හීනයක් වෙනුවෙන් ඇය ඉතිරි කළා. 2013 වසරේදී බොරැල්ල YMBA ගොඩනැගිල්ලේ 'ලක්ෂ්මි කුමාරි ෂුගර් ස්ටූඩියෝ' ආරම්භ වුණේ ඒ උත්සාහයේ ප්‍රතිඵලයක් විදියට.

"ෂුගර් ස්ටූඩියෝ එක පටන්ගත්තට පස්සේ මම ගෙදර කේක් ඇණවුම් භාරගන්න එක නතර කළා. මීට අවුරුදු තුනකට කලින් මංගල උත්සවවලට රුපියල් ලක්ෂ තුනට හතරට මම එක කේක් ගෙඩිය විකුණලා තියෙනවා. 2020 පෙබරවාරි මාසෙට විතරක් මම කේක් විකුණලා රුපියල් ලක්ෂ 36ක් හොයලා තියෙනවා. මම හිතන්නෙ මේ කේක් ව්‍යාපාරය හරියට කරන්න පුළුවන් කාන්තාවකට ගෙදර වෙලා මාසෙට ලක්ෂ 10ක් හම්බකරන්න පුළුවන්. ලක්ෂ 10ක් බෑමයි කියලා කවුරුහරි කියනවානම් මම ඕන කෙනෙකුට බොහොම විශ්වාසයෙන් කියනවා ලක්ෂ 5ක් අනිවාර්යයෙන්ම හොයන්න පුළුවන්."



මුලදි ඉන්ටර්නෙට් එක බලාගෙන කේක් හැදුවට අද ඇයට කේක් නිර්මාණය සම්බන්ධ ආචාර්ය උපාධියකුත් තියෙනවා

කේක් හදලා ලක්ෂෙට කොඩිය දුන විදිය ගැන අනිත් අයටත් කියලා දෙන්න ඇය මේ වනවිට බත්තරමුල්ල, ගම්පහ, මීගමුව, රත්නපුර, මාතර, කුරුණෑගල සහ නුවර කියන මේ සියලුම ප්‍රදේශවල පන්තිත් පවත්වනවා.

"මගෙන් ඉගෙනගත්ත ගෝලයෝ පහළොස්දහකට වැඩි ප්‍රමාණයක් රට පුරාම ඉන්නවා. මගේ ළඟ අවුරුද්දක හෝ මාස 6ක කේක් පාඨමාලාවක් ඉගෙනගන්න එන ළමයෙකුට මාස තුනක් හතරක් යනකොට පාඨමාලාවට යට කරපු මුදල් කේක්වලින් හරි හම්බකරගෙන ව්‍යවසායිකාවක් විදියට නැගිටින්නත් මම අත දීලා තියෙනවා. ඉදිරියටත් ඒක එහෙම කරනවා.

මම අපේ කාන්තාවන්ට කියන්නේ උදේ ඉඳන් රෑට රෑ වෙනකන් මහත්තයා ගන්න පඩියෙන් ඩේට කාඩ් දගෙන ෆේස්බුක් එකේ උඩ පහල යන්න කාලේ නාස්ති කරන්න එපා. ඔය අන්තර්ජාලය වුණත් තමන්ට වැඩක් වෙන විදියට පාවිච්චි කරන්න. මොකද මම බය නැතුව එහෙම කියන්නෙ කේක් ගැන මෙලෝ හසරක් නොදැන හිටපු මම පළවැනි කේක් එක හැදුවේ අන්තර්ජාලයේ පිහිටෙන් නිසා."

■ ලිහිණි මධුෂිකා

ෆේස් වොෂ් එකකින් සම පැහැපත් කරන්න පුළුවන්ද?

GS &Co BELIEVE

Seri NATURALS

ඔබ තවත් ලස්සන කරයි

රු.195/- සිට

දිදුලන පැහැපත් සමකට

කුංකුම ෆේස් වොෂ්

- කුංකුම වල ඇති ඖෂධීය ගුණය සමේ ඇති මෙලනින් ස්වභාවිකව පාලනය කරයි
- එමගින් සමේ අවපැහැගැන්වීම් අඩු කර පැහැපත් බවක් ලබා දෙයි
- ස්වභාවික අමුද්‍රව්‍ය වල ගුණයෙන් සමට අහිතකර නොවන පරිදි නිරෝගී පැහැපත් සමක් ලබා දෙයි

දවසට දෙවරක් භාවිතා කර වෙනස අත්විඳින්න

NO ANIMAL TESTING

NO Parabens Formaldehyde Alcohol Phthalates Triclosan

අලෙවිය:
ජෝර්ජ් ස්ටුවර්ට් කන්සියුමර් (පුද්ගලික) සමාගම
439, හාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථන: 0115 66 26 26

අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

මාසික අධ්‍යාපනික පුවත්පත්

6

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත
පිංතූර පොත් දරුවන්ගේ
නිපුණතා වර්ධනය පෙන්වයි

ජනවාරි කලාපයන් දැන් වෙළෙඳපොළේ

අකුරු කරන්නට අලුතින්ම පාසලට පිය නැගූ පුංචි නංගිලා මල්ලිලාට

සිංහල ගණිතය පරිසරය ඉංග්‍රීසි දෙමළ පාඩම් සමඟින් ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් මිලදී ගතහැක

අවසරයි

බියංකා නානායක්කාර ලියයි

102 කොටස

"ඔයා පොඩ්ඩක් අම්මව බලාගෙන ඔහොම ඉන්න. මං ඩොක්ටර් හම්බවෙලා එනකම්..."

මේනක බණ්ඩාර තෙන්නකෝන් එතැනින් මගහැර මදක් ඈතට ගියේය. ඔහුට වෛද්‍යවරයෙක් හමුවන්න කීවේ නැතත් ඇත්තටම ඔහුට වෛද්‍යවරයෙකු හමුවීමේ උවමනාවක් විය. ඒ අම්මා ගැන උපදෙසක් ගන්නටය. හදවත් රෝගියෙකු වන අම්මාට අප්පච්චිගේ රෝගී තත්ත්වය දරාගන්නට බැරිවේදැයි ඔහුගේ සිතට දැනෙමින් තිබුණි. ඒ බව වෛද්‍යවරයා හමුවී ඇසුවේ ඒ නිසාය.

"කොහොමත් කියන්න ඕනනේ. එයාට එකපාර නැතුව ඔය තත්ත්වෙ ටික ටික කියන්න. ඊටත් මිස්ට තෙන්නකෝන් අපි හිතනවට වඩා අම්මලා හරි ස්ට්‍රෝන්ග්. අපේ තාත්තා නැතිවෙනකොට අපි හිතුවෙ අම්මට ඒක දරාගන්න බැරිවෙයි කියලා ඒ දෙන්නා හිටපු විදියට. ඒත් පළවැනි දවසෙ ඒ මොහොතෙ ඇඬුවා. බොඩි එක උස්සද්දිවත් කඳුළක් හෙලුවෙ නෑ ඊටපස්සෙ. හැබැයි එදෑ රෑ ඇතිවෙනකම් ඇඬුවා. එච්චරයි. මං ඒකයි කිව්වෙ, අම්මලා ශක්තිමත් කියලා. දැන් ඔය ඇතිවෙලා තියෙන තත්ත්වෙ එයාට කියන්න..."

තරුණ වෛද්‍යවරයා මේනකගේ හිත හැදෙන්නට තවත් දේවල් කීවේ ඔහු තරුණයෙකු වුවත් මෙවන් අත්දැකීමකට මුහුණ දී නැති බව තේරුම් ගිය නිසාමය.

මේනක ඈත කොරිඩෝරයේ යද්දී චතුමිණී සෙනෙහෙලතා මැණිකේ අතින් අල්වාගෙන ගොස් බංකුවකින් ඉන්දෙව්වාය. සෙනෙහෙලතා මැණිකේ වන් ශක්තිවන්ත ගැහැනියක් මේ අයුරින් මැලවී සිටිනු දකින්නට චතුමිණීගේ හිත අකමැති විය.

"ඔයා හැමදාම මං ළඟ ඉන්නවනම් ඔය පොතක නොලිව්වත් මට කමක් නෑ. පෑන් ඉරිවලට වඩා මටනම් වටින්නේ හිතේ විශ්වාසෙ."

"එහෙමද නෝනා..?"

"හ්ම්... හැබැයි විශ්වාසෙ බිඳුණොත් වෙන්නෙ ඒකෙ අනිත් පැත්ත. ආයේ මාව හොයනවා බොරු..."

"ඇයි මෙහෙන් පැනලා ගිහින් ගල්ලෙනක හැංගෙන්නද?"

"බැරිකමක් නෑ. කොහොමත් අදින් පස්සෙ මං පහළට යනවා නිදියන්න. අපි බඳිනකම් ආයෙ අපි අතරෙ මොනවත් වෙන්නෙ නෑ..."

අංජනා කීවේ විහිළු ස්වරූපය පසෙක දමාය.

"ෂුවර් එහෙම ඉමු. හැබැයි නෝනා අම්මලා එනකම් පහලට නම් යන්න බෑ..."

අංජනා ඔහුගේ දණහිස මතින් අතක් තබා හිනැහුණාය. ඒ සිනාවේ දැවටුණු තේනුකට ආයෙත් පුදුම සිතුණි. ඇගේ ජීවිතයේ වටිනාම දෙයක් ඇයට අහිමිව තියෙද්දීත් ඈ සිනාසෙන ලස්සන ඔහුගේ හිත අවුල් කළේය. ඒ නිසාම දැනේ ගෙදර එනතුරු නොසිට හෙට අනිද්දට ඇයව ගෙදර කැඳවාගෙන ගොස් අම්මාට අඳුන්වා දෙන්නට හදිස්සියේම තේනුකට සිතුණි. ඒත් සමඟ මතක්වූයේ වෙනදෑ සේ ගෙදර පැමිණ අම්මාට දුරකතන ඇමතුමක් නොදුන් බවය. මොහොතකට පෙර චතුමිණීගෙන් පැමිණි ඇමතුම ඔහු මගහැරියේ හිතාමතාය. ඇය ගෙදර ආවාට පසු තමන් පැමිණ ගිය බව අම්මා කියන්නට ඇත. ඒ ඇමතුම ගන්නේ නෝක්කාඩු කතා කියවන්නට කියා සිතුණෙන් ඔහු ඒ ඇමතුමට කතා කළේ නැත. අම්මාගේ දුරකතනය නාද වූවත් එය නැවතෙනතුරුම ගත්තේ නැත. ඔහු දෙවරක් තුන්වරක් ඊට ගත්තත් මේනකගේ වාහනේ පසුපස අසුනේ තිබූ සෙනෙහෙලතා මැණිකේගේ බෑගයේ වූ දුරකතනය නාදවෙනවා ඇසෙන්නට කිසිවෙක් එහි සිටියේ නැත. තේනුක තෙන්නකෝන්ගෙ හිතේ නොසන්සුන්බවක් විය. අම්මා කවදාවත් තමන්ගේ ඇමතුමක් මඟ නොහරින්නීය. තේනුක නිවසේ දුරකතනයට ඇමතුම ගත්තේය. ඇමතුමට කවුරුන් හෝ සම්බන්ධවෙනු දැනුණි.

"ලොකු නෝනා කෝ?"

ඇසුණු නඳුනන පිරිමි කටහඬෙන් ඔහු ඇසුවේය.

"චතුමිණී නෝනත් එක්ක ඉස්පිරිතාලේ ගියා."

"ඒ මොකටද..? කවුද ඔය කතා කරන්නේ..?"

තේනුක කලබල වුණේ අම්මාට අසනීපයක් කියාය. කතා කළේ නිවසේ සේවක තරුණයෙකි.

"සර් නිවිස්වලටත් දැන් කිව්වනෙ. ඇමතිතුමා හදිස්සියේ අසනීපවෙලා ජයවර්ධනපුර ඉස්පිරිතාලෙට ඇතුල් කළා කියලා. ලොකු නෝනලා ගියෙ ඒකයි."

තේනුක ඇමතුම විසන්ධි කළේය. අප්පච්චිගේ දේශපාලනය ප්‍රිය නොකළාට තේනුක අප්පච්චි සමඟ තරහක් නැත. ඔහු අසනීප වූ බව කියද්දී හිත සැලුනේ ඒකය. රෝහල්ගත කළා කියන්නේ අසනීපය සුළු එකක් නොවන්නට ඇත. ඔහු චතුමිණීගේ දුරකතනයට ඇමතුමක් ගත්තේ ඇය සෙනෙහෙලතා මැණිකේ සමඟ ඉන්නා බව දන්නා නිසාය. ඇමතුමට ඇය සම්බන්ධවෙනු දැනුණි.

"අපි පණිවිඩ කියන්න කතා කරද්දි ඔයා කෝල් ගන්නෙ නෑ..."

ඊට උත්තර නොදුන් ඔහු සෙනෙහෙලතා මැණිකේ ඉල්ලුවාය. මොහොතක් ගෙවුණි. දුරකතනය මාරුවූ බව හැඟුණෙන් තේනුක කතා කළේය. ඒත් කතා කරනු වෙනුවට ඇසුණේ සෙනෙහෙලතා මැණිකේගේ ඇඬුම් හඬයි.

ලබන සතියට

තාත්තාගෙ බොඩි එක උස්සන වෙලාවෙවත් අපේ අම්මගෙ ඇහෙන් එක කඳුලක් වැටුණේ නෑ

සෙනෙහෙලතා මැණිකේත්, චතුමිණීත්, මේනක බණ්ඩාර තෙන්නකෝන් පසුපසින් රෝහල තුළට ගියේ බරවූ හදවතෙනි. ගේට්ටුවේ වූ ආරක්ෂක නිලධාරියා විසින් ඔවුන් නවතද්දී මේනක තෙන්නකෝන් ඔවුන් ඔහුට හඳුන්වා දුන්නේ මොහොතකට පෙර රෝහලට ඇතුළත් කළ තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයාගේ බිරිඳ හා දුව ලෙසිනි. ආරක්ෂක නිලධාරියා ගරු කටයුතු ලෙසින් සිනාසී ඉඩදෙනු දැකීමෙන් චතුමිණීගේ හිතේ ආඩම්බරයක් ඇතිවිය. ඒත් මේනක සිටින්නේ මොකද්දෝ කලබලයකින් කියා චතුමිණීගේ තීක්ෂණ ඇසට අසුවුණේ ඔවුන් දෙදෙනා ඔහුට වඩා අඩියක් දෙකක් පසුපසින් ගමන් කළ නිසාය.

"ලොකු පුතා යනවා නෙවේ දුවනවනේ... ටිකක් හෙමින් යමු ළමයෝ..."

සෙනෙහෙලතා මැණිකේ ඔහුට ඇසෙන්නට කියද්දී චතුමිණීගේ දෙතොලට ලතැවුල් අමතක වී සිනාවක් නැගුණි.

"අශ්වයෙක් වගේ..."

ඈ එසේ කියද්දී මේනක බණ්ඩාර තෙන්නකෝන් එක්වරම පසුපස හැරී බැලුවේය. ඒත් දෑස් එක්වරම ඉලක්කවූයේ වූයේ චතුමිණීය. ඇගේ හිත ගැස්සුණේ එවර හොඳින්ම ඔහුගේ දෑසත් මුහුණත් දෑසේ පැටලුණ නිසාය. මොහොතකට පෙර ඇය සමඟ නුවර සිට එද්දී තිබූ කෙලිලොල්බව ඒ මූණෙන් පලාගොස් තිබුණි. ඔහුගේ මූණේ වූයේ තේරුම්ගන්නට අපහසු පෙනුමකි. දෑස් රතුවී තිබුණේ හැටිද මේ මොහොතේ හැටිද කියා ඇයට සිතාගන්නට බැරි වුණේය.

"හෙමින් ගිහිල්ලා බෑ. ඩොක්ටර් කෙනෙක් එන්න කියලා කතා කරද්දියි මං ඔයාලා එක්ක එන්න එළියට දුවන් ආවේ... මං කියන්නද, මම ඩොක්ටර් හම්බවෙලා එනකම් ඔයාලා දෙන්නා අන්න අර බංකුවෙන් ඉඳගෙන ඉන්නවද..? කෝ ඔය අම්මාගෙ බෑග් එක දෙන්න මං වාහනේට දාගෙනම එන්නම්..."

සෙනෙහෙලතා මැණිකේ අපහසුවෙන් සේ අතේ රුවාගෙන සිටි අත්බෑගය මේනක බණ්ඩාර අතට ගත්තේය.

"ලොකු පුතා, ඔයා දෙස්තර මහත්තයා හම්බවෙන්න කලින් අපිව අප්පච්චි ළඟට දාලා යන්නකෝ... එතකොට ඔයා කොයිවෙලේ ආවත් කමක් නෑ..."

සෙනෙහෙලතා මැණිකේට තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා දැක බලාගැනීමේ නොඉවසිල්ල කොතෙක්දැයි ඒ වචනවල ගැබ්වී තිබුණි.

"අම්මේ... අප්පච්චි ඉන්නෙ හදිසි ප්‍රතිකාර ඒකකයේ. අපි කාටවත් ඒකට දැන්ම යන්න බෑ. ඒ හින්ද අපි පමාවෙන එක හොඳයි එයාව වාට්ටුවට දානකල්..."

මේනක තෙන්නකෝන් කීවේ ඈත රෝහල් කොරිඩෝරයේ වින සාත්තු සේවකයෙකු දෙස බලාගෙනය. ඔහුට සෙනෙහෙලතා මැණිකේගේ මුහුණ දෙස බලාගෙන මුසාවක් කියන්නට බැරිබවක් දැනුණි.

"අප්පච්චිට මොකද වෙලා තියෙන්නෙ? මොකද්ද අසනීපේ? මං ඒකවත් දන්නෙ නෑ ලෙඩවෙලා ඉස්පිරිතාලේ ගෙනාව කිව්වට..."

සෙනෙහෙලතා මැණිකේගේ හඬ හැඬුම්බර වුණේය. චතුමිණී මේනක දෙස බැලුවාය.

"මට බයත් හිතෙනවා සුදු මැණිකේ මාමා ගැන. ලොකු පුතා නිකම් මඟ අරිනවා වගේ පේන්නෙ නැද්ද ඔයාට..? අප්පච්චිට අමාරුද දන්නෙ නෑ මැණිකේ..."

චතුමිණී සෙනෙහෙලතා මැණිකේගේ හිස් මුදුනින් දකුණත තිබ්බාය. ඒ අතේ බර සෙනෙහෙලතා මැණිකේට දැනිණි.

"නෑ නැන්දම්මේ. එහෙනම් මේනක අයියට ඔහොම ඉන්න බෑ. ඉන්නකෝ එයා එනකම්..."

චතුමිණී ඇගේ උරහිසේ පිටුපසින් සිටගෙන ඇගේ දෙවුරට දෑත් තැබුවාය.

අංජනා තේනුකට පේන්න කිසිඳු දෙමිනස්බවක් නොපෙන්වූයෙන් තේනුක පත්ව සිටි අපහසුබවින් ටිකින් ටික මිදුණේය. තරුණියකව සිටි ඇය ඔහු නිසා ගැහැනියක් වූ බව මතකයට එද්දී තේනුකට හිතෙන්නේම ඉතා ඉක්මනින් ඇයව විවාහ කර ගන්නටය.

"අම්මලාගේ හීන ඇතිනෙ. අපි ඉක්මන් නොවී ඒ හීනවලටත් ඉඩ දීලා බඳිමු... ඔයා මාව දාලා කොහෙවත් යන්නෙ නෑනේ."

"කොහේ යන්නද නෝනා... දැන් නම් ඉතින් මං කෙහේවත් යන්නෙත් නෑ. ඔයාට කොහේවත් යන්න දෙන්නෙත් නෑ..."

ඔවුන් දෙන්නා ඉඳගෙන සිටියේ විසිත්ත කාමරයේ වූ ලොකු සැට් පුටුවේය. දෙදෙනා අතර දුර අඩියක්වත් නොවුණි.

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදිම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

අමතක කරලමු පැරණි කතා හදලා විකුණමු ඉඳුනකතා

සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

ඔන්න මේ අලුත් අවුරුද්දේ පරණ කතා අමතක කරලා ඉඳුනකතා හදලා ගොඩයන විදිය ගැනයි මේ කතාව.

ඉස්සර අපි හරි ආසාවෙන් බලාපු කාටූන් එකක් තිබුණා 'ඉඳුනකතා මල්ලියා' කියලා.

"ඉඳුනේ නොමැති අයට හදපු හුස්ම පිඹලා පණ පොවාපු අනුන්ගේ ගින්දර නිවාපු ඉඳුනකතා මල්ලියා..."

ඔන්න ඔහොම ඒක පටන්ගනිද්දි කොහේ හිටියත් අපි ඉතින් ටීවී එක ඉස්සරහා. ඒ කතාවේ ප්‍රධාන චරිතේ පණ තියෙන ඉඳුනකතාවක්. එයා හැමෝටම උදව් කරන වීරයෙක්. කවුරුහරි කෙනෙක් බඩගින්නේ ඉන්නවා නම් මේ ඉඳුනකතා මල්ලියා එයාගේ ඔලුවෙන් ඉඳුනකතා කෑල්ලක් ගලවලා ඒ කෙනාට කන්න දෙනවා. ඊටපස්සේ පාන් මාමා ඉඳුනකතා මල්ලියට අලුතින් ඉඳුනකතා ඔලුවක් හදලා දෙනවා.

ඒ කාලේ ඉඳලා අපි ඉඳුනකතා මල්ලි බලන්න විතරක් නෙමෙයි ඉඳුනකතා කන්නත් ආසයි. ඉඳුනකතා කන්න අකමැති කවුද ඉතින්. ඉඳුනකතා කෑවහම මොළේ වැඩෙනවාය කියලා ඔය සමහරු විහිළුවට වගේ කියන්නේ.

හැට හැත්තෑ ගණන්වල ඔය දැන් තියෙනවා වගේ අරුමෝසම් ටොපි චොක්ලට් වර්ග තිබුණේ නැතිලු. කඩපිලේ පැණි රස බෝතල් පුරවලා තිබුණේ ඉඳුනකතා, විස්කිරිඉඳුනු, සව්බොරෝ, බුල්ටෝ වගේ කෑම ජාතිවලින් කියලයි වැඩිහිටි උදවිය කියන්නේ. ඒ අතරිනුත් ඉඳුනකතාවලට හම්බවෙන්නේ ප්‍රමුඛ තැනක්ලු.

ඉඳුනකතා කියන්නේ සිංහල අපේ කෑමක් කියලා සමහරු විශ්වාස කරනවා. හැබැයි ඒ කතාව වැරදියි. ඉඳුනකතා, පාන්, බනිස් ඇතුළු ගොඩක් කෑම වර්ග අපේ රටට ගෙනාවේ පෘතුගීසි.

ඊශ්‍රායලේ නසරත් නුවර හිටපු රෙපරමාදු ජාතිකයෝ තමයි මුලින්ම ඉඳුනකතා හදලා තියෙන්නේ. නසරත් විස්කෝතු, සීනි බිස්කට් (Sugar Cookies) කියලයි ඔවුන් මෙව්වට කියන්නේ. ගොඩක් අය නොදන්නවා වුණාට ඉඳුනකතා කියන්නේ නත්තල එක්ක හරි හරියට බැඳුනු කෑමක්. මොකද යුරෝපීය ජාතිකයෝ නත්තල සමරන්න එකතු කරගන්න ප්‍රධානම රසකැවිල්ලක් තමයි ඉඳුනකතා.

අපේ රටේ උදවිය නම් ඉතින් නත්තල් කාලේ කියලා නැහැ ඕන කාලෙක ඉඳුනකතාවලට කැමතියි. ඒ නිසා ඉඳුනකතාවලට වෙළඳපොළේ හොඳ ඉල්ලුමක් තියෙනවා.

ඉතින් මේ අලුත් අවුරුද්දේ ඉඳලවත් පුංචිවට හරි අලුත් ව්‍යාපාරයක් පටන්ගන්න ඉඳුනය පහල වේවා කියලා අපි ඉඳුනකතා හදන වැඩේ පටන්ගමු.

පාන්පිටි 120g, කුඩු කරගත් සීනි 75g, දියකරගත් බටර් 50g, කිරිපිටි 50g, බේකින් පවුඩර් තේ හැඳි 1/2, බිත්තරයක්, වැනිලා තේ හැඳි 1ක් සපයාගන්න.

1 මුලින්ම පාන් පිටිවලට බේකින් පවුඩර් එකතු කරලා හොඳට හලාගන්න.

2 සීනි, බටර්, කිරිපිටි භාජනයකට දලා බීට් කරන්න. විනාඩි කීපයකින් වැනිලා සහ බිත්තරය එකතු කරන්න. මේ මිශ්‍රණයට හලාගත්තු පිටි ටිකෙන් ටික එකතු කරන ගමන් මිශ්‍ර කරලා බිස්කට් මෝලිය හදාගන්න. තෙතමනය වැඩියි නම් පිටි ස්වල්පයක් එකතු කරන්න.

3 මිශ්‍රණය කුඩා කොටස්වලට වෙන් කරලා බෝල කරන්න. පස්සේ මැදින් පැතලි කරන්න. ඉඳුනකතාව උඩට වතුර ටිකක් ගාලා සීනි උඩින් ඉසින්න. තෙල් කඩදාසියක් දැපු තැටියක ඉඳුනකතා හයක් විතර තියලා 160 C^0ක උෂ්ණත්වයකින් විනාඩි 20-25 බේක් කරගන්න.

ප්ලාස්ටික් බෝතල්වල අසුරලා ලේබල් අලවාගන්න. මෙහෙම හදන එක ඉඳුනකතා එකක් ප්‍රමාණය අනුව රුපියල් 10-60 දක්වා මිලකට අලෙවි කරන්න පුළුවන්. තවත් විස්තරවලට 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට
මිලදී ගනු ලැබේ.
කැරට් 20, 18,14, 09.
රජයේ ලියාපදිංචි ආයතනයකි.
074 152 30 35

උගස් තැබූ
රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ
බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහළ මිලක්
076 101 88 53

දැන්වීම් සඳහා අමතන්න
0112 672 601
0112 672 603

අඩු මිලට බෙඩ්ෂීට්
රටින් ගෙන්වන ලද ඩිසයින් 50කින් යුත් අලුත් සින්ගල් ඩබල් බෙඩ්ෂීට් මිල 490/- සිට ට්‍රිපල් බෙඩ්ෂීට් 790/- සිට තවත් බෙඩ්ෂීට් වර්ග 70ක් කොට්ට 690/- සිට ඉන්දියන් නයිට් 630/- සිට තුවා 290/- සිට 1800/- දක්වා තොගමිලට අපෙන් ලබාගත හැක
සැමර්විටා ක්ලොතින්
ගුරුගේ නේවර් පාර්ක් අසල, ජා-ඇල
0117902278
0771964341

මූල්‍ය බැංකු ඇබෑර්තු
★කුඩා හා මධ්‍ය පරිමාණ බැංකු ශාඛා සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★අවම සුදුසුකම් O/L වේ.
★වැටුප් සමග පුහුණුව.
★රැකියාව තම ප්‍රදේශයටම.
ලබා දීමු 40,000/-
18/40 ගෑ/පී
(මෑන් පවර් නොවේ)
0712 564 715 | 0703 346 072
0774 024 155 | 0702 725 731
0761 125 624 | 0702 231 694

Unique Training Institute
වෙතින් සරලව මුලසිට ඉගැන්වෙන ඉංග්‍රීසි පාඨමාලා [Spoken English] සඳහා අයදුම් කැදවනු ලැබේ. විභාග ප්‍රතිඵල අපේක්ෂක ඔබ පහත පාඨමාලා හදාරා, NVQ සහතිකපත් සමග විදේශීය වෘත්තීය සුදුසුකම් ඇතිකරගන්න.
1. Advanced Secretarial Practice
[ලේකම්කරණය පාඨමාලාව]
2. Professional Certificate in Business Administration [ව්‍යාපාර පරිපාලනය පාඨමාලාව]
3. Professional Certificate in Purchasing
074 261 7061 W/Ap: 074 222 3763

ධරණී
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන - 0115 200 900
බෙදාහැරීමේ අංශය - 0112 127204
දැන්වීම් අංශය- 0112672801 0112672603
ෆැක්ස් - 0112 673 451

සැ'දෑ සමය

විශ්‍රාමයට සිව් වසරකි ගත — වෙන්නේ
දැන් දැන් හෙමින් ලෙඩ දුක අත — වනන්නේ
හීනෙන් පවා සේවා පින් බිම — ඉන්නේ
සුපසන් මෙහෙවරක මතකය — පූදින්නේ

හිමිදිරි උදේ පිනිකැට මැද පිය — මනින
මම එනතුරා අම්මා මග — බලාගෙන
මිත්තණියගෙ සුවඳ මැද මගෙ දරු — තිදෙන
ඒ භූමිකාවට පණ දෙමි මම — මෙදින

පාන්දරින් පිබිදෙමි කම්මැලි — නැතිව
තිසරණ සිනි කරමි පුද පූජා — ඇතිව
හිටුවා හිත මිතුරු ගහකොළ හැඩ — ඇතිව
සතුටින් සතුටු උයනේ ඉමි දුක — නැතිව

ලද තුටු තිළිණ පලදයී — පදක්කම්
පිසදු තබා ගම් තාමත් — පරිස්සම්
මුනුපුරා කරයි හරි — දඟකාරකම්
නුඹලගෙ කිරි සුවඳ මට අද — පදක්කම්

අත දිග තෙක් ඇති දේ ඇද — දමනකොට
එස් පහ කැලේ සාලේ අද — බලනකොට
හපන් පයින් යන දෝණිගෙ — හිනා කට
මට මොන කවිද? ගෙදරම — කවියාය කොට

සුමිත්‍රා ලංකා
මාපලාන කඹුරුපිටිය

දිවිමග ජයගත් දිරිය දියණිය

අත්පා ඇති අයත් මේ ලෙස — නොසිතුවට
ඔලුවක් තිබෙනවා අතපය — නැතුවාට
බාධක කොයිතරම් ආවත් — ඉදිරියට
අදිටන යට කරන්නට බැහැ — කිසිවෙකුට

මෙලොවට බිහි වුණත් ඔබ අතපය — නැතුව
දෙමාපියන් ඒ ගැන වෙනසක් — නැතුව
මෙතැනට එන්න දිරිදුන් — මව්පියන්හට
පෙරුම් පුරන පැතුමකි මතු බුදු — වෙන්ට

වෙනසක් නැතුව සහයෝගය දුන්න — එද
ගුරු භවතුන් සහ යහළුවො ටික — සැමද
ඉදිරියටත් සහයෝගය ගන්න — බෙද
දිවි ඇති තුරාවට අමතක නොවෙයි — සද

ඩබ්.බියට්‍රිස්
ඇහැලියගොඩ

පුංචි සොඳුරියේ

මට හරි ආදරෙයි කියා
වෙන්වී ගිය මගේ
පුංචි සොඳුරු ප්‍රේමියේ
කොතැනක සිට හෝ ඔබ
මා මළ පසු
හිස අද්දරට පැමිණ
සඳවන් වූ මුහුණ යොමා
ඔය නිල්මිණි දැසින්
කඳුළු සලා හඬන්න
වැසුණු මුව තෙමන්න
ඔය කඳුළෙ රස විඳින්න
ඇවිත් මා බලන්න

ලීල් චන්ද්‍රසිරි
කුඹුක්වැව
නැගම්පහ

ඔබ දෙවයට පිටුපායිද.. ?
දෙවය ඔබට පිටුපායිද.. ?
● ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමඟ කස්ස රේඛා ශාස්ත්‍රයෙන් බැඳී ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.
කස්ස රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාකනා මාවත, කොට්ටාව, පන්නිපිටිය.
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

රූපලාවණ්‍යාගාරයක්
සඳහා 18-35 අතර ප්‍රියමනාප සේවිකාවන් අවශ්‍යයි. නවාතැන්, කෑම බීම නිල ඇඳුම් නොමිලේ මසකට රුපියල් ලක්ෂ 2 ට වඩා උපයා ගත හැක.
ඕනෑම ප්‍රදේශයකින් බඳවා ගැනේ.
බත්තරමුල්ල - 071 90 90 451

HOME DAYCARE
අප දිවා සුරැකුම් මධ්‍යස්ථානය විසින් වයස අවුරුදු 01 සිට 05 දක්වා දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙමින් දවස පුරා රැක බලා ගනු ලැබේ. පෙරවරු 7.30 සිට පස්වරු 6.00 දක්වා විවෘතව ඇත.
වැඩි විස්තර සඳහා විමසන්න.
077 - 697 90 78
(ජ'පුර විශ්වවිද්‍යාලය අසල විජේරාම)

ආතරයිටීස්
විශේෂ ප්‍රතිකාර
දණහිස් ඉදිමුම වේදනා සියලු සන්ධි රෝග, වාත රෝග, හිරිය, කශේරුකා ඇත් වීම, ළංවීම, ඉපැරැණි නිල ප්‍රතිකාර මඟින් පළමු ප්‍රතිකාරයේ සිටම සුවය. කැඩුම් බිඳුම් ප්‍රතිකාර.
ආතරයිටිස් ප්‍රතිකාර ඔබේ නිවසට ගෙන්වා ගත හැක. මාසිකව රු.7500/-

පාරම්පරික වෛද්‍ය, හෙළ වෛද්‍ය ප්‍රසාදිනි, වෛද්‍ය කීර්ති ආර්. බී. පියතිස්ස
රත්න වෙද මැදුර
163/1, නිල්පනාගොඩ හන්දිය, මිනුවන්ගොඩ.
0776 060 950

කවි යාය

නාඬන්න දූ මැණික අප්පච්චි ඉන්නවා

නවතන්නෙ කෙහොමදැයි කඳුළු කැට වැටෙනවා
දූ මැණික පෝරුවේ අතැඟිලිත් බඳිනවා
කිරි නොවූ සෙනෙහසක් දහදියෙන් ගලනවා
මහමෙරක් වන් සෙනෙහෙ අද දෙකට බෙදෙනවා

නිම නොවූ සිනා වැල් හද දෙබෑ කරනවා
රන්පතක පණ මගේ උරුමකම් ලියනවා
බදගෙන වැළපෙන්න හිතත් බල කරනවා
දූ මැණික මා දමා නොයන බව දන්නවා

වාවන්න බැරි තැනදි හද රිදුම් ගෙනෙනවා
සෙනෙහෙ ගඟ අෂ්ටකව වදන් කර කියනවා
ඉවසන්නෙ කොහොමදැයි මගෙ මැණික අඬනවා
නාඬන්න දූ මැණික අප්පච්චි ඉන්නවා

ඉමාෂා සත්සරණී
9 ශ්‍රේණිය, සංඝබෝධි ජාතික පාසල, නිට්ටඹුව

පිය රජුනේ ඈ 'ධරණී' මගේ අම්මා

ජය ලබන්න
පමණක් නොව
පරදින්නට
ඉවසන්නට
දෙවැනි නොවී, ප්‍රථම වන්න
නිවට නොවී, දිවි ගෙවන්න
නාඬා ඉන්න
සිනාසෙන්න
බිය නොවන්න, පෙරට යන්න
අත්වැල මට සැපවූයේ
යහපත් ලෙස දිවි ගෙවන්න
සකල ලොව මෙත් වඩන්න
ශිල්ප සතර හා වැඩපළ
කියා දුන්නේ පිය රජුනේ
ඇය
පුවත්පතයි 'ධරණී'

ඩබ්.එම්.අබයරත්න
විශ්‍රාමලත් ඉංග්‍රීසි
ගුරු උපදේශක
බොරවැව
මොරගොල්ලාගම

ඔබ සොයා එමි

සසුර පුරා
පෙරුම් පුරා
භවය පුරා
සෙනෙහෙ පුදු
ඔබ මා තනිකර ගියදු
සමරා වැළපෙමි හැමදු
පාළු අඳුරු අහස මමයි
ඇත දිලෙන තරුව ඔබයි
නැගෙනා සෝ සුසුම් රැල්ල
දෙගොඩ තලා ගැලූදුට
එන්නෙමි මම ඔබව සොයා

සුමනා එදිරිසිංහ
කොච්චිකඩේ

වෙරළ ඉම හිඳ සයුර විමසමි

නොනිමි සිතිවිලි සයුරු රළ සේ බිඳෙන තැන්
ඒ අතර සොයනෙමි ඔබේ මතකය රැඳුනු තැන්
ඇත මැත ද ඔබ සුසුම් සර සැඟවි තැන්
බැතින් විමසමි කඳුළු සමුදුර වෙරළ ඉම්

චමින්ද රොෂාන්



ජීවිතයේ අරුමය

තිස්සෙම හැපි හැපී පය ගල් බොරලු වල
දුටුවේ කටුකමයි ජීවන ගමන තුළ
යන්තම් කඳුළ වියැකී මගෙ දෙනෙත් තුළ
දැක්කද සතුට, සතුටට දිය නොහැක මිල

බිලිඳිය, තරුණියක, ලේලිය මවක ලෙසින්
ලේබල් ඇලෙව්වා මට ලෝකයක් විසින්
ඒ හැම එක්ක නොදැනිම වයසටත් ගිහින්
අද මගෙ සතුට ගණනින් කිව නොහැක දුසින්

මගෙ දූ මනාලිය වී ඔහු එක්ක ගියා
ඔහු මට ඇමතුවා නැන්දම්මේය කියා
හරියට මහන්සියි මගෙ නෙත් දෙකම පියා
පැතුවා අලුත් තනතුර මට ලැබෙනු කියා

අද ඒ සිහිනයත් මගෙ නෙතු ළඟම පෙනේ
බිලිඳෙකු ඇවිත් මම අත්තම්මාද වුණේ
අමුතුම හැඟීමක් තිස්සෙම හිතට දැනේ
කවියක් ලියා, නොගයා පුළුවන්ද අනේ

දීපිකා ප්‍රියදර්ශනී ප්‍රනාන්දු
මොරටුව විල්ලෝරාවත්ත

හීන ඇහැ අරින රැයේ

ඇඟිලි තුඩින් පිරිමදිද්දි
තෙත්වූ ඇස් දෙක
මතක් වුණා
අපි දෙන්නගෙ
වෙන්වූ හිත් දෙක

මං හින්දා ඇත්වෙලා
ගියත් වෙනතක
හිත හදාගන්න බෑ තාමත්
නොදැක ඇස් දෙක

අත් දෙක
එක්කළ සිහිනය
මිලින වූ දිනේ
දුර නොබලා
මම ගියෙ හීනෙක
ඒ හින්දා මට යන්ට
කවදා හැකිවේද දීගෙක

සමන් සුරවීරආරච්චි
රඹුක්කන

වියෝව

සැරිසරයි නිති ගෙදර සිනාකට පුරෝගෙන
'ජයා' යයි හඬ නගයි අමතමින් හද නිවන
විටෙක ඔබ සොයුරියකි හදේ සෙනෙහස ගලන
තව විටෙක යෙහෙළියකි මගේ පාලුව මකන

ගෙදර පිරිසඳු කරයි උයන බත හරි රහයි
ගෙවත්තේ ගස්කොළන් නිතරෝම පල බරයි
දරුවන්ට මෙන් මටද දයාබර ඔබ මවයි
තව විටෙක දැය රකින පුරපුරක ගුරු මවයි

මගේ මේ පැල්පතට එළිය දුන්නෙත් ඔබයි
දුබල වියපත් හිතට සවිය දුන්නෙත් ඔබයි
ගෙවත්තට සියොත් කැල පැමිණියෙත් ඔබ නිසයි
මෙයින් මතු ඒ සැමට තිත තබා ගත යුතුයි

මගේ ගෙයි සාලයේ හිස තබා බටහිරට
මෙයින් මතු කිසි දිනෙක මදෙස නොබලන ලෙසට
නිසල වූ නෙත් සඟල වසාගෙන සිටින විට
මෙසේ මල්දම් ගොතමි සොඳුරියේ ඔබ නමට

සාමා මුණවීර
කැකනදුර

ශෝකී දවස

හතේ ශෝකය ගිගුම් දෙන රෑ
මුව පහස මල් ගොලු වී මැලවී
ඇස් කොනින් රුරනා මුතුකැට
කිසිඳු කිසි දින යළි නොනැවතේ

හිතම සැනසුව ඔබේ රුව පෙර
බොහෝ දැකුමයි මගේ ඇසුරට
නමුත් මැලවී නිදන ඔබ අද
බොහෝ දුක් දුනි ඔබේ ළඳුනට

වෙනදා මා සිත තැවුල් ගත් විට
පියෙක් මෙන් සැනසුවා මගෙ හද
නමුත් අද මේ තැවුල් ගිනිදළු
නිවාලන්නට ඔබ නැතය අද

ප්‍රේමයේ පරතෙරට ගොස් පෙර
පෙමින් වෙළෙනා වසන්තය අද
යළිඳු කිසි දින නොඑන බැව් දැන
හඬමි හැම දින ඔබේ සොඳුරිය

තිළිණී සෙව්වන්දි ඒකනායක
මාතලේ

කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.
''කවි යාය''ධරණී' කර්තෘ මණ්ඩලය, අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk ලිපිනයට ඊමේල් කරන්න

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.